# රණවිරුවා

2022 ඔක්තෝබර් • 248 කලාපය




මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර

# "Army Keystone Doctrine" සහ "General Staff Publication" ග්‍රන්ථ එළිදැක්වේ



යුද්ධ හමුදා මූලස්ථානයේ පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්පාදිත "Army Keystone Doctrine" ග්‍රන්ථය සහ "General Staff Publication" ග්‍රන්ථයේ වෙළුම් 12ක මංගල පිටපත් 73 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව පසුගිය ඔක්තෝබර් 11 වන දින පැවති චාම් උත්සවයකදී එළිදැක්විණ. යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේ පැවති එම උත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න වෙත යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ගේ සුරතින් එම කෘතීන්හි මුල් පිටපත් පිරිනමනු ලැබීය. මෙම අවස්ථාවේදී "Army Keystone Doctrine" ග්‍රන්ථයෙහි විද්‍යුත් පිටපතක් එළිදැක්වීමද ආරක්ෂක ලේකම්තුමාගේ සුරතින් සිදුවිය. මෙම උත්සව අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනකුද අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී සහ පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීඩබ්ලිව්ජී සෙනෙවිරත්න යූඑස්පී පීඑස්සී ද එක්වූහ.





73 වන යුද්ධ හමුදා සංවත්සරය

# සර්ව රාත්‍රික ආශිර්වාද පිරිත් සජ්ඣායනයක්



ඔක්තෝබර් මස 10 දිනට යෙදෙන 73 වන යුද්ධ හමුදා සංවත්සරය සහ යුද්ධ හමුදා දිනය වෙනුවෙන් ආශිර්වාද පතා සංවිධානය කරනු ලැබූ සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනයක් ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී ඉකුත් ඔක්තෝබර් 07 වන දින පැවැත්විණි.



යුද්ධ හමුදාවේ අභිවෘද්ධිය වෙනුවෙන් ආශිර්වාද එක්කරමින් පැවැත්වෙන ආගමික උත්සවයන්හි අවසන් අංගය වශයෙන් පැවැත්වූ මෙම පිරිත් සජ්ඣායනාවට යුද්ධ හමුදා බෞද්ධ බල මණ්ඩලයේ ආරාධනයකට අනුව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.





යුද්ධ හමුදා සංවත්සරය වෙනුවෙන් යුද්ධ හමුදා බෞද්ධ බල මණ්ඩලය විසින් සංවිධානය කරනු ලැබූ මෙම සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනය, මිරිසවැටිය විහාරස්ථානයේ විහාරාධිපති සහ රජරට විශ්වවිද්‍යාලයේ කුලපති පූජ්‍ය ඊතලවැටුණුවැවේ ඤාණතිලක හිමිපාණන්ගේ මූලිකත්වයෙන් පැවැත්විණ. එමෙන්ම, මෙම අවස්ථාවට පොල්හේන්ගොඩ ඇලන්මැතිණියාරාම විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය උඩුවේ ධම්මාලෝක හිමිපාණන්, මිහින්තලේ රජමහා විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය වලහැංගුණුවැවේ ධම්මරතන හිමිපාණන් ඇතුළු භික්ෂූන් වහන්සේලා කිහිපනමක් වැඩම කළහ. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක, ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, නිලධාරිනියන් සහ සෙසුනිලයන් පිරිසක් සහභාගී වූහ.




# 73 වන යුද්ධ හමුදා සංවත්සරය අභිමානවත් අයුරින් සැමරේ

ශ්‍රී ලංකාවාසීන් දශක තුනකට අධික කාලයක් පුරාවට ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් පීඩාවිඳිමින් සිටි යුගය අවසන් කරමින් මව්බිමට තිරසාර සාමය උදාකරදීම වෙනුවෙන් "ජාතියේ ආරක්ෂකයා" වශයෙන් පෙරමුණ ගෙන කටයුතු කරනු ලැබූ අභිමානවත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පසුගිය ඔක්තෝබර් මස 10 දිනට වසර 73 ක් සපිරුණි. එය සමරනු වස් පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේදී අභිමානවත් සැමරුම් උත්සවයක් පැවැත් වූයේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙනි.

අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ අණදීම යටතේ පැවති මෙවර යුද්ධ හමුදා දින පෙළපාලියේ දෙවන අණදෙන නිලධාරී ලෙස යුද්ධ හමුදා පර්යේෂණ සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීඩබ්ලිව්ජී සෙනෙවිරත්න යූඑස්පී පීඑස්සී කටයුතු කළ අතර, ඊට යුද්ධ හමුදාවේ සියලු රෙජිමේන්තු නියෝජනය කරමින් නිලධාරීන් 77 දෙනකු සහ සෙසුනිලයන් 652 දෙනකු සහභාගී වූහ. මෙම උත්සවයට සුවිශේෂීත්වයක් එක්කරමින්, යුද්ධ හමුදාවේ අභිමානය වෙනුවෙන් විශිෂ්ට සේවයක නිරත වූ යුද්ධ හමුදා සාමාජිකයින් 19 දෙනකු වෙත යුද්ධ හමුදාධිපති ගේ සුරතින් ප්‍රශංසා ලාංඡන හිමිකරගනු ලැබූහ. ඔවුන්ගේ නිර්භීතභාවය, අවංකභාවය මෙන්ම ජීවිත පරිත්‍යාගයෙන් හඳිසි අවශ්‍යතාවයන්හිදී සිදුකළ ජාතික මෙහෙවර ඇගයීමට ලක්කරමින් මෙම ප්‍රශංසා ලාංඡන ඔවුන් වෙත පිරිනමනු ලැබීය.



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහ විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ඇතුළු ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්, ආරක්ෂක සේනා ආඥාපතිවරුන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ඔවුන්ගේ භාර්යාවන් මෙන්ම නිලධාරීන් සහ සෙසුනිලයන් රැසක් එම අභිමානවත් අවස්ථාවට එක්වූහ.






යුද්ධ හමුදාවේ අභිමානය වෙනුවෙන් කැපවූ සේවයක නිරතවූ යුද්ධ හමුදා සාමාජිකයින් 19 දෙනකු වෙත යුද්ධ හමුදාධිපති විසින් ප්‍රශංසා ලාංඡන පිරිනැමීමේ අවස්ථාව.








# යුද්ධ හමුදා ඉතිහාසයේ ප්‍රථම වතාවට සුවිශේෂී සේවාවන්, ජයග්‍රහණ හා දක්ෂතා ඇගයීමට ප්‍රශංසාත්මක ලාංඡනයක්

**මෙවර පැවති 73 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු ගේ මාහැඟි සංකල්පයකට අනුව යුද්ධ හමුදාවේ අභිමානය වෙනුවෙන් සුවිශේෂී සේවාවන්, ජයග්‍රහණ හා දක්ෂතා දැක්වූ යුද්ධ හමුදා සාමාජිකයින් 21 දෙනකු වෙත යුද්ධ හමුදාධිපති ප්‍රශංසාත්මක ලාංඡන පිරිනැමීම සිදුවිය.**



සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් විසින් සිය රාජකාරී ඉටු කිරීමේදී පවරන ලද දෛනික කාර්යභාරයෙන් ඔබ්බට ගොස් යුද්ධ හමුදාවේ උන්නතිය, ක්‍රියාන්විත හා පරිපාලනමය කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා ලබාදෙනු ලබන විශේෂිත දායකත්වය වෙනුවෙන් මෙම සම්මානය පිරිනැමිණ. තවද, රාජකාරියෙන් බැහැරව සිටින අවස්ථාවන්හි තම ජීවිත අවදානමද ගැන නොතකා ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වී තමා විසින්ම කරන ලද වික්‍රමාන්විත ව්‍යද, අභීතභාවය ප්‍රදර්ශනය කරන්නා වූද, ක්‍රියාදාමයන් මගින් සමාජ ආරක්ෂාව සහ සමාජීය ජීවිත සුරක්ෂිත කිරීමෙහිලා දැක්වූ දායකත්වය ඇගයීම වස් මෙය ප්‍රදානය කරයි.

## යුද්ධ හමුදාධිපති ප්‍රශංසාත්මක ලාංඡන

මුල් ඇගයීම →



දෙවන ඇගයීම →



තුන්වන ඇගයීම →



හතරවන ඇගයීම →



පස්වන ඇගයීම →



**යුද්ධ හමුදාධිපතිගේ සංකල්පයක් මත යුද්ධ හමුදාවේ ප්‍රථම වතාවට දියත්කළ මෙම ඓතිහාසික කටයුත්ත මගින් සිය රාජකාරියෙන් ඔබ්බට යුද්ධ හමුදාවේ උන්නතිය උදෙසා සිදුකරන සුවිශේෂී සේවාවන්, ජයග්‍රහණ හා දක්ෂතා ඇගයීම උදෙසා මෙම ප්‍රසංශාත්මක නිල ලාංඡනය පිරිනැමිණ. 73 වසරක යුද්ධ හමුදා ඉතිහාසයේ ප්‍රථම වතාවට මෙවන් ලාංඡනයක් හිමිගැන්වීම සුවිශේෂී සිදුවීමකි.**

මෙම ලාංඡනය සෑම වර්ෂයකම යුද්ධ හමුදා දිනයට සමගාමීව යුද්ධ හමුදාධිපති විසින්ම ප්‍රදානය කරනු ලබන අතර, යුද්ධ හමුදාධිපතිගේ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක ප්‍රශංසාත්මක සහතිකය සහ ලාංඡනය හිමිගැන්වීමටද හැකියාව ඇත.

මුල් ඇගයීම සඳහා නිම වූ ලාංඡනය පමණක් ප්‍රදානය කරන අතර, දෙවන ඇගයීම සඳහා යුද්ධ හමුදා ලාංඡනයට පහලින් තරු දෙකක්ද, තුන්වන ඇගයීම සඳහා තරු තුනක්ද, හතරවන ඇගයීම සඳහා තරු හතරක්ද, පස්වන ඇගයීම සහ ඊට පසු ඇගයීම් සඳහා තරු පහක් වශයෙන්ද සලකුණු කර ඇත. උපරිම වශයෙන් පස් වතාවක් ඇගයීම සඳහා ලාංඡනයේ තරු ලකුණු පහක් සලකුණු කරනු ලබන අතර, ඉන් පසු කරනු ලබන ඇගයීම් සඳහා ලාංඡන ප්‍රදානය කරනු නොලැබේ. තවද, ප්‍රශංසාත්මක ලිපි/ලාංඡන ප්‍රදානයෙන් පසු දෙවන කොටසේ නියෝග මගින් ප්‍රකාශයට පත් කිරීමට අදාළ ඉදිරි කටයුතු යුද්ධ හමුදා සාමාජිකයා අයත් රෙජිමේන්තුව විසින් සිදුකළ යුතු අතර, ප්‍රශංසාත්මක සහතිකයේ පිටපතක් යුද්ධ හමුදා සාමාජිකයාගේ පුද්ගලික ලිපිගොනුවට ඇතුලත් කෙරෙනු ඇත.

තවද, සුදුස්සන් තෝරාගනු ලැබීමේ පරීක්ෂණයන්හිදී සහ සුබසාධන කටයුතුවලදී මෙම ලාංඡනය හා සහතිකය පිරිනමනු ලබන්නන් හට ප්‍රතිලාභ හිමිවිය යුතුය. එහිදී, ඔවුන් වෙත හිමිගන්වනු ලබන ලකුණු ප්‍රමාණයන් විෂය සම්බන්ධව කටයුතු කරනු ලබන ශාඛා සහ අධ්‍යක්ෂ මණ්ඩල වෙතින් තීරණය කර එම නියෝග සංශෝධනය කරගත යුතුවේ. තත් ලකුණු ප්‍රමාණයන් පළඳනා, ප්‍රසාදනා සහ පදක්කම්වලට හිමිගන්වනු ලබන ලකුණු ප්‍රමාණයට වඩා අඩු විය යුතුය.

යම්කිසි පුද්ගලයකු හට ප්‍රදානය කරනු ලැබූ ප්‍රශංසාත්මක ලාංඡනය ඕනෑම අවස්ථාවක අහිමි කිරීමේ බලයද යුද්ධ හමුදාධිපතිතුමා සතුය.

2022 ඔක්තෝබර් 10 වන දින පනාගොඩ පාබල රෙජිමේන්තු පරිශ්‍රයේදී පැවති 73 වන යුද්ධ හමුදා සංවත්සර පෙළපාලියේදී තෝරාගත් යුද්ධ හමුදා සාමාජිකයින් 21 දෙනකු වෙත යුද්ධ හමුදාධිපතිතුමාගේ සුරතින් යුද්ධ හමුදා ඉතිහාසයේ ප්‍රථම වතාවට මෙම නිල ලාංඡන පැළඳවීම සිදුකෙරිණ.

# 73 වන යුද්ධ හමුදා සංවත්සරය නිමිත්තෙන් පැවති රාත්‍රී භෝජන සංග්‍රහය







යුද්ධ හමුදා සාමාජිකයින් අතර සුහදත්වය, සහයෝගීතාවය සහ සාමූහිකත්වය වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මූලිකත්වයෙන් පසුගිය ඔක්තෝබර් 10 වන දින සන්ධ්‍යාවේ රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්විණ. ඒ සඳහා යුද්ධ හමුදාවේ සියලු රෙජිමේන්තු නියෝජනය කරමින් යුද්ධ හමුදා සාමාජිකයින් රැසක් සහභාගී වූහ.

2009 වසරේදී ත්‍රස්තවාදය තුරන් කිරීමෙන් අනතුරුව පැවති 60 වන යුද්ධ හමුදා සංවත්සර දිනයේදී හඳුන්වා දුන් මෙම රාත්‍රී භෝජන සංග්‍රහය එතැන් සිට මේ දක්වා සාර්ථකව අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි. වාර්ෂිකව පවත්වන මෙම රාත්‍රී භෝජන සංග්‍රහය තුළින් යුද්ධ හමුදා සාමාජිකයින්ට එකිනෙකා හමුවී වෘත්තීය දිවියේ විවිධ එළඹායි අදහස් හුවමාරු කරගැනීමටද සුහදත්වය වර්ධනය කරගැනීමටද අවස්ථාව හිමිවීම මෙහිලා වැදගත්ය.





73 වන යුද්ධ හමුදා සංවත්සරය

# දිවිපිදූ විරුවන් අභිමානවත්ව සැමරේ





මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ අමිල මෙහෙවර සිහිපත් කිරීමේ රණවිරු අනුස්මරණ උත්සවයක් බත්තරමුල්ල රණවිරු ස්මාරකය අභියසදී ඉකුත් ඔක්තෝබර් 06 වන දින සන්ධ්‍යාවේ පැවැත්විණි.

මියගිය රණවිරුවන්ගේ ආදරණීය මතකයන් අනුස්මරණය කෙරෙන මෙම ගෞරවණීය මොහොතට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ එක්විය. මීට වසර 13 කට ප්‍රථම වීරෝදාර රණවිරුවන් ජීවිත පරිත්‍යාගයෙන් ත්‍රස්තවාදය තුරන් කරමින් රට එක්සේසත් කිරීමට දැක්වූ නිර්භීත දායකත්වය ඇගයීමට ලක්කරමින් ඔවුන් වෙනුවෙන් සෑම වසරකම යුද්ධ හමුදා සංවත්සර දිනයට සමගාමීව මෙම උපහාර උත්සවය පවත්වනු ලබයි. මෙම අවස්ථාවට මියගිය සහ අතුරුදන් වූ රණවිරුවන්ගේ ඥාතීන්, යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක, ආරක්ෂක සේනා ආඥාපතිවරුන් ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් එක්වූහ.

## එක්සත් ජනපද තානාපතිනිය සහ යුද්ධ හමුදාධිපති අතර හමුවක්



ශ්‍රී ලංකාවේ ඇමෙරිකා එක්සත් ජනපද තානාපතිනි අතිගරු ජුලි ජේ චංග් (Julie J. Chung) මැතිණිය පසුගිය ඔක්තෝබර් 27 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවී සුහද සාකච්ඡාවක නිරත වූවාය.

මෙම හමුවේදී දෙරටෙහි යුද්ධ හමුදාවන් අතර පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, බිම්බෝම්බ ඉවත් කිරීම, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සයිබර් ආරක්ෂක කටයුතු සහ සන්නිවේදන හැකියාවන් ආදී කරුණු පිළිබඳ සාකච්ඡාවට ගැනිණි. මෙම සංචාරය සඳහා ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක, ලුතිනන් කර්නල් ඇන්තනි සී නෙල්සන් සහ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ නිලධාරියකු ද එක්ව සිටියහ.

# උතුරු බිමෙහි සංචාරයක තතු



ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල් ඉකුත් ඔක්තෝබර් 14 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) හි සංචාරයක නිරතවිය. එහිදී ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී වෙත හිමිවූයේ ගෞරවණීය බුහුමනකි.



සිය සංචාරයේදී යාපනය අර්ධද්වීපයේ රාජකාරී නියුතු හටපිරිස් ආමන්ත්‍රණය කළ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී ගෙවීගිය කාලසීමාවේදී ඔවුන් විවිධ සංවර්ධන කටයුතු සඳහා මෙන්ම කොවිඩ් 19 වසංගතය මැඩලීම සඳහා යුද්ධ හමුදාව වෙත ලබාදුන් දායකත්වය සබැඳිව සිය ස්තුතිය පුදකරන ලදී. මෙම අවස්ථාව සඳහා යාපනය අර්ධද්වීපයේ සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, අණදෙන නිලධාරීවරු මෙන්ම අනෙකුත් නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.







# 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායට නව බහුකාර්ය පහසුකම් ගොඩනැගිලි සංකීර්ණයක්





ගිරිතලේ ස්ථාපිත 2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකා මූලස්ථාන පරිශ්‍රයේ දීර්ඝකාලීන අවශ්‍යතාවයක්ව පැවති මහල් දෙකකින් සමන්විත බහුකාර්ය පහසුකම් ගොඩනැගිලි සංකීර්ණය පසුගිය ඔක්තෝබර් 13 වන දින විවෘත කෙරිණ. සීමාසහිත AIA රක්ෂණ සමාගම සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව සම්බන්ධීකරණය කරමින් සිදුකළ මෙම ව්‍යාපෘතිය සඳහා සන්නද්ධ හමුදා සුබසාධන අංශයේ විධායක නිලධාරී ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ඩීඑම්එස් ජයවර්ධන විසින් සෘජු දායකත්වය සපයා තිබිණි. මෙම බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණය විවෘත කිරීමේ අවස්ථාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ බලකාධිපති සහ ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඒඑල් ඉලංගකෝන් ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය. එහිදී, යුද්ධ හමුදාධිපති නව ගොඩනැගිලි සංකීර්ණයේ නිරීක්ෂණයකද නිරත වෙමින් එම ව්‍යාපෘතිය සඳහා දායකත්වය දැක්වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකා හටපිරිසහි කැපවීම අගයීමටද ලක්කළේය.

2 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ හිටපු අණදෙන නිලධාරීන් මෙන්ම වත්මන් අණදෙන නිලධාරී මේජර් එන්පීඑන් තෙරංගම ගේ සාමූහික උත්සාහය තුළින් මෙම නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමට හැකියාව ලැබිණි. මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, ඉදිරි නඩත්තු පෙදෙස (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ටීසී මෙත්තානන්ද යූඑස්පී, ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති බ්‍රිගේඩියර් ඒසීඒ ද සොයිසා යූඑස්පී එච්ඩීඑම්සී එල්එස්සී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් ද එක්වූහ.

# ත්‍රිවිධ හමුදා විශ්‍රාමික ධජ නිලධාරීන්ගේ සංගමයේ කමිටු සාමාජිකයින්ගේ සංචාරයක්



ත්‍රිවිධ හමුදා විශ්‍රාමික ධජ නිලධාරීන්ගේ සංගමයේ විධායක කමිටු සාමාජිකයින් පිරිසක් පසුගිය ඔක්තෝබර් 27 වන දින යුද්ධ හමුදා මූලස්ථානයෙහි සංචාරයක නිරත වූහ. එහිදී ඔවුන් විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී සහ පිරිස් පරිපාලන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් කේඒජු කොඩිතුවක්කු විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබූහ. අනතුරුව, ඔවුන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සමගින් සුහද අදහස් හුවමාරුවකද නිරත වීමෙන් අනතුරුව සමූහ ඡායාරූපයකටද එක්වූහ. පසුව, එම විධායක කමිටු සාමාජිකයින් නව ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයේ අංග ආයතන කිහිපයක නිරීක්ෂණ චාරිකාවකද නිරත වූහ.



# "සමගිය ශක්තියයි"

## 39 වසරක අභිමානය සැමරූ වගයි


දිවංගත මේජර් ජෙනරාල් විජය විමලරත්න සෙන්පති විසින් ආරම්භ කළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කීර්තිමත් පාබල රෙජිමේන්තුවක් වන ගජබා රෙජිමේන්තුවේ අභිමානවත් 39 වැනි සැමරුම පසුගිය ඔක්තෝබර් මස 14 වන දින යුද්ධ හමුදාධිපති හා ගජබා රෙජිමේන්තුවේ අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් සමරනු ලැබීය.

සංවත්සර දිනයේදී රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත සපැමිණි යුද්ධ හමුදාධිපති වෙත එහි භටපිරිස් වෙතින් හිමිවූයේ ගෞරවනීය පිළිගැනීමකි. එහිදී, යුද්ධ හමුදාධිපති විසින් එම රෙජිමේන්තුවේ නිර්මාතෘ දිවංගත මේජර් ජෙනරාල් විජය විමලරත්න සෙන්පතිගේ පිළිරුවට පුෂ්පෝපහාර පුදකරමින් බුහුමන් දක්වන්නටද අමතක නොකළේය.

අනතුරුව එම අභිමානවත් අවස්ථාවේදී රෙජිමේන්තුවේ සියලු භටපිරිස් ඇමතූ යුද්ධ හමුදාධිපති වසර 39 ක් මුළුල්ලේ රෙජිමේන්තුව පැමිණි අභියෝගාත්මක ගමනේදී එහි සාමාජිකයින් මාතෘ භූමිය වෙනුවෙන් කළ කැපකිරීම පිළිබඳව සිහිපත් කරන ලදී. එහිදී, දිවිපිදූ රණවිරුවන්ගේ පරිත්‍යාගයට ඉහළම ගෞරවය පුද කළ යුද්ධ හමුදාධිපති රණක්ෂිතයට පත්ව සිටින සහ සුවය ලබා පුනරුත්ථාපනය වන රණවිරුවන්ට ඉක්මන් සුවයද ප්‍රාර්ථනා කළේය.

මෙම සංවත්සර සැමරුම් උත්සවය සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය, ගජබා රෙජිමේන්තුවේ මන්ත්‍රණ සභාවේ සමාජිකයින්, සේවා මුක්ත භට සංගමයේ සාමාජිකයින් මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ සෙසු නිලයින් රැසක් සහභාගී වූහ.

**ගජබා රෙජිමේන්තුව ආරම්භයේ සිට වර්ෂ 2009 මැයි මස මානුෂීය මෙහෙයුමේ අවසානය දක්වාම බොහෝ යුද ක්‍රියාන්විත සඳහා සක්‍රීයව දායක වී ඇති අතර, රට ආරක්ෂා කිරීම සඳහා පරාර්ථකාමී අභීත රණවිරුවන් බිහිකළ රෙජිමේන්තුවක්ද වේ. රටට සාමය උදාකරදීම වෙනුවෙන් අපරිමිත සේවයක නිරත වූ මෙම රෙජිමේන්තුවේ විරෝදාර නිලධාරීන් 175 දෙනකු සහ සෙසුනිලයින් 4075 දෙනකු රට වෙනුවෙන් සිය ජීවිත පූජා කර ඇති අතර නිලධාරීන් 180 දෙනකු සහ සෙසුනිලයින් 4030 දෙනකු රණක්ෂිතයට පත්ව ඇත.**











සංවත්සර දින පැවති පිරිත්‍රාන ධර්ම දේශනාව සහ පසුදින පැවති දානමය පිංකමෙහි විශේෂ අවස්ථා.

# සංවත්සර දිනයේ දිවිපිදු රණවිරුවන් සිහිකෙරේ



ගජබා රෙජිමේන්තුවේ අභිමානවත් 39 වන සංවත්සරයට සමගාමීව යුද්ධ හමුදාධිපති ගේ ප්‍රධානත්වයෙන් එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී විශේෂ රණවිරු සැමරුම් උත්සවයක්ද පැවැත්විණ. එම අවස්ථාව සඳහා ගජබා රෙජිමේන්තුවේ නිර්මාතෘ වන දිවංගත මේජර් ජෙනරාල් විජය විමලරත්න සෙන්පතිගේ බිරිඳ වන මානෙල් මංගලිකා විමලරත්න මහත්මියද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනී ජානකී ලියනගේ මහත්මියද එක්වූහ.

එම අවස්ථාවට රණක්ෂිතයට පත් වීරෝදාර රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයින්, ගජබා රෙජිමේන්තු සේවා මුක්ත භට සංගමයේ සාමාජිකයින්, නිලධාරීන්, සෙසු නිලයින් විශාල පිරිසක්ද සහභාගී වූහ.





# හටකාර්ය සම්පාදන ආඥා මූලස්ථානයට නව කාර්යාල ගොඩනැගිල්ලක්








කොස්ගම පිහිටි හටකාර්ය සම්පාදන ආඥා මූලස්ථානයේ නව කාර්යාල සංකීර්ණය ඉකුත් ඔක්තෝබර් 07 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරිණ.

හටකාර්ය සම්පාදන ආඥා මූලස්ථානයේ ආඥාපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ගේ ආරාධනයෙන් එහි සපැමිණි යුද්ධ හමුදාධිපති වෙත හිමිවූයේ උණුසුම් පිළිගැනීමකි. එහිදී, යුද්ධ හමුදාධිපති විසින් එම මූලස්ථානයේ ආඥාපති ඇතුළු සියලුම නිලයන්ගේ කැපවූ සේවය සහ මෙම ඉදිකිරීම් කටයුතු නියමිත කාලය තුළ අවසන් කිරීම පිළිබඳ පැසසුමට ලක්කළේය. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයන් පිරිසක් ද එක්වූහ.

# බංගලාදේශ ශිෂ්‍ය නිලධාරීන් යුද්ධ හමුදා මූලස්ථානයේ සංචාරයක



බංගලාදේශ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍ය නිලධාරීන් පිරිසක් සිය පාඨමාලාවේ අධියරක් ලෙස පසුගිය ඔක්තෝබර් 03 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ සංචාරයක නිරත වූහ. ග්‍රෑප් කපිතාන් එම්ඩීඅල්අම් කාන් ඒඑෆ්ඩබ්ලිව්සී පීඑස්සී ඒඩීඩබ්ලිව්සී (Md Al Amm Khan, afwc, psc, ADWC) ප්‍රමුඛ ශිෂ්‍ය නිලධාරීන් 43 දෙනකුගෙන් යුත් මෙම කණ්ඩායම යුද්ධ හමුදාධිපති නියෝජනය කරමින් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සමග එහිදී සුහද සාකච්ඡාවක් පැවැත්වූහ. මෙම හමුවේ දී, මාණ්ඩලික ප්‍රධානී විසින් වසර ගණනාවක් පුරාවට ශ්‍රී ලංකාව සහ බංගලාදේශ ත්‍රිවිධ හමුදාව අතර පවතින සහයෝගීතාව සිහිපත් කළ අතර, එය තවදුරටත් වැඩිදියුණු කරගැනීමේ අවශ්‍යතාවය පිළිබඳවද අවධාරණය කළේය.





# විශේෂ බලකා විශිෂ්ටයින්ගේ අභිමානවත් විසිරයාම

ජාතියේ අභිමානය සුරැකීම උදෙසා විශිෂ්ටයින් අතර විශිෂ්ටයින් ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා විශේෂ බලකායට එක්ව එහි පුහුණු පාඨමාලා අංක - 52 සහ 53 යටතේ මාස නවයක අති දුෂ්කර පුහුණුවක් සාර්ථකව හැදෑරූ නිලධාරීන් 19 දෙනකු සහ සෙසුනිලයින් 595 දෙනකුගේ විසිරයාමේ පෙළපාලිය පසුගිය ඔක්තෝබර් 29 වන දින මාදුරුඔය විශේෂ බලකා පුහුණු පාසලේ දී පැවැත්විණි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මෙන්ම විශේෂ බලකායේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ විශේෂ බලකා පුහුණු පාසලේ සේනාවිධායක කර්නල් ඩීඑස් හොරවලවිතාන ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ පිළිගැනුම් මධ්‍යයේ එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය. එහිදී, "අධිෂ්ඨානයෙන් අභිනව අරමුණ කරා" යන විශිෂ්ටයන්ගෙන් සැදුම්ලත් අලංකාරවත් විසිරයාමේ පෙළපාලියේ අභිමානවත් ගෞරවාචාරය යුද්ධ හමුදාධිපති වෙත පිරිනමනු ලැබීය.

එම අවස්ථාවට සුවිශේෂීත්වයක් එක්කරමින් විශේෂ බලකා පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන් කළ සෙබළුන් වෙත පැළඳවීමට නියමිත විශේෂ බලකා ලාංඡන සරඹ භූමිය වෙත ගුවනින් රැගෙන එන ලදී. මෙම විසිරයාමේ පෙළපාලියට ගෞරවයක් එක්කරමින් සපැමිණි, යුද්ධ හමුදාධිපතිතුමන් විසින් පාඨමාලාව සාර්ථකව අවසන් කළ විශිෂ්ටයින් වෙත විශේෂ බලකා ලාංඡන පැළඳවීම සිදුකරනු ලැබීය. ඒ සඳහා මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, මේජර් ජෙනරාල් ඩබ්ලිව්ටීඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී, මේජර් ජෙනරාල් එච්ඩීඩබ්ලිව්කේවන් ඊරියගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ මේජර් ජෙනරාල් ආර්එම්එම් රණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ද එක්වූහ.



මෙම උත්සව අවස්ථාව සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය, යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, ආරක්ෂක සේනා ආඥාපතිවරුන්, යුද්ධ හමුදාවේ අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ආරාධිතයින්, විසිරයන විශිෂ්ටයන්ගේ දෙමාපියන් සහ ඥාති හිතමිත්‍රාදීන් රැසක් සහභාගී වූහ.

මෙහිදී පැමිණ සිටි සියලු දෙනාට ආශ්වාද ජනක නැවුම් අත්දැකීමක් එක්කරමින් තූර්ය වාදන සංදර්ශනයක්, ගුවන් කරනම් ඇතුළත් පැරෂුට් සංදර්ශනයක්, ටයිකොන්ඩෝ සංදර්ශනයක්, යතුරුපැදි සන්දර්ශනයක් සහ විශේෂ බලකා රණකාමීත්වය විදහාපාමින් නගරබද සටන් හා නිරායුධ සටන් සංදර්ශනයක්ද ඉදිරිපත් කිරීමට එදින විසිරගිය විශිෂ්ටයින් ක්‍රියාකරන ලද්දේ එම අවස්ථාව වර්ණවත් කරමිනි.

# අභිමන් ගමනකට උණුසුම් සුභ පැතුම්

ඔක්තෝබර් මස 10 දිනට යෙදුන 73 වන යුද්ධ හමුදා සංවත්සර දිනයට සමගාමීව මෙවරද යුද්ධ හමුදා නිලධාරීන් සහ සෙසුනිලයන් රැසකට උසස්වීම් හිමිගැන්විණ. ඒ අතර බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 05 දෙනකු මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලැබූහ. එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත සංකේතාත්මකව නිල ලාංඡන පැළඳවීම සිදුකරන ලද්දේ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතිනි.

මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ සේනාවිධායක ගැමුණු හේවා බලකායේ මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී පීඑස්සී, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ මේජර් ජෙනරාල් ජේඩීආර්එස්කේ ජයසේකර යූඑස්පී පීඑස්සී, 66 වන සේනාංකයේ සේනාංකාධිපති යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ මේජර් ජෙනරාල් එස්ජේ ප්‍රියදර්ශන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී, 14 වන සේනාංකයේ සේනාංකාධිපති ගැමුණු හේවා බලකායේ මේජර් ජෙනරාල් ජේඑම්ආර්එන්කේ ජයමාන්න ආර්ඩබ්ලිව්පී සහ ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේවයේ නියුතු මේජර් ජෙනරාල් ආර්ජීජේඑන් රණසිංහ ආර්එස්පී යූඑස්පී යන බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත එහිදී යුද්ධ හමුදාධිපතිගේ සුරතින් මේජර් ජෙනරාල් නිලයේ නිල ලාංඡන පළඳවනු ලැබීය.



# යුද්ධ හමුදාවේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට තොරතුරු තාක්ෂණ ජංගම යෙදවුම් පද්ධති හතරක්





යුද්ධ හමුදාධිපතිගේ මගපෙන්වීම මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පසුගිය ඔක්තෝබර් 17 වන දින යුද්ධ හමුදා තොරතුරු තාක්‍ෂණ ජංගම යෙදවුම් පද්ධති (Army mobile applications) හතරක් හඳුන්වා දුන් අතර එම අවස්ථාව සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.

යුද්ධ හමුදා පරිපාලන කටයුතු සඳහා කඩදාසි භාවිතය අවම කරමින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් යුද්ධ හමුදා *portal*, ඉන්ධන කළමනාකරණ පද්ධතිය, ප්‍රසම්පාදන ක්‍රියාවලි කළමනාකරණ පද්ධතිය සහ යුද්ධ හමුදාවේ සුමට හා ඵලදායී ක්‍රියාකාරීත්වය වෙනුවෙන් යුද්ධ හමුදා මූලස්ථානය සඳහා වන යෙදවුම් ද්වාරය නම් ජංගම යෙදවුම් පද්ධති හතරක් හඳුන්වාදෙනු ලැබිණි. සම්පත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් භාවිතා කරමින් වත්මන් ආර්ථික අර්බුදයට සාර්ථක විසඳුම් සොයමින් රජයේ ප්‍රයත්නයට ශක්තියක් වීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දරණ උත්සාහයේ තවත් වැදගත් පියවරක් ලෙස මෙම යෙදවුම් හැඳින්විය හැකියි.

ප්‍රධාන සංඥා නිලධාරී මේජර් ජෙනරාල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී යූඑස්පී පීඑස්සී සහ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ජීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී පීඑස්සී ගේ අධීක්‍ෂණය යටතේ මෙම සියලුම යෙදවුම් යුද්ධ හමුදා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ විශේෂඥයින් විසින්ම නිර්මාණය කර තිබීම විශේෂත්වයකි.

මෙම නව යෙදවුම් හඳුන්වාදීමේ අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් වීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ, යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඇතුළු නිලධාරීන් පිරිසක්ද එක්වූහ.

# අභිමානවත් ගමනක පළමු සැමරුම









ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සුවිශේෂී නිපුණතාවයකින් හෙබි අතිරේක ප්‍රහාරක බලකායකින්, විශේෂ ක්‍රියාන්විත බලකායකින් සහ අනෙකුත් සන්නද්ධ අංශයන්ගෙන්ද සමන්විත 1 වන බලකායේ පළමු සංවත්සර සැමරුම ඉකුත් ඔක්තෝබර් 21 වන දින කිලිනොච්චියෙහි පිහිටි එම බලකා මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විණ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස 1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒකේජීකේයූ ඥානරත්න එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී විය. එහිදී එම හටපිරිස් වෙතින් එතුමන් වෙත හිමිවූයේ ගෞරවණීය පිළිගැනීමකි.

එම සංවත්සර දිනයේදී යුද්ධ හමුදාධිපති ඇතුළු 1 වන බලකායේ නිලධාරීන් 9 වන ශ්‍රී ලංකා සංඥා බලකායේ "නෙළුම් පියස" ශ්‍රවණාගාරයේ පැවති ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩසටහනක් සඳහාද සම්බන්ධ වූහ. එහිදී, කිලිනොච්චිය ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් 53 දෙනකු වෙත ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථකව සිදුකරගෙන යාමට සහ ඔවුන් දිරිගැන්වීමක් ලෙස මසකට රුපියල් 2000 බැගින් වසරක් සඳහා වූ ශිෂ්‍යත්ව ප්‍රදානයක්ද සිදුකරනු ලැබීය.

කිලිනොච්චිය ප්‍රදේශයේ සිසු සිසුවියන්ගේ කලා කුසලතාවයන් ඔප්නැංවීමේ අරමුණින් සංවිධානය කරන ලද *"Glory of Kilinochchi"* චිත්‍ර තරඟාවලියේ දක්ෂතා දැක්වූ සිසු සිසුවියන් සඳහා මූල්‍ය ත්‍යාග සහ සහතිකපත් ද යුද්ධ හමුදාධිපතිගේ සුරතින් එහිදී ප්‍රදානය කෙරුණි. තවද, සංවත්සර සැමරුම් දින උත්සවයට සමගාමීව පවත්වන ලද ක්‍රීඩා තරග මාලාවේ ජයග්‍රාහකයින් සඳහා වූ කුසලාන සහ සහතිකපත් ප්‍රදානයද යුද්ධ හමුදාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පිරිනැමුණි.

53 වන සේනාංකය, 58 වන සේනාංකය, කමාන්ඩෝ බලසේනාව, විශේෂ බලකා බලසේනාව සහ තවත් සන්නද්ධ අංශ කිහිපයකින් සමන්විතව ක්‍රියාකාරී හමුදා බලකායක් ලෙස කටයුතු කරන 1 වන බලකාය රටේ ඕනෑම හදිසි අවස්ථාවකදී යුද්ධ හමුදා මූලස්ථානයේ උපදෙස් මත ක්‍රියාත්මක වීමට සූදානම්ව සිටිති. එසේම, අතිරේක ප්‍රහාරක බලකායකින් (*RSF*) සහ, විශේෂ ක්‍රියාන්විත බලකායකින් (*SOF*) සමන්විත 1 වන බලකාය ස්වභාවික විපත්, ජාතික ආරක්ෂාවට වන තර්ජන, වසංගත, ත්‍රස්තවාදී තර්ජන, කැරලි කෝලාහල හෝ වෙනත් හදිසි අවස්ථා වැනි තත්ත්වයන් සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම සඳහා ස්ථාපිත කොට ඇත.

# ශ්‍රී ලංකා පාබල හමුදාවේ දිවිපිදූ විරුවන් සිහිපත් කෙරේ





මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන් 3744 දෙනකුගේ අසමසම පරිත්‍යාගය, වීරත්වය, කැපවීම සහ මෙහෙවර සිහිපත් කරමින් ශ්‍රී ලංකා පාබල හමුදාවේ 141 වැනි සංවත්සරය නිමිත්තෙන් වූ රණවිරු සැමරුම් උත්සවයක් පනාගොඩ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේ ඉදිකර ඇති දකුණු ආසියාවේ විශාලතම රණවිරු ස්මාරකය අභියසදී ඉකුත් ඔක්තෝබර් 25 වන දින පැවැත්විණ. පාබල හමුදාව් රණවිරුවන් වෙනුවෙන් ලබාදෙන ඉහළම ගෞරවාචාරය පුදකර ඔවුන් ගුණානුස්මරණය කිරීම සඳහා වාර්ෂිකව පවත්වනු ලබන මෙම සැමරුම් උළෙල සඳහා ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති සහ යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී විය.



මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ උප සභාපතිනි ශිරෝමාලා කොඩිතුවක්කු මහත්මිය එම වීරෝදාර රණවිරුවන්ගේ භාර්යාවන් හා දූ දරුවන්, ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ සේවා මුක්ත භට සංගමයේ සාමාජිකයින්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, සෙසු නිලයින් සහ ආරාධිත අමුත්තන් විශාල පිරිසක් සහභාගී වූහ. තවද මෙම අවස්ථාවට විශේෂත්වයක් එක්කරමින් හිටපු යුද්ධ හමුදාධිපතිවරුන් වන විශ්‍රාමික ජෙනරාල් ශාන්ත කෝට්ටේගොඩ සහ විශ්‍රාමික ජෙනරාල් දයා රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිලධාරීහුද සහභාගී වූහ.



# යුද්ධ හමුදා මූලස්ථානයට පුස්තකාලයක්



**යුද්ධ හමුදාධිපති තුමාගේ සංකල්පයකට අනුව ස්ථාපනය කළ මෙම නව පුස්තකාල පරිශ්‍රය සියලුම නිලයන් සහ සිවිල් කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා සතියේ දින පහ පුරාවට විවෘතව පවතින අතර පුස්තකාල පරිශීලකයින් වෙත ඩිජිටල්කරණ පිටපත්, විෂයානුබද්ධ මූලාශ්‍ර, නොමිලේ *Wifi* පහසුකම, ඡායා පිටපත් ආදී පහසුකම් රැසක්ද සපයනු ලබයි.**








යුද්ධ හමුදාධිපති ගේ සංකල්පයකට අනුව යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් යුද්ධ හමුදා මූලස්ථානයේ ස්ථාපිත කළ තාක්ෂණික හා මෘදුකාංග පුස්තකාලය ඉකුත් ඔක්තෝබර් 17 වන දින පෙරවරුවේ විවෘත කෙරිණ.

අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී සහ පුහුණු අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී පීඑස්සී ගේ පිළිගැනුම් මධ්‍යයේ මෙම පුස්තකාලය විවෘත කිරීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ සහභාගී විය.

මෙම නව පුස්තකාලය ග්‍රන්ථ 9000 කට වැඩි ප්‍රමාණයකින් සමන්විත වේ. එය "තීරු සංකේත" (barcoding) සහ ඉලෙක්ට්‍රොනික වර්ගීකරණය සමගින් ලෝක ප්‍රකට "කොහා" පුස්තකාල කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීමට මූලික වූ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල මණ්ඩලය සමඟ සම්බන්ධතාවයෙන් යුතුව දින 40 ක් වැනි කෙටි කාලයක් තුළ ස්ථාපිත කරනු ලැබීය. තවද, මෙම පුස්තකාලය කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ විද්‍යුත් පුස්තකාලය සමග අන්තර්ජාලය ඔස්සේ නොමිලේ ප්‍රවිශ්ට විය හැකි ප්‍රවේශයක්ද සහිතය.

යුද්ධ හමුදා මූලස්ථානය වෙතින් සිදුකරනු ලැබූ මෙම ව්‍යාපෘතිය පිළිබඳ පැහැදීමට පත් MAS Slimtex ආයතනයේ සාමාන්‍යාධිකාරී උදාර විජයසුන්දර මහතා විසින් යුද්ධ හමුදා පුස්තකාලය වෙත පොත් විශාල ප්‍රමාණයක් පරිත්‍යාග කරනු ලැබීය. ඒ පිළිබඳ, කෘතඥතාවය පුදකරමින් යුද්ධ හමුදාධිපති විසින් උදාර විජයසුන්දර මහතා වෙත විශේෂ සමරු තිළිණයක්ද ප්‍රදානය කළේය.

අනතුරුව, ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති නන්ද ධර්මරත්න මහතාගේ විශේෂඥ මගපෙන්වීම මත යුද්ධ හමුදා පුස්තකාලයේ සමස්ත ක්‍රියාකාරකම් ඩිජිටල්කරණය කරනු ලැබූ "කොහා" පුස්තකාල කළමනාකරණ පද්ධතිය පිළිබඳ හඳුන්වාදීමක්ද සිදුකරන ලදී.

# දිරියට සවියක්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ උපදෙස් මත කොළඹ කොටස් හුවමාරුවේ අනුග්‍රාහක දායකත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථානයෙහි රාජකාරී කරනු ලබන සිවිල් සේවක මහත්ම මහත්මීන් 50 දෙනකු හට අත්‍යවශ්‍ය වියළි සලාක බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ඔක්තෝබර් 31 වන දින යුද්ධ හමුදා සේවා වනිතා ඒකක කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විණ.

දැනට රටෙහි පවතින ආර්ථික අපහසුතාවයන් සඳහා යම්කිසි සහනයක් ලබාදීමේ අරමුණින් සංවිධානය කරන ලද මෙම පරිත්‍යාග ලබාදීමේ අවස්ථාව සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහභාගී වූ අතර, කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන විධායක නිලධාරී රජීව බණ්ඩාරනායක මහත්මා ඇතුළු පිරිසක්ද ඊට එක්වූහ.

# අභිමන් මෙහෙයට පැසසුම්



යුද්ධ හමුදාවේ දශක දෙකකට වැඩි කාලයක් සේවය කර විශ්‍රාම දිවියට පා තබන යුද්ධ හමුදා මූලස්ථානයේ රෙජිමේන්තු සැරයන් මේජර් බලලත් නිලධාරී I ආර්ජීඑම්එස්එස් ජයවීර යූඑස්පී පසුගිය ඔක්තෝබර් 28 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය.

එහිදී, විශ්‍රාම දිවියට එළඹෙන රෙජිමේන්තු සැරයන් මේජර් යුද්ධ හමුදා මූලස්ථානයට මෙන්ම සමස්ත යුද්ධ හමුදාවටද කැපවීමෙන් කරන ලද සේවය ඇගයූ යුද්ධ හමුදාධිපති ඔහු වෙත සිය කෘතවේදීත්වය පළකරමින් සමරු තිළිණයක්ද ප්‍රදානය කළේය.



# පොපි මල් දිනය අරුත් ගන්වමින්

නොවැම්බර් මස 11 දිනට යෙදෙන පොපි මල් දිනයට සමගාමීව මානුෂීය මෙහෙයුමේදී දිවිපිදූ සියලුම රණවිරුවන් අනුස්මරණය කරමින් ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ සාමාජිකයින් විසින් පසුගිය ඔක්තෝබර් 19 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ වෙත පොපි මලක් පැළඳවීය.



එම අවස්ථාවට ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ උප සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් ඊඑම්එම් අඹන්පොල යූඑස්පී, එහි ලේකම් විශ්‍රාමික ලුතිනන් කර්නල් ඒකේ සියඹලාපිටිය පීඑස්සී එල්එස්සී, භාණ්ඩාගාරික මේජර් පීකේසීඑස් කංකානම්ගේ යූඑස්පී සමගින් පොපි කමිටුවේ සාමාජිකයන් කිහිපදෙනකුද එක්ව සිටියහ.

දෙවන ලෝක සංග්‍රාමය අවසන් වීමෙන් අනතුරුව සියලුම පොදුරාජ්‍ය මණ්ඩලීය සාමාජික රටවල සේවයේ යෙදී සිටියදී දිවිපිදූ හමුදා සාමාජිකයන්ගේ කැපවීම ඇගයීමට ලක්කරමින් සෑම වසරකම නොවැම්බර් මස 11 දිනට යෙදෙන පොපි දිනය මෙලෙස සමරනු ලබයි.

# ජකර්තා නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නව ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි

ඉන්දුනීසියාවේ, ජකර්තා නුවර පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක වශයෙන් පත්වීම් ලැබූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ කපිතාන් (ජී) ඒඑස්සී කරුණාසේන ආර්එස්පී යූඑස්පී පීඑස්සී පසුගිය ඔක්තෝබර් 27 වන දින ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවිය.



එහිදී, ඔහු වෙත සුබපැතුම් එක් කළ යුද්ධ හමුදාධිපති එම ධුරයේ වැදගත්කම සහ රටේ යහපත වෙනුවෙන් රාජ්‍ය තාන්ත්‍රිකයකු වශයෙන් කටයුතු කළයුතු ආකාරය පිළිබඳ පැහැදිලි කළේය.

# ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ අන්තර් බළඇණි සරඹ තරඟාවලිය

ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ "අන්තර් බළඇණි සරඹ තරඟාවලිය - 2022" පනාගොඩ පිහිටි එම රෙජිමේන්තු මූලස්ථානයේදී ඉකුත් ඔක්තෝබර් මස 07 දින සිට 09 දින දක්වා පැවැත්විණි. ඉංජිනේරු බලකායේ ඒකක 13 ක් නියෝජනය කරමින් භටපිරිස් සහභාගී වූ මෙම තරඟාවලියේ ත්‍යාග ප්‍රදානෝත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ කර්නල් සේනාවිධායක සහ යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩියූ සහභාගී විය.



මෙම තරඟාවලියේ ප්‍රථම ස්ථානය 5 වන ක්ෂේත්‍ර ඉංජිනේරු බලකාය විසින් දිනාගත් අතර 16 වන වැඩපළ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය දෙවන ස්ථානයත් 14 වන රසායනික ජීව විද්‍යාත්මක විකිරණ හා න්‍යෂ්ටික ප්‍රතිචාර බලගණය තෙවන ස්ථානයත් හිමිකරගත්හ. මෙම තරඟාවලියේ හොඳම බණ්ඩාර නිලධාරියා ලෙස 16 වන වැඩපළ ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ කපිතාන් ඩබ්ලිව්ජ්ආර්කේජ් වික්‍රමසිංහ සම්මාන දිනාගත් අතර, දක්ෂතම සරඹ උපදේශකට හිමි සම්මානය දිනාගනු ලැබුවේ 9 වන ක්ෂේත්‍ර ඉංජිනේරු බලකායේ මාණ්ඩලික සැරයන් සුමනදාස ජේඑම් විසිනි. මෙම ත්‍යාග ප්‍රදානෝත්සවයට ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, අණදෙන නිලධාරීන්, රෙජිමේන්තු සැරයන් මේජර්වරුන් ඇතුළු සෙසුනිලයන් රැසක් සහභාගී වූහ.



# නවසීලන්ත මහ කොමසාරිස් ආසේමු (යා) සංචාරයක



යාපනය අර්ධද්වීපයේ සංචාරයක නිරත වූ ශ්‍රී ලංකා නවසීලන්ත මහ කොමසාරිස් මයිකල් ඇපල්ටන් මහතා ඉකුත් ඔක්තෝබර් 03 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) සංචාරයක නිරතවෙමින් එහි ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එම්ජීසීඑස්බී විජයසුන්දර ආර්එස්පී යූඑස්පී එන්ඩියූ හමුවී සාකච්ඡාවක නිරත විය.

මෙම සුහද හමුවේදී යාපනය අර්ධද්වීපයේ වත්මන් තත්වය හා සංහිඳියාව වර්ධනය කිරීම වස් යුද්ධ හමුදාව විසින් සිදුකරනු ලබන වැඩසටහන් පිළිබඳව විශේෂ අවධානයක් යොමුකරන ලදී. එහිදී යාපනයේ හමුදා හටපිරිස් සිදුකරනු ලබන මෙහෙවර වෙනුවෙන් නවසීලන්ත මහ කොමසාරිස් තුමා විසින් විශේෂ ඇගයීමක් ද සිදුකළ අතර, එම සංචාරය සනිටුහන් කරමින් ආඥාපති විසින් නවසීලන්ත මහ කොමසාරිස්වරයා වෙත සමරු තිළිණයක්ද ප්‍රදානය කරන ලදී.



# වන්නි ආඥාපති 5 (සේවා) ගජබා රෙජිමේන්තුවේ සංචාරයක

ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් ඔක්තෝබර් 16 වන දින 5 (සේවා) ගජබා රෙජිමේන්තුවේ සංචාරයක නිරතවිය.

එහිදී, හටපිරිස්වල රාජකාරි කටයුතු පිළිබඳ සේම ඔවුන්ගේ පාලන අවශ්‍යතා පිළිබඳවද හෙතෙම සොයාබැලීය.

# විශේෂ අතිරේක ප්‍රහාරක බණ්ඩ පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන්

ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් පරිදි ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) යටතේ සේවයේ නියුතු යුද්ධ හමුදා හටපිරිස් වෙනුවෙන් ඉකුත් අගෝස්තු මස 22 දින සිට ඔක්තෝබර් මස 03 දින දක්වා පොම්පේමඩු බලඇණි පුහුණු පාසලේදී විශේෂ අතිරේක ප්‍රහාරක බණ්ඩ පුහුණු පාඨමාලාවක් පැවැත්විණි.

අනතුරු ඇඟවීමේ ආරක්ෂක ක්‍රියාත්මක *GPS* යන්ත්‍ර හැසිරවීම, ආත්මාරක්ෂක සටන් ක්‍රම, අවි රහිත සටන් ක්‍රම, ප්‍රභූ ආරක්ෂාව, පුපුරණ ද්‍රව්‍ය හඳුනාගැනීම සහ නිෂ්ක්‍රිය කිරීම, අවි හැසිරවීම, සෝදිසි කිරීම සහ මුදවා ගැනීමේ මෙහෙයුම්, වෙඩි තැබීම, යුද මූලධර්ම, සමාජ මෙහෙයුම් ක්‍රියා පටිපාටි, සහ ආරක්ෂක රාජකාරි පිළිබඳව යුද්ධ හමුදා හටපිරිස් වෙත ප්‍රායෝගික මෙන්ම න්‍යායාත්මක දැනුම ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්විණි. තරගාවලියේ, 8 දෙනකුගෙන් යුත් හොඳම කණ්ඩායම ලෙස 54 වන සේනාංක කණ්ඩායම සම්මාන දිනාගත්තේය. පාඨමාලාවේ සමාප්ති දේශනය ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති විසින් පවත්වනු ලැබූ අතර එම අවස්ථාව සඳහා 56 වන සේනාංකයේ සේනාංකාධිපති, නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක්ද සහභාගී වූහ.







# ශ්‍රී මහා බෝධියේ අංකුර බෝධීන් වහන්සේ නමක් කවුඩාගල ආරණ්‍ය සේනාසන විහාරස්ථානයට

වැලිකන්ද, කවුඩාගල ආරණ්‍ය සේනාසන පුරාණ විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීමකට අනුව ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) විසින් ඉකුත් ඔක්තෝබර් 15 වන දින අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුර බෝධීන් වහන්සේ නමක් විචිත්‍රවත් පෙරහැරකින් එම විහාරස්ථානය වෙත වැඩම කර එම පරිශ්‍රයේ රෝපණය කරනු ලැබීය.

වැලිකන්ද, කවුඩාගල ආරණ්‍ය සේනාසන පුරාණ විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය දේවගල ප්‍රඥාසීහාලංකාර හිමිපාණන් විසින් සිදුකළ ඉල්ලීමකට අනුව ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ විසින් එම ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේලා, යුද්ධ හමුදා සාමාජිකයින් සහ බැතිමතුන් රැසකගේ සහභාගීත්වයෙන් මෙම පුණ්‍ය උත්සවය පවත්වන ලදී.

# විශේෂ අවශ්‍යතා සහිත ළමුන් වෙනුවෙන් වැඩසටහනක්



ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) සම්බන්ධීකරණයෙන් වැලිකන්ද ප්‍රදේශයේ ස්ථාපිත 5 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ භටපිරිස් විසින් මඩකලපුව, සතුරුකොන්දාන් ප්‍රදේශයේ පිහිටි *'Ozanam'* මධ්‍යස්ථානයේ නේවාසිකව සිටින විශේෂ අවශ්‍යතා සහිත ළමුන් වෙනුවෙන් ප්‍රනීත දිවා භෝජන සංග්‍රහයක් පවත්වා ඔවුන් වෙත වියළි සලාක පාර්සල් පිරිනැමීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 09 වන දින සිදුකරන ලදී.



ආරක්ෂක සේනා (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහනට 5 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ සාමාජිකාවන් සහ 4 වන ගැමුණු හේවා බලකායේ භටපිරිස් දායක වූහ. එහිදී, කාන්තා භටපිරිස් විසින් රුපියල් 60,000.00 වටිනාකමකින් යුත් වියළි සලාක පාර්සල් එම මධ්‍යස්ථානයේ සිටින දරුවන් 24 දෙනකුගේ මව්පියන් වෙත පිරිනමනු ලැබීය.



# ජල පවිත්‍රාගාරයක් ජනතා අයිතියට



ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති ගේ අදහසකට අනුව කරිපට්ටමුරිප්පු ග්‍රාමයේ ජනතාවට අත්‍යවශ්‍යව පැවති ජල පවිත්‍රාගාරයක් ඉකුත් ඔක්තෝබර් 01 වන දින ජනතා අයිතියට පත්කරන ලදී. ශ්‍රී ලංකා සත්‍යසායි ජාත්‍යන්තර සංවිධානයේ මූල්‍ය දායකත්වයෙන් හා 23 වන විජයබාහු පාබල රෙජිමේන්තුවේ ශ්‍රම දායකත්වයෙන් පසුගිය වර්ෂයේ දෙසැම්බර් 21 වන දින සුබ මොහොතින් මුල්ගල තබා ඇරඹි මෙම පවිත්‍රාගාරය සඳහා රුපියල් මිලියන 1.5 ක් වැය වී ඇත. මෙමගින් ප්‍රදේශයේ සිවිල් වැසියෝ 500 දෙනකුට අධික ප්‍රමාණයක් පානීය ජලය ලබාගැනීම සිදුකරති. මෙම ජල පවිත්‍රාගාරය ජනතා අයිතියට පත්කිරීම ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ සහ ශ්‍රී ලංකා සත්‍යසායි ජාත්‍යන්තර සංවිධානයේ සභාපති වී. මනෝහරන් මහතා විසින් සිදුකරනු ලැබූහ. එමෙන්ම එම අවස්ථාවේදී පාසල් ළමුන් 15 දෙනකු සඳහා පාසල් උපකරණ ලබාදීමද සිදුකෙරිණ.

# අඩුආදායම්ලාභී පවුලක් සඳහා නව නිවසක්



661 වන පාබල බලසේනා බලප්‍රදේශයේ ස්ථානගත 5 (සෙව්) යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව වෙතින් සෙල්ලිපුරම් ග්‍රාමයේ පදිංචි අඩුආදායම්ලාභී ඒ අනෝජන් යන අය වෙත නව නිවසක් ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීම පසුගිය ඔක්තෝබර් 03 වන දින ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඑස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. මෙම අවස්ථාවට 66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති බ්‍රිගේඩියර් එස්ජේ ප්‍රියදර්ශන ආර්ඩබ්ලිව් ආර්එස්පී යූඑස්පී, 661, 662 සහ 663 වන පාබල බලසේනාවන්හි බලසේනාධිපතිවරු, 5 (සෙව්) යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.



# ලෝක ළමා දින සැමරුමක්





ලෝක ළමා දිනයට සමගාමීව ඉකුත් ඔක්තෝබර් 01 වන දින "SURASA" මාදිවෙල පිරිමි ළමුන් සඳහා වන විශේෂිත අධ්‍යාපන පාසල හා ළමා නිවාසයේදී මානුෂීය වැඩසහනක් සංවිධානය කෙරිණ. ඒ සඳහා 142 වන පාබල බලසේනා මූලස්ථානය, 15 වන ඩ්‍රෝන් රෙජිමේන්තුව, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව, 7 වන ගැමුණු හේවා බළඇණිය සහ 14 වන බළඇණිය විජයබාහු පාබල රෙජිමේන්තුවේ හටපිරිස් සිය දායකත්වය දැක්වූහ.

මෙම වැඩසටහනේ ප්‍රධාන ආරාධිතයන් ලෙස ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ එම මැතිනිය සහභාගී වූහ. තවද, 14 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 142 පාබල බලසේනාවේ බලසේනාධිපති, යුද හමුදා නිලධාරීන්, කාර්ය මණ්ඩලය සහ පාසල් සිසුන් රැසක්ද එක්වූහ. මෙහිදී, ළමුන් සඳහා චිත්‍ර තරගයක්, සංගීත පුටු තරගයක් සහ බැලුම් පිම්බීමේ තරගයක් ඇතුළු රසවත් ක්‍රීඩා ඉසව් කිහිපයක්ද සංවිධානය කර තිබුණි. තවද, පාසලේ ළමුන් විසින් ඉදිරිපත් කරන ලද නැටුම් සංදර්ශනයක්ද එහිදී පැවැත්විණ. එම ළමුන් සඳහා කෙටි ආහාර වේලක් හා දිවා ආහාර වේලක් ලබාදීමටද සංගීත පුටු තරගයට සහභාගී වූ ළමුන් සඳහා ත්‍යාග බෙදාදීමටද කටයුතු සංවිධානය කර තිබුණි.



# ආරක්ෂක සේනා (බටහිර) සෙබළුන් විසින් ඩෙංගු මර්දන වැඩසටහනකට සහාය වෙයි





දිවයින පුරා ක්‍රියාත්මක ජාතික ඩෙංගු මර්ධන වැඩසටහන්වලට සමගාමීව ආරක්ෂක සේනා (බටහිර) බලප්‍රදේශයේ ස්ථාපිත 14 සහ 61 වන පාබල සේනාංක හටපිරිස් පසුගිය ඔක්තෝබර් 03 - 05 දින දක්වා එම බලප්‍රදේශයට අයත් දිස්ත්‍රික්ක 5 ක් ආවරණය වන පරිදි ඩෙංගු මර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති ගේ සහ 14 හා 61 පාබල සේනාංකවල සේනාංකාධිපතිවරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදුවූ එම ප්‍රජාසත්කාරයට වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ වෙනත් රාජ්‍ය නිලධාරීන් රැසක්ද එක්ව සිටියහ.

# 73 වන යුද්ධ හමුදා දිනය සමරමින්



ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ උපදෙස් පරිදි 73 වන යුද්ධ හමුදා දිනය එම මූලස්ථානයේදී උත්කර්ෂවත් අන්දමින් සමරන ලදී. එහිදී, බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික, බ්‍රිගේඩියර් පාලන හකාස ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් උදෑසන යුද්ධ හමුදා ධජය ඔසවා යුද්ධ හමුදා ගීතය වාදනයෙන් අනතුරුව යුද්ධ හමුදාධිපතිතුමන්ගේ සුභාසිංශන පණිවුඩය ඉදිරිපත් කෙරිණ. අනතුරුව කඳවුරු භූමිය තුළ කුඹුක්, කොස්, මී ඇතුළු රුක් රෝපණ වැඩසටහනක්ද කහගොල්ල ශ්‍රී ඥාණාරාම ආරණ්‍ය සේනාසනයේ සුද්ද පවිත්‍ර කිරීමේ වැඩසටහනක්ද පවත්වන ලද අතර, සියලුනිල දිවා භෝජන සංග්‍රහයක්ද මෙම වැඩසටහනට එක්ව තිබිණ.



# ලෝක ළමා දිනය නිමිත්තෙන් සිසු දරුදැරියන්ට සත්කාර



ලෝක ළමා දිනයට සමගාමීව යුද්ධ හමුදාව හා සිවිල් පුරවැසියන් අතර සහයෝගිතාවය වර්ධනය කිරීමේ අරමුණින් සංවිධානය කෙරුණු වැඩසටහනක් පසුගිය ඔක්තෝබර් 01 වන දින සූරියවැව හ/හත්පේරුව කණිෂ්ඨ විද්‍යාලයේ සිසු සිසුවියන්ගේ සහභාගීත්වයෙන් සිදුකෙරිණ. 12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ උපදෙස් මත 122 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ අධීක්ෂණයෙන් පැවැත්වූ එම වැඩසටහනේදී පාසල් පොත් බෙදාදීම, විනෝදාස්වාදය ගෙනදෙන කැලිප්සෝ සංගීත වැඩසටහනක් පැවැත්වීම සහ පාසලේ සියලුම සිසුන් හට දිවා ආහාර වේලක් ලබාදීම විශේෂ විය. 122 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් කේඑම්එන් කුලසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ සහභාගීත්වයෙන් පැවති එම වැඩසටහන සඳහා 23 වන ගජබා රෙජිමේන්තුවේ සහ 3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ භටපිරිස් හා ප්‍රදේශයේ සිවිල් වැසියන් රැසක් සහභාගී වූහ.







ලෝක ළමා දිනයට සමගාමීව 111 වන පාබල බලසේනාවේ අධීක්‍ෂණය මත 4 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරීගේ මගපෙන්වීමෙන් මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි යහපත් එඬේරාගේ කන්‍යාරාමයේ දැරියන් උදෙසා දිවා ආහාරය සහ අධ්‍යාපන කටයුතු සඳහා අවැසි පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පසුගිය ඔක්තෝබර් 01 වන දින පවත්වන ලදී. එහිදී, ඒකක සංගීත කණ්ඩායම දැරියන්ගේ විනෝදාස්වාදය හා සංගීතමය හැකියාවන් ඔප්නංවමින් විචිත්‍රවත් හෝරා කිහිපයක් ගතකළ අතර, එම වැඩසටහන් මාලාව දැරියන්ගේ මෙන්ම ළමා නිවාසය භාර පාලිකාවන්ගේද මහත් පැසසුමට ලක්විය.

23 වන විජයබාහු පාබල රෙජිමේන්තුව වෙතින් ලෝක ළමා දිනයට සමගාමීව එම බල ප්‍රදේශයට අයත් සමන්කුලම් ග්‍රාම සේවා වසමේ පිහිටා ඇති සමන්කුලම් රජයේ දමිළ මිශ්‍ර පාසලේ ඉගෙනුම ලබන පාසල් ළමුන් හා ගුරුවරුන් වෙනුවෙන් ආහාර පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් පසුගිය සැප්තැම්බර් 30 වන දින සිදුකෙරිණ.

මෙම වැඩසටහන 642 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ජීඩීඑස්එම් අල්විස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ 23 වන විජයබාහු පාබල රෙජිමේන්තු ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එච්එම්ජේඑස් බණ්ඩාරනායක ආර්එස්පී ගේ මගපෙන්වීමෙන් එම ඒකක භට පිරිස් විසින් සංවිධානය කරනු ලැබූහ.





ලෝක ළමා දිනයට සමගාමීව 17 (සේවා) ගජබා රෙජිමේන්තු බලප්‍රදේශයට අයත් පෙරියඉන්තිමඩු ග්‍රාම සේවා වසමේ පිහිටා ඇති රජයේ දමිළ මිශ්‍ර පාසලේ ඉගෙනුම ලබන පාසල් ළමුන්, ගුරුවරුන් සහ ළමුන්ගේ දෙමාපියන් වෙනුවෙන් සත්කාරක වැඩසටහනක් පසුගිය සැප්තැම්බර් 30 වන දින පැවැත්විණ. ඒ යටතේ තේ පැන් සංග්‍රහයක්, විනෝද ක්‍රීඩා, පොත්පත් බෙදාදීම සහ දිවා ආහාර ලබාදීම සිදුකෙරිණ.

17 (සේවා) ගජබා රෙජිමේන්තුවේ දෙවන අණදෙන නිලධාරී මේජර් එස්අයිඑස්එස් ද සිල්වා ගේ පූර්ණ අධීක්ෂණය යටතේ පැවති මෙම අවස්ථාවට පාසල් සිසු සිසුවියන්, දෙමාපියන් විශාල පිරිසක් සහභාගී වූහ.



ලෝක ළමා දිනයට සමගාමීව 8 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා ඒකක බලප්‍රදේශයට අයත් තඩ්ඩියාමලේ ග්‍රාම සේවා වසමේ පෙරියසාලම්බන් ගම්මානයේ පිහිටා ඇති "ජනා" පෙර පාසල් පරිශ්‍රය තුළ ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම මැඩලීම සඳහා පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩ සටහනක් පසුගිය ඔක්තෝබර් 01 වන දින සංවිධානය කරන ලදී.

8 වන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා ඒකක අණදෙන නිලධාරී එන්ටීඑන් ජයවර්ධන ආර්එස්පී යූඑස්පී ගේ පූර්ණ අධීක්ෂණයෙන් එම ඒකකයේ භටපිරිස් හා පෙර පාසලේ ඉගෙනුම ලබන ළමුන්ගේ දෙමාපියන්ගේ සහභාගීත්වයෙන් මෙම කටයුත්ත සිදුකරනු ලැබූහ.



# 51 වන පාබල සේනාංකයෙන් ළමා දිනයට වැඩසටහනක්






51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඑච් උදයකුමාර ආර්එස්පී යූඑස්පී යූඑස්ඒඩබ්ලිව්සී පීඑස්සී ගේ මගපෙන්වීම සහ පූර්ණ අධීක්ෂණය යටතේ සංවිධානය කළ ලෝක ළමා දින සැමරුම් වැඩසටහනක් පසුගිය ඔක්තෝබර් 01 වන දින 51 වන පාබල බල සේනාංක මූලස්ථානයේදී පවත්වන ලදී. කෝපායි දකුණ කානන් බාලිකා නිවාසයේ ළමුන්ගේ සහභාගීත්වයෙන් පැවති එම සැමරුම් උත්සවය ළමා විනෝද ක්‍රීඩා, නැටුම්, විචිත්‍රවත් සංගීත ප්‍රසංගයක් සහ විනෝදාත්මක අංග රැසකින් සමන්විත විය. මෙම අවස්ථාව සඳහා 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, අණදෙන නිලධාරීවරුන්, නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක්ද සහභාගී වූහ.

---

# ළමා දිනය වෙනුවෙන් වැඩසටහන් රැසක්







ලෝක ළමා දිනයට සමගාමීව ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ අධීක්ෂණය යටතේ ඉකුත් සැප්තැම්බර් 30 වන දින වැඩසටහන් මාලාවක් පැවැත්විණ. එදින උදෑසන මධ්‍යම බලප්‍රදේශයේ පිහිටා ඇති වීරුකැකුළු පෙරපාසලේ දරුවන් වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පැවැත්වූ අතර, එහිදී පෙරපාසලේ දරුවන්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා නැටුම් ගැයුම් වලින් සමන්විත විශේෂාංග ඉදිරිපත් කරන ලදී. තවද සන්ධ්‍යා කාලයේ බණ්ඩාරවෙල අඹේගොඩ සිරි සඟබෝ ළමා නිවාසයේ දරුවන් 18 දෙනකු සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ප්‍රධාන සිවිල් සම්බන්ධීකරණ කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් යුතුව බණ්ඩාරවෙල ගයාන් ටෙක්ස්ටයිල් ආයතනයේ අනුග්‍රහයෙන් ටී ෂර්ට් පරිත්‍යාග කිරීමක් ද බණ්ඩාරවෙල *Pizza Hut* ආයතනයේ අනුග්‍රහයෙන් *Pizza* ආහාර වේලක් ලබාදීමද එම ළමා නිවාසයේදී සිදුකරන ලදී.

මෙම අවස්ථාව සඳහා ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති ගේ බිරිඳ වන සරිතා ලංකාතිලක මහත්මිය ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# 58 වන පාබල සේනාංකයෙන් ශාසනික කටයුත්තක්





දංගහවෙල ශ්‍රී ධර්මරාජ විහාරස්ථානයේ වාර්ෂිකව පවත්වන ලද කඨින පිංකමට සමගාමීව එහි විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ ඉල්ලීම පරිදි ඉකුත් ඔක්තෝබර් 18 වන දින 58 වන පාබල සේනාංක මූලස්ථානය ඉදිරිපිටදී සර්වඥ ධාතූන් වහන්සේලා ප්‍රදර්ශනයක් පැවැත්විණ. 58 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩබ්ලිව්ජී ඉහලගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ මඟපෙන්වීම මත සිදුකළ මෙම ශාසනික කටයුත්තේදී සේනාංකයේ නිලධාරීන්, සෙසුනිලයින්, සිවිල් සේවක මහතුන්ට මෙන්ම ප්‍රදේශවාසීන්ටද එම ධාතූන් වහන්සේ වැඳපුදා ගැනීමේ අවස්ථාව හිමිවූ අතර, අනතුරුව එම වැඩමවා වදාළ ස්වාමීන් වහන්සේලා හා මෙහෙනින් වහන්සේලා වෙනුවෙන් දහවල දානය පිරිනැමීමටද කටයුතු සිදුකෙරිණ.

# කල්පිටිය ක්ෂේත්‍ර වෙඩි පිටියේ පැවති ජීව වෙඩි තැබීමේ පුහුණු අභ්‍යාසය සාර්ථකව අවසන්



යුද්ධ හමුදාවේ රෙජිමේන්තු කිහිපයක් නියෝජනය කරන ශිෂ්‍ය නිලධාරීන් සහ සෙසු නිලයින් 146 දෙනකුගෙන් යුත් කණ්ඩායමක සහභාගීත්වයෙන් කල්පිටිය ක්ෂේත්‍ර වෙඩි පිටියේදී පැවති ජීව වෙඩි තැබීමේ පුහුණු අභ්‍යාසයේ විසිරයෑමේ උත්සවය පසුගිය සැප්තැම්බර් 30 වන දින පැවැත්විණි.

වවුනියාවේ, පෙරියතම්පනෛ ප්‍රදේශයේ පිහිටි යාන්ත්‍රික පාබල රෙජිමේන්තු පුහුණු මධ්‍යස්ථානයේ තරුණ නිලධාරීන්ගේ පාඨමාලාවේ සාමාජිකයන්, සන්නද්ධ රථ අණදෙන නිලධාරීන් සහ සැඟවුණු වෙඩික්කරු මූලික වෙඩි තැබීමේ පාඨමාලා සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් වසර 7 කට පසුව පැවැත්වූ මෙම ජීව වෙඩි තැබීමේ පුහුණු අභ්‍යාසය සඳහා *BMP MK II* සන්නද්ධ රථ දෙකක්, *T* 89 *VPI* සන්නද්ධ රථ දෙකක්, *WMZ* 551*B* සන්නද්ධ රථයක් සහ 30 මි.මි. කැනන් අවි, 12.7 මි.මි. ගුවන් යානා නාශක මිසයිල (*AAMG* වර්ගයේ *QJC* 88), 7.62 මි.මි. *PKT* අවි ආධාරයෙන් ජීව වෙඩි තැබීම් සිදුකෙරිණි. එම පාඨමාලා සාමාජිකයන් 146 දෙනා තම යුද්ධ හමුදා දිවිය තුළ සිදුකරන ලද පළමු සහ විශාලතම ජීව වෙඩි තැබීමේ පුහුණු අභ්‍යාසය මෙය විය.

යාන්ත්‍රික පාබල රෙජිමේන්තු බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් බීපීජීකේ බාලසූරිය ආර්එස්පී පීඑස්සී ගේ හා යාන්ත්‍රික පාබල රෙජිමේන්තු පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක ගේ අධීක්ෂණය මත සංවිධානය කළ මෙම වෙඩිතැබීමේ පුහුණු අභ්‍යාසය එම පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රධාන උපදේශක මේජර් ජීවන් රණසිංහ ගේ සම්බන්ධීකරණය මත පැවැත්විණි.

# මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ සිසුන් ගවේෂණාත්මක චාරිකාවක



මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ ප්‍රතිත්‍රස්ත කැලෑබද සටන් පුහුණු පාඨමාලාව සහ තවත් පාඨමාලා කිහිපයක් හදාරන සිසුන් ඉකුත් ඔක්තෝබර් 02 වන දින කන්දේගම ධනංජය රජ මහා විහාරස්ථානයේ චාරිකාවක නිරත වූහ. බෞද්ධ ග්‍රන්ථයන්හි හා වංශ කතා සාහිත්‍යයන්හි සඳහන් වන පෞරාණික හා ආගමික වටිනාකකම පිළිබඳව ගවේෂණය කිරීම එහි අරමුණ විය. "ශ්‍රී ලංකා යුද්ධ හමුදා ඉදිරි උපායමාර්ගික සැලැස්ම 2020 - 2025" ට සමගාමීව සිදුකරනු ලබන පුහුණු වැඩසටහන්හි ප්‍රායෝගික ක්‍රියාකාරකමක් ලෙස මෙම ගවේෂණාත්මක චාරිකාව සංවිධානය කෙරුණු අතර මේ සඳහා විදේශීය සිසුන් ඇතුළු නිලධාරීන් 116 දෙනෙක්, උපදේශකවරුන් 7 දෙනෙක් සහ සෙසුනිලයන් 100 කට අධික පිරිසක් එක්ව සිටියහ.

# කළු මෙහෙයට බුහුමන්





යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ හිටපු සභාපතිනී සුජීවා නෙල්සන් මහත්මිය එම ඒකකය වෙත ලබාදුන් ක්‍රියාකාරී දායකත්වය හා කැපවීම අගය කිරීම වෙනුවෙන් සංවිධානය කෙරුණු සමුගැනීමේ සාදයක් හා රාත්‍රී භෝජන සංග්‍රහයක් ඉකුත් ඔක්තෝබර් 02 වන දින හිල්ටන් හෝටලයේදී පැවැත්විණ.

යුද්ධ හමුදා අධිරිද්ම සංගීත කණ්ඩායමේ සංගීතයෙන් හා යුද්ධ හමුදා නර්තන කණ්ඩායමේ අලංකාරවත් නර්තන අංගයන්ගෙන් වර්ණවත් වූ මෙම අවස්ථාවේදී සුජීවා නෙල්සන් මහත්මිය වෙත සමරු තිළිණයක් හා එතුමියගේ සේවා කාලය තුළදී සිදුකරන ලද ක්‍රියාකාරකම් ඇතුළත් ඡායාරූප ඇල්බමයක්ද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය විසින් පිරිනැමුවාය. මෙම සමුගැනීමේ සාදය සඳහා සේවා වනිතා ඒකක විධායක කමිටු සාමාජිකාවන්, රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවන්හි සභාපතිනියන් ඇතුලු පිරිසක් සහභාගී වූහ.

# සැදෑ දිවියට සැබෑ සත්කාරයක්



අංක 55, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල ලිපිනයේ පිහිටා ඇති වැඩිහිටි නිවාසයේ නේවාසිකව සිටින පිරිමි අයවලුන් සඳහා දහවල් ආහාරය ලබාදීමේ දානමය පිංකමක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් 03 වන දින පවත්වන ලදී.

මෙම පිංකම අවසානයේ නේවාසික පහසුකම් ලබන අයවලුන්ගේ මානසික සුවතාවය වැඩිදියුණු කිරීම උදෙසා 2(සේව) පොදුසේවා බලකා කැලිප්සෝ කණ්ඩායම විසින් සංගීත රසාස්වාදය ලබාදුන් අතර, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ දායකත්වයෙන් පිළියෙල කරන ලද අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් තෑග පාර්සල් ද එම නේවාසිකව අයවලුන් හට ලබාදුන්හ. තවද වැඩිහිටි නිවාසයේ පොදු අවශ්‍යතාවයන් සඳහා පවිත්‍රතා ද්‍රව්‍ය, සනීපාරක්ෂක ද්‍රව්‍ය මෙන්ම තවත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සහ ඖෂධ තොගයක්ද වැඩිහිටි නිවාසය භාර පාලිකාව වෙත සභාපතිනිය විසින් ප්‍රදානය කළාය.



# ගර්භණී මව්වරුන් හට ත්‍යාග පාර්සල් බෙදාදීමක්

73 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ගර්භණී තත්වයේ පසුවන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ බිරින්දෑවරුන් සහ සේවයේ නියුතු නිලධාරිනියන්, කාන්තා සෙබළියන් හට අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් ඔක්තෝබර් 04 වන දින නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහලේදී පවත්වන ලදී.

එහිදී, ගර්භණී මව්වරුන් 100 දෙනකු හට එම අත්‍යවශ්‍ය භාණ්ඩ පාර්සල් හිමිගැන්විණ. එහිදී, එම රෝහලෙහි වාට්ටු අංක 04 හි නිරීක්‍ෂණ චාරිකාවකද නිරත වූ සේවා වනිතා සභාපතිනිය එහි නේවාසිකව ප්‍රතිකාර ලබන සියලු ගර්භණී මව්වරුන් හටද එම වාට්ටුවේ රාජකාරී කරනු ලබන සියලු කාර්ය මණ්ඩලය වෙතද ත්‍යාග පාර්සල් බෙදාදීමට කටයුතු කළාය. මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ ජ්‍යේෂ්ඨ සාමාජිකාවන් රැසක් සහභාගී වූහ.





# මෙත්සෙවන නිවාසයට රණවිරු සත්කාරයක්






බොරලැස්ගමුව මෙත්සෙවන රජයේ නිවර්ථන නිවාසයේ නේවාසිකව සිටින කාන්තාවන් 150 දෙනකු හට සහ එම ආයතනයට අත්‍යවශ්‍යව තිබූ භාණ්ඩ බෙදාදීමේ වැඩසටහනක් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ මූලිකත්වයෙන් ඉකුත් ඔක්තෝබර් 17 වන දින එම නිවාසයේදී පැවැත්විණ. එහිදී රුපියල් ලක්‍ෂ දහයක් වටිනා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා ත්‍යාගයන් නේවාසිකව සිටින අයවළුන්ගේ ප්‍රයෝජනය සඳහා සභාපතිනියගේ සුරතින් පිරිනමනු ලැබුවාය.

මෙම අවස්ථාවට යුද්ධ හමුදා විධායක කමිටු ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන්, බස්නාහිර පළාත් සමාජ සේවා අධ්‍යක්‍ෂිකා සෙව්වන්දි හෙට්ටිආරච්චි මහත්මිය, මෙත්සෙවණ නිවර්ථන නිවාසයේ අධිකාරී ප්‍රදීපා ඩී රණේපුර මහත්මිය ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# යුද්ධ හමුදා දිනයට සමගාමීව වැඩසටහනක්



73 වන යුද්ධ හමුදා දිනයට සමගාමීව යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිය ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන් රැසක් සංවිධානය කරනු ලැබිය. එහි එක් අංගයක් ලෙස යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ රාජකාරි කරන යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දූ දරුවන් හට අවශ්‍ය පාසල් උපකරණ බෙදාදීමද සේවා වනිතා ඒකකයේ හා කළමනාකරණ හා නඩත්තු අධ්‍යක්ෂ මණ්ඩලයෙහි රාජකාරි කරනු ලබන සිවිල් සේවකයින් වෙත අත්‍යාවශ්‍ය වියළි සලාක ද්‍රව්‍ය ඇතුළත් පාර්සල් ලබාදීමේ වැඩසටහනක් පසුගිය ඔක්තෝබර් මස 10 වන දින සිදුකෙරිණ. දැනට රටෙහි පවතින ආර්ථික අපහසුතාවයන් සඳහා සහනයක් සැලසීමේ අරමුණින් මෙම මාහැඟි වැඩසටහන සංවිධානය කෙරිණ.



# විශ්ව ළමා දිනයට සමගාමීව අධ්‍යාපනික සත්කාරයක්







පසුගියදාට යෙදුනු විශ්ව ළමා දිනයට සමගාමීව සංඥා බලකායේ සේවයේ නියුතු සෙසුනිලයින්ගේ හා සිවිල් සේවක මහතුන්ගේ පාසල් අධ්‍යාපනය හදාරන දරුවන් 1500 දෙනකු සඳහා රුපියල් මිලියන 4 ක පමණ වටිනාකමින් යුත් පාසල් උපකරණ බෙදාදීමේ උත්සවයක් පසුගිය ඔක්තෝබර් 08 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී පැවැත්විණ.

ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සමිකා හේරත් මහත්මියගේ ආරාධනයෙන් එම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස සහභාගී වූවාය. එහිදී, දරුවන් 53 දෙනකු සඳහා සංකේතාත්මකව පාසල් උපකරණ බෙදාදෙන ලදී. සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ අදහසකට අනුව එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ දායකත්වයෙන් මෙම මාහැඟි සත්කාරය සිදුකෙරිණ.

# සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවෙන් අධ්‍යාපනයට අත්වැලක්





ලෝක ළමා දිනයට සමගාමීව ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හර්ෂණී බෝතොට මහත්මියගේ මූලිකත්වයෙන් එම රෙජිමේන්තුවේ සේවයේ නියුතු තෝරාගත් යුද්ධ හමුදා සාමාජිකයින්ගේ පාසල් අධ්‍යාපනය හදාරන ළමුන් වෙත ශිෂ්‍යත්වයන් ලබාදීමේ වැඩසටහනක් රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. ඒ සඳහා එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්ගේ මූල්‍ය අනුග්‍රාහකත්වයෙන් රුපියල් 36,000 ක් සහ රුපියල් 60,000 ක් බැගින් ප්‍රේෂණපත් එම ළමුන් සඳහා ලබාදෙන ලදී.

# කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවෙන් මාහැඟි පරිත්‍යාගයක්



ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා සභාපතිනියගේ ඉල්ලීමකට අනුව කොළඹ රාජකීය විද්‍යාලයේ බෞද්ධ ශිෂ්‍ය සහෝදර සංගමය මගින් සංවිධානය කරන ලද අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් වියළි සලාක මලු බෙදාදීමේ වැඩසටහනක් පසුගියදා පවත්වන ලදී. එහිදී, එම රෙජිමේන්තුව යටතේ රාජකාරි නියුතු සිවිල් සේවක මහතුන් 61 දෙනකු වෙත සලාක මලු පිරිනමන ලදී.

# අභිමංසල සුවසහන නිකේතනයේ සංචාරයක්





ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ උප සභාපතිනි වජිරා එදිරිසිංහ මහත්මිය එහි ලේඛම් අරුණි චන්ද්‍රසේකර මහත්මිය සහ එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් පිරිසක් පසුගියදා අභිමංසල 11 කඹුරුපිටිය සුවසහන මධ්‍යස්ථානයේ සංචාරයක නිරතවූහ. පුනරුත්ථාපනලාභීන්ගේ සුවදුක් සොයාබැලීමේ අරමුණින් සිදුකළ එම චාරිකාවේදී ඔවුන් සමග සුහද පිළිසඳරක නියැලෙමින් ඔවුන් පරිහරණය කරනු ලබන බඩු භාණ්ඩ අලුත්වැඩියා කරදීමටද කටයුතු යොදන ලදී. තවද ඔවුන් වෙනුවෙන් තේ පැන් සංග්‍රහයක් හා ත්‍යාග ලබාදීමක්ද සිදුකරන ලදී.

# පූර්ව ළමාවිය සංවර්ධනයට අත්වැලක්





1 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව විසින් මත්තේගොඩ "මව්පිය සෙවණ" ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ දරුවන් හට ලිපිද්‍රව්‍ය, වියළි සලාක බෙදාදීමේ වැඩසටහනක් සහ දිවා ආහාරය ලබාදීමේ සත්කාරයක් පසුගිය ඔක්තෝබර් මස 06 වන දින සිදුකරන ලදී. ශ්‍රී ලංකා ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කෙරුණු මෙම වැඩසටහන සඳහා නුවන් සංජීව, ධනුක විජේසේකර හා කපිතාන් ලහිරු රත්නායක යන මහත්වරු ද්‍රව්‍යමය අනුග්‍රහකත්වය ලබාදෙනු ලැබූහ. තවද, මෙම වැඩසටහනේදී එම රෙජිමේන්තු කැලිප්සෝ සංගීත කණ්ඩායමේ සහභාගීත්වයෙන් එම දරුවන් හට සිය දක්ෂතාවයන් ඉදිරිපත් කිරීමටද අවස්ථාව සැලසිණ.



# මිහිඳු සෙත් මැදුරේ සංචාරයක්



ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශිරෝමාලා කොඩිතුවක්කු මහත්මියගේ ප්‍රධානත්වයෙන් එහි සාමාජිකාවෝ පිරිසක් ඉකුත් ඔක්තෝබර් 21 වන දින අත්තිඩියේ පිහිටි මිහිඳු සෙත් මැදුරෙහි සංචාරයක් සිදුකරනු ලැබූහ.

එහිදී, නේවාසික රෝගීන් වෙනුවෙන් තේපැන් සංග්‍රහයක් ලබාදී ඔවුන් වෙත සනීපාරක්‍ෂක භාණ්ඩ හා ප්‍රථමාධාර කට්ටල පරිත්‍යාගයක්ද සිදුකරන ලදී. තවද, එම රෝගීන් දිරිමත් කිරීම වෙනුවෙන් කැලිප්සෝ සංගීත කණ්ඩායමක සංගීත රසාස්වාදයද ලබාදීමටද කටයුතු කෙරිණ.

# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව ලෝක ළමා දිනය සමරයි





ඉකුත් ඔක්තෝබර් 01 වන දිනට යෙදී තිබූ ලෝක ළමා දිනයට සමගාමීව සිංහ රෙජිමේන්තුවට අයත් නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ දූ දරුවන් සඳහා වූ වැඩසටහනක් සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඔමිලා ජයවර්ධන මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ඔක්තෝබර් 15 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථාන ශාහස්ථ ක්‍රීඩාගාරයේදී පැවැත්විණ. එහිදී මෙම වැඩසටහන සඳහා සහභාගී වූ දූ දරුවන්ගේ විනෝදාස්වාදය උදෙසා විවිධ තරඟ ඉසව් සහ විවිධ ක්‍රියාකාරකම් රැසක් සිදුකළ අතර, ඔවුන් වෙත වටිනා ත්‍යාග පාර්සල්ද පිරිනමන ලදී. මෙම අවස්ථාවට සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක, එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, සෙසුනිලයින් සහ ඔවුන්ගේ භාර්යාවන් විශාල පිරිසක් සහභාගී වූහ.

# විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවෙන් මහඟු සත්ක්‍රියාවක්



කුරුණෑගල මලියදේව ළමා නිවාස සහ වැඩිහිටි නිවාසයෙහි සිටින දූ දරුවන් හා වැඩිහිටියන් වෙනුවෙන් දිවා ආහාර වේලක් හා තේ පැන් සංග්‍රහයක් ලබාදීමට විජයබාහු පාබල රෙජිමේන්තු සේවා වනිතා ඒකකය මගින් කටයුතු කරන ලදී. පසුගිය ඔක්තෝබර් 01 දිනට යෙදුණු ලෝක ළමා දිනයට හා වැඩිහිටි දිනයට සමගාමීව සංවිධානය කෙරුණු මෙම කටයුත්තට එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි කුමුදු මානගේ මහත්මිය ප්‍රධාන ආරාධිත අමුත්තිය ලෙස සහභාගී වූවාය. තවද, විජයබාහු පාබල රෙජිමේන්තු අධිපතිද මෙම අවස්ථාවට එක්වූ අතර, එහිදී මෙම දරුවන්ගේ හා වැඩිහිටියන්ගේ රසාස්වාදය වෙනුවෙන් සංගීතමය වැඩසටහනක්ද සංවිධානය කර තිබුණි.

# විරු නිසට සේවා වනිතාවෙන් සෙවනක්



යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ මැදිහත්වීමෙන් ඊට අයත් ඒකකවල මූල්‍ය දායකත්වය ඇතිව එම රෙජිමේන්තුව යටතේ රාජකාරී කරනු ලබන සෙනින් පස් දෙනකු වෙනුවෙන් නව නිවාස පහක් ඉදිකරමින් පවතී. ඒ අතුරින් 1 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුවට අයත් සෙ/827115 කෝප්‍රල් සිල්වා එන්එස්එල් යන කොනොනි සඳහා අම්බලන්ගොඩ, කොස්ගොඩ ඉදිකළ නව නිවස ඉකුත් ඔක්තෝබර් 02 වන දින එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ධනුෂා වීරසූරිය මහත්මියගේ සුරතින් භාරදෙන ලදී. ඒ අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ ලේකම් ස්වර්ණමාලි ඒකනායක මහත්මිය ඇතුළු ජ්‍යේෂ්ඨ සාමාජිකාවන් රැසක්ද සහභාගී වූහ.

# සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවෙන් පුණ්‍යවන්ත කටයුත්තක්





මියගිය/ආබාධිත රණවිරුවන්ට සෙත්පතා අම්බලන්ගොඩ පිහිටි වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත උදේ, දහවල්, රාත්‍රී දානය පිරිනැමීමේ පුන්‍යවන්ත කටයුත්තක් සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව මගින් පසුගියදා සිදුකරන ලදී. එම අවස්ථාව සඳහා එම සේවා වනිතා සභාපතිනි මනෝරී සලේ මහත්මිය ඇතුළු ජ්‍යේෂ්ඨ සාමාජිකාවන් රැසක් සහභාගී වූහ. එහිදී කුමුදුනී මුනාලිෆ් මහත්මිය විසින් වැඩිහිටි මව් දෙමාපියන් සමග ධර්ම සාකච්ඡාවක් ද පැවැත්වූවාය.

# දිරිය අත්වැල වැඩසටහනෙන් සුබසාධන ව්‍යාපෘතීන් රැසක්





යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වනිගසේකර මහත්මියගේ අදහසකට අනුව 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය විසින් ප්‍රථම වරට සංවිධානය කරන ලද සේවා වනිතා "දිරිය අත්වැල"නමින් වූ සමාජ සුබසාධන වැඩසටහනක් යුද්ධ හමුදා සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශන ශාලාවේ දී 2022 සැප්තැම්බර් 17 වන දින පැවැත්විණ.

එහිදී, එම බලකායේ තෝරාගත් සෙසු නිලයින් සහ සිවිල් සේවක මහතුන් වෙත වියළි සලාක හා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය බෙදාදෙනු ලැබීය. තවද, එම බලකායට අයත් විවිධ වෘත්තීන්හි නියැළෙන සෙසුනිල හා සිවිල් සේවක මහතුන් උදෙසා පුහුණු වැඩමුළුවක් ද පවත්වා ඉන් නිපුණත්වය ලැබූ අයවළුන් හට NVQ සහතික පත්‍ර ප්‍රදානය කිරීමද එහිදී සිදුවිය. එසේම, එම අවස්ථාවට සහභාගී වූ සියලුදෙනාගේ අභිප්‍රේරණය උදෙසා දේශන මාලාවක්ද පැවැත්විණ. මෙම වැඩසටහන සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය අමාත්‍යාංශ අධ්‍යක්ෂක, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මානව හැකියා සංවර්ධන දේශක හා මානව හැකියා උපදේශිකා චන්දිමා රොද්‍රිගෝ යන මහත්ම මහත්මීන් සහ මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීන් සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# සිප්සතර හැදෑරීමට දිරියක්



ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව යටතේ රාජකාරියේ නියුතු නිලධාරීන් හා සෙසුනිලයින්ගේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හට වෛද්‍ය උපකරණ හා ව්‍යායාම් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් පසුගිය සැප්තැම්බර් 17 වන දින 1 ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා ඒකකයේදී පවත්වන ලදී. එම රෙජිමේන්තු සේවාවනිතා ශාඛාවේ සභාපතිනි නන්දනී සමරකෝන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති එම වැඩසටහනේදී එකී දරුවන් හට පා පැදි, පාසල් උපකරණ, පාසල් පාවහන් සහ පාසල් අභ්‍යාස පොත් ඇතුළු වටිනා ද්‍රව්‍යයද පිරිනැමිණි. මෙම අවස්ථාවට එම සේවාවනිතා ශාඛාවේ සාමාජිකාවන් මෙන්ම යුද්ධ හමුදා භාණ්ඩ අණසක ආඥාපති හා රෙජිමේන්තු බලකාධිපති මේජර් ජෙනරාල් එස්පීඒඅයිඑම්බී සමරකෝන් එච්ඩීඑම්සී එල්එස්සී ඇතුළු නිලධාරීන් පිරිසක්ද සහභාගී වූහ.

# පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් දරු දැරියන්ට ත්‍යාග





ලෝක ළමා දිනයට සමගාමීව මනෝවිද්‍යාත්මක වැඩමුළුවක් සහ දූදරුවන් සඳහා තෑගි බෙදාදීමේ උත්සවයක් 2022 ඔක්තෝබර් මස 02 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථාන දේශන ශාලාවේ දී පැවැත්විණ. එහි බලකාධිපති මේජර් ජෙනරාල් එම්ඩබ්ලිව්ටීසී මෙත්තානන්ද යූඑස්පී හා එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි රුවිනි මෙත්තානන්ද මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහන සඳහා සෙසු නිල දූදරුවන් 100 දෙනකු සහභාගී වූහ. දරුවන්ගේ ඉදිරි අනාගත අධ්‍යාපනය හා ජීවන අභිවෘද්ධියට රුකුලක් වන එම මනෝ විද්‍යාත්මක වැඩමුළුව වෛද්‍ය චමින්ද ද අල්විස් වීර සිරිවර්ධන මහතා විසින් මෙහෙය වන ලදී.

# ලෝක ළමා දිනයට කාන්තා බලකායෙන් වැඩසටහනක්





ලෝක ළමා දිනයට සමගාමීව "ලොරිස්" ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සිටින දරුවන් 24 දෙනකු වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් හා කෙටි ආහාර වේලක් ලබාදීමේ වැඩසටහනක් පසුගිය සැප්තැම්බර් 29 වන දින කාන්තා බලකා සේවා වනිතා ශාඛාව මගින් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අප්සරා දිල්හානි රණවක මහත්මියගේ ප්‍රධානත්වයෙන් සංවිධානය වූ අතර ඊට උප සභාපතිනි දිල්හාරා තිබ්බොටුගේ මහත්මිය හා 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා අණදෙන නිලධාරිනි මේජර් ජේආර්බීකේ ගල්හේන ඇතුළු පිරිසක් ද එක්වූහ. මෙම වැඩසටහන නවත් වර්ණවත් කිරීමට කාන්තා බලකාය මගින් විවිධ ප්‍රසංගයක් ද පවත්වා ත්‍යාග ලබා දීම ද සිදු කරන ලදී.

# "යුද සාහිත්‍යය" දේශනයක් ස්වේච්ඡා බලසේනා මූලස්ථානයේදී





යුද්ධ හමුදා මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් මෙහෙයවනු ලැබූ "යුද සාහිත්‍යය" පිළිබඳ දේශනයක් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් එම මූලස්ථානයේදී පසුගිය ඔක්තෝබර් 12 වන දින බදාදා පුහුණු දිනයට සමගාමීව පවත්වනු ලැබීය.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ යුද සාහිත්‍යයක් ගොඩනැංවීම වස් යුධ සමයේ සැබෑ සිදුවීම් පාදක කර ගනිමින් එම සිදුවීම් කෘතීන් බවට පරිවර්තනය කරමින් සාහිත්‍යකරණයේ නියැලෙන ලුතිනන් කර්නල් ඒජේජී සුජිත් චමින්ද විසින් මෙම දේශනය මෙහෙයවන ලදී. එහිදී පොදු සමාජයෙන් ගිලිහී යන යුද බිමේ අප්‍රකට තොරතුරු සිහිපත් කරමින්, මාතෘ භූමිය වෙනුවෙන් කාය දානය සහ ජීව දානය ලබාදුන් සැබෑ යුද විරුවන්ගේ කැපකිරීම් පිළිබඳ මතක ආවර්ජනය කෙරිණ.

එහිදී, ස්වේච්ඡා බලසේනා සේනාවිධායක පිරිස අමතමින් වසර තිහක් පුරා සැඟවී ඇති යුද සමයේ මතකයන් සහ සුවිශේෂී සිදුවීම් අනාගත පරපුර වෙත දැනගැනීම සඳහා මෙලෙස සාහිත්‍ය නිර්මාණ තුළින් හා දේශන මඟින් ගෙන ඒම පිළිබඳව ගත් උත්සාහය අගය කරමින්, 2009 වසරේ මානුෂීය මෙහෙයුමේ අවසන් අදියරේදී ඊට දායකත්වය දැක්වූ යුද්ධ හමුදා සාමාජිකයන්ගේ සැබෑ නිර්භීතභාවයද ප්‍රසංශාවට ලක් කළේය. මෙම දේශනය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම්කේටීආර් සිල්වා කේඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයන් 300 කට අධික පිරිසක් සහභාගී වූහ.


# "යුද සාහිත්‍යය" දේශනයක් මහනුවර උසස් බාලිකා විද්‍යාලයේදී







පල්ලේකැලේ පිහිටි 11 වන පාබල සේනාංකයේ සංවිධානයෙන් පැවති තවත් "යුද සාහිත්‍යය" දේශනයක් පසුගිය ඔක්තෝබර් 14 වන දින මහනුවර උසස් බාලිකා විද්‍යාලයීය ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. 11 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් පීඑස්කේ සංජීව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම දේශනයට එම විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති, සිසුවියන් ඇතුළු ආචාර්ය මණ්ඩලයේ පිරිසක්ද යුද්ධ හමුදා නිලධාරීන් හා සෙසුනිලයින් 300 ක් පමණ එක්වූහ.



# නන්දිකඩාල් ඉදිරි ආරක්ෂක වළල්ලේදී සිදුකරන ලද වීර ක්‍රියාව





**සෙ/462696 සැරයන් චන්ද්‍රසිරි බංඩාර ඩීඑම්එස් පීඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී**

විශේෂ බලකා රෙජිමේන්තුව

ගුණපාල, කැතරින් දෙපලගේ කුඩා නිවස දරු දැරියන් හත්දෙනකුගෙන් සමන්විත කුරුලු කැදැල්ලක් මෙන් විය. දරුවන් හත්දෙනකුගෙන් පහක්ම පිරිමි ළමෝ වූහ. "වැලේ ගෙඩි වැලට බරක් නොවේ" යන ගැමි කියමන සැබෑ කරමින් මෙම මව්පිය දෙදෙනා සිය දරුකැළ මහත් සෙනෙහසින් රැකබලා ගනු ලැබීය.

චන්ද්‍රසිරි බංඩාර උපත ලැබුවේ පවුලේ සයවන සාමාජිකයා ලෙස 1977 වසරේ බිබිල රජයේ රෝහලේදීය. මෙලොව උපත ලැබූ මෙම වාසනාවන්ත චූටි දරු පැටියාට දෙමාපියන් විසින් තබන ලද සම්පූර්ණ නම වනුයේ දිසානායක මුදියන්සේලාගේ සුගත් චන්ද්‍රසිරි බණ්ඩාර යන්නයි.

චන්ද්‍රසිරි බණ්ඩාරගේ අධ්‍යාපන ගමනට අඩිතාලම වැටුනේ 1982 වර්ෂයෙදීය. එහිදී, ඔහු මොණරාගල වැගම කණිටු විද්‍යාලට ඇතුලත් කෙරුණු අතර, පන්තියෙන් පන්තිය ඉහළ යනවිට ඔහුගේ හපන්කම්ද කෙමෙන් වැඩිවන්නට විය. පොත්පත්වල ඇලී ගැලී සිටිනවාට වඩා බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ඔහු වැඩි රුචියක් දක්වන්නට විය. පාසල් කවීක තරගවලදී ඉහලින්ම ඇසුනේ බංඩාරගේ හඬය. මියුරු හඩින් කවි ගී ගායනා කරන්නටද ඔහු තුළ වූයේ අපූරු හැකියාවකි. චිත්‍ර ශිල්පයට හා රංගනයටද දක්ෂතා පෑ බණ්ඩාර පාසලේ අනෙකුත් සිසුන් අතර කැපීපෙනෙන අයකු විය.

ක්‍රීඩා පිටියේදී ඔහු පෙරමුණේ සිටියේය. එහිදී, වොලිබෝල් ඔහුගේ ජනප්‍රියතම ක්‍රීඩාව විය. එනිසාම පාසලේ වොලිබෝල් කණ්ඩායමේ නායකත්වය ඔහුට හිමිවූයේ නිතරගයෙනි. බිබිල ගම්මානයේ අප්‍රකටව පැවති පාසලක් වූ වැගම විද්‍යාලයට ඔහු කීර්තියක් අත්කර දුන්නේ ප්‍රාදේශීය වොලිබෝල් තරග ඊසකින් ජය අත්කර දෙමිනි. විදුහල්පතිතුමා ප්‍රමුඛ ගුරු මණ්ඩලය බණ්ඩාර සිසුවාගේ උපන් හපන්කම් අගය කලේ ශිෂ්‍ය නායක තනතුරක්ද ඔහුට පිරිනමමිනි.

අධ්‍යාපන මාවතේ ඉදිරියට යමින්ම ඔහු ගමේ සමාජ සේවා කටයුතු සඳහාද විශාල නැඹුරුවක් දැක්විය. පන්ති කාමරය පමණක් නොව ක්‍රීඩා පිටියද ඔහුගේ නවාතැන විය. තුරුණු වියේ තිබිය යුතු දඟකාරකම් තරුණ චන්ද්‍රසිරි වෙත නොඅඩුව පිහිටා තිබිණි. මේ වනවිට කොටි ත්‍රස්තවාදීන්ගේ වියරු ඝාතන, කෲරත්වය, ප්‍රචණ්ඩත්වය හා විනාශයන් උග්‍රවෙමින් තිබෙනු ඔහුට දක්නට ලැබුණි. රූපවාහිනියෙන් ගුවන් විදුලියෙන් අසන දකින දේ තරුණ චන්ද්‍රසිරිට දරාගත නොහැකි විය.

තාරුණ්‍යයේ සිතුම් පැතුම්වලින් සිත පුරවා සිටි ඔහුට දේශප්‍රේමීත්වය ළය පුරා කකියන්නට විය. පාසලේ ආදි ශිෂ්‍ය සංගමය, ගමේ ප්‍රජා සංවර්ධන සමිති ආදියේ නායකත්වයෙන් ඔද්වැඩී සිටි මේ තරුණයාගේ එකම ඉලක්කය වූයේ හැකි ඉක්මනින් ආරක්‍ෂක සේවයට බැඳී රට දෙකඩ කිරීමට වෙර දරණ කොටි ත්‍රස්තවාදීන්ට එරෙහිව සටන් කිරීමයි. සිය දෑ හිතකාමී හැඟීම් මූර්තිමත් කරමින් 1996 වසරේ චන්ද්‍රසිරි ආධුණික පොලිස් භටයකු වශයෙන් පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුනි. පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුවකින් පසුව ඔහු සිය ගම ආසන්නයේම බිබිල පොලිස් ස්ථානයට අනුයුක්ත විය. එහි ඔහු වසරක පමණ කාලයක් සේවය කළේය.

නමුත්, ත්‍රස්තවාදීන් හා සටන් කිරීමට ඇති ආශාව පොලිසිය තුළ රැඳෙමින් ඉටුකර ගත නොහැකි බව ඔහුට හැඟිණි. රටට

විත කරන රුදුරු ත්‍රස්තවාදීන් සමඟ මුහුණට මුහුණලා සටන් කරනා විරුවකු වීමට නම් යුද්ධ හමුදාවට ප්‍රවේශ විය යුතු යැයි ඔහුගේ යටිහිත හඬගා කියන්නට විය. කොටි ත්‍රස්තයන්ගේ කෲර මිනිස් ඝාතන හා විනාශකාරී ක්‍රියා එන්න එන්නම උග්‍රවීමත් සමඟම ඔහුගේ සිතේ හඬගෑමද ප්‍රබල විය. කෙසේ හෝ තර්ක විතර්ක මැද වැඩිහිටියන් සිය මතයට නම්මාගත් චන්ද්‍රසිරි 1997 ජුනි මස 15 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා අත්වැල් බැඳගත්තේ සිය ජීවිතයේ ලොකුම සිහිනය සැබෑකර ගනිමිනි.

ප්‍රථමයෙන් ඔහු තම යුද්ධ හමුදා දිවියට පියවර තබමින් ආධුණික සෙබළකු වශයෙන් විශේෂ බලකා පුහුණු පාසලෙන් ආධුණික පුහුණු පාඨමාලා අංක 01 සඳහා තෙමසක පුහුණු පාඨමාලාවක් හැදෑරීමට සිදුවිය. මෙසේ යුද්ධ හමුදා දිවියේ පළමු පිම්ම සාර්ථක කරගත් චන්ද්‍රසිරි බංඩාරයන් ඉමහත් කැපවීමකින් දෙවන පියවර සඳහා සූදානම් විය. ඔහුගේ කැපවීම හා දක්ෂතා අගය කළ පුහුණු පාසලේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා උපදේශකවරු අතිශය අභියෝගාත්මක වූත් දුෂ්කරවූත් විශේෂ බලකා පාඨමාලා අංක 22 වෙත චන්ද්‍රසිරි යොමුකළහ. එහිදී, ඉතා දුෂ්කර පාඨමාලාවක් නිමාකරමින් නිලධාරීන් 12 ක් හා සෙසු නිලයින් 578 ක්ද විසිරගිය අතර, පාඨමාලාවේ සිය දස්කම් හේතුවෙන් සුවිශේෂී හමුදා කණ්ඩායමකට එක්වීමට වරම් ලද චන්ද්‍රසිරි බණ්ඩාර 1998 මාර්තු 08 වන දින දෙවන රෙජිමේන්තු විශේෂ බලකායට එක්විය. අනතුරුව එහි "බී" බළගණයේ සාමාජිකයකු වශයෙන් බැඳී තමාගේ සිත තුළ කැකෑරෙමින් තිබූ දේශානුරාගී හැඟීම උරගා බැලීමට අවැසි මෙහෙයුම්වලට දායකවීමේ අවස්ථාව ඔහුට උදාවිණි.

මේ අතරතුර ඔහුගේ ජීවිතයේ අලුත් පිටුවක් පෙරළෙන්නේ මංගලිකා කුමාරි හමුවීමත් සමගය. මංගලිකාගේ ගතිගුණ හා සිතුම් පැතුම් චන්ද්‍රසිරිගේ සිත් ගත්තේය. ඔහු රණවිරුවකු වීම පිළිබඳව මංගලිකා එකසිතින්ම සතුටු වූවාය. තම දියණියන් හමුදා සෙබළුන්ට විවාහ කරදීමට එකල ඇතැම් වැඩිහිටියන් පසුබට වුවද හේරත් බංඩා යුවල තම දියණියගේ තේරීම එකහෙලා අනුමත කළහ. ඒ අනුව 2001 අප්‍රේල් 13 වන දින මංගලිකා චන්ද්‍රසිරි යුවල සුබ නැකතින් විවාහ ගිවිස ගත්හ. අනතුරුව චාම් විවාහ උත්සවයකින් පසුව නව යුවල බිබිලේ පිහිටි චන්ද්‍රසිරි බණ්ඩාගේ නිවසේ පදිංචි විය. විවාහ දිවියක උතුම්ම ඵලය වන දරු සම්පතක් ලබාගැනීමේ වාසනාව ද නිසි කල්හි මංගලිකා චන්ද්‍රසිරි දෙපළට හිමිවිය. 2003 මැයි මස 05 වන දින සූර්යයා උදාවූයේ ඔවුන්ගේ එම පැතුම මල්ඵල ගන්වමිනි. එදා මංගලිකා තම සුරතල් දියණියට සශිකලා සිතුම්ණි යැයි නම් තැබූහ. එදා පටන් ඔවුන්ගේ පවුල කිරිකැටි දියණියගේ සුවඳින් පිරී ඉතිරී ගියේය.

තම දියණිය පාසල් යන වයසට පැමිණීමත් සමඟ ඇය පාසලකට ඇතුළත්කර හැකි උපරිමයෙන් අධ්‍යාපනය ලබාදිය යුතු යැයි තීරණය කළ චන්ද්‍රසිරි තම ගම් පියසෙන් සමුගෙන කොළඹට සේන්දු විය. යුහුසුලුව සියලු කටයුතු සංවිධානය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2009 ජනවාරි 26 වනදා සිතුම්ණි දියණිය ගල්කිස්ස උසස් බාලිකා විද්‍යාලයට ඇතුළත් කරගනු ලැබිය. දියණිය පාසලට ඇතුළත් කිරීමේ කටයුතු සඳහා නිවාඩු ලබා සිටි චන්ද්‍රසිරි බංඩාර රාජකාරි සඳහා නැවත කඳවුරට වාර්තා කළේ 2009 ජනවාරි 27 වන දිනයි.

විශේෂ බලකා පුහුණුවේදී ලද පන්නරය හේතුවෙන් ඔහු එල්ටීටීඊ ත්‍රස්තයන්ට එරෙහිව සිය කණ්ඩායමට පැවරුනු මෙහෙයුම්වලට උපරිම දායකත්වයක් ලබාදුන්නේය. එකල ක්‍රියාත්මක වූ ප්‍රකට "ජයසිකුරු" මෙහෙයුමේදී මෙන්ම ඉනික්බිති දියත් වූ "රණගොස", "අග්නිබිල" වැනි ක්‍රියාන්විතයන්වලදීද චන්ද්‍රසිරි බංඩාර සිය රණකාමීත්වය විදහා පෑවේය. විශේෂ බලකා සෙබළුන්ට



විවාහ ජීවිතයට ඇතුළත් වී

පැවරී තිබුණු තවත් සුවිශේෂී කාර්යභාරයක් වූ කුඩා කණ්ඩායම් ප්‍රහාරවලදීද ඔහුගේ දක්ෂතා ඉස්මතුව පෙණුනි. ක්‍රියාන්විතයන් අතරතුරදී ඔහු විසින් 2002 වසරේදී දොඹගොඩ කඳවුරේ පැවති වෙඩි ද්‍රව්‍ය කාර්මික පාඨමාලාව හැදෑරූ අතර, පසුව ප්‍රගුණ වෙඩික්කරු පාඨමාලාවද සාර්ථකව නිමකරන ලදී. එමෙන්ම ඔහු "කොමිෂන් නොලත් නිලධාරී නායකත්ව පාඨමාලාව", "කණිෂ්ඨ උපදේශක පාඨමාලාව", "කාලතුවක්කු නිරීක්ෂණ පාඨමාලාව", "සුළු යාන්ත්‍රික නායකත්ව පාඨමාලාව" සහ "මූලික පැරෂුට් පාඨමාලාව" ආදිය හැදෑරීම මේ අභීත සෙබළාගේ උද්යෝගය හා කැපකිරීම පිළිබඳ කදිම සාක්ෂි වේ. මොහුගේ මෙම අපූරු රණශූරත්වය දුටු එවකට සිටි දෙවන විශේෂ බලකායේ අණදෙන නිලධාරී මේජර් තුෂාර මහලේකම් විසින් ඔහුගේ යුධ අත්දැකීම තුළින් විශිෂ්ටයින් බිහිකරලීම සඳහා විශේෂ බලකා පුහුණු පාසලේ උපදේශකයකු ලෙස පත්කරන ලදී. කුඩා කල සිටම දේශානුරාගයෙන් මදවැඩි විශේෂ බලකායෙන් පන්නරය ලැබූ චන්ද්‍රසිරිට පුහුණු පාසලේ ජීවිතයට වඩා තම හදවත නිතර වැළඳගත් යුදබිමට යාමේ අවශ්‍යතාවය වඩ වඩාත් දැනිණ. විශේෂ බලකා පුහුණු පාසලෙන් නික්ම ආ සැනින් දෙවන විශේෂ බලකා මූලස්ථානයේදී එවකට බළගණයේ බලගණාධිපති වශයෙන් කටයුතු කළ මේජර් ඉන්දික ලියනගේ හමු වූ සැරයන් චන්ද්‍රසිරි ඔහුට නැවතත් බළගණයට පැමිණීමට අවශ්‍ය බව දන්වා සිටින ලදී. වික දිනකින් ඔහුගේ ඉල්ලීම සඵල කරමින් චන්ද්‍රසිරි බංඩාර "බී" බළගණය සමඟ නැවත ක්‍රියාන්විත රාජකාරියට අනුබද්ධ කෙරුණි.

මෙ වනවිට ශ්‍රී ලංකා හමුදාව මහත් අභිමානයෙන් යුතුව ත්‍රස්තවාදයෙන් මාතෘ භූමිය මුදවාගැනීමේ අවසන් සටනට අවතීර්ණ වී සිටියේය. දෙවන විශේෂ බලකායේ "බී" බළගණය ඒ වනවිට හදිසි ක්‍රියාන්විත අවශ්‍යතා සඳහා බළගණ පුනරීක්ෂණ පාඨමාලාවකට මඩු ප්‍රදේශයේ සහභාගී වෙමින් සිටියේය. කෙසේ හෝ ත්‍රස්තවාදීන් ඒ අතරතුර නන්දිකඩාල් යුද්ධ හමුදා ඉදිරි ආරක්ෂක වළල්ල බිඳ ඔවුන්ගෙන් සැලකිය යුතු පිරිසක් හමුදා පාලන ප්‍රදේශයට ඇතුළුව හමුදාවන්ට පහර දුන්හ. එහිදී, ත්‍රස්තවාදීන් ඉදිරියෙන් මෙන්ම පිටුපසින්ද පහරදීමෙන් සටන ව්‍යාකූල විය. සැපයුම් මාර්ග අවහිර කරන ලද අතර, ත්‍රස්තවාදී ප්‍රහාරයන්ගෙන් තුවාල වූ හා මරුමුවට පත් වූ හමුදා සාමාජිකයින් සැලකිය යුතු සංඛ්‍යාවක් තැන

තැන වැටී සිටින ලදී. තත්ත්වය ඉක්මණින් පාලනය නොකළහොත් මහත් ව්‍යසනයක් වීමට ඉඩ ඇති බව යුද භූමියේ සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්හට අවබෝධ විය. අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ගත් ත්‍රස්තවාදීන් හැකිතාක් තම සාමාජිකයින් හමුදා පාලනයට නතු වූ ප්‍රදේශ තුළට යොමුකර ප්‍රහාර එල්ල කරමින් තවදුරටත් හමුදාව අවුල්සහගත තත්ත්වයකට පත් කළේය. මෙම ප්‍රහාර මැඩපවත්වා තත්වය පාලනය කිරීම සඳහා දෙවන විශේෂ බලකාය යෙදවූ අතර, "බී" බලගණයේ පුහුණුවීම් නවතා ඔවුන්ද ගුවන් මගින් සටන් බිමට යොදවනු ලැබූහ. විශේෂ බලකා භටපිරිස් ත්‍රස්තවාදීන්ට එරෙහිව ප්‍රතිප්‍රහාර අරඹත්ම දරුණු සටන් ඇවිලිගිය අතර දෙපාර්ශ්වයටම බලවත් හානි සිදුවිය. යුද්ධ හමුදාව ප්‍රදේශයෙන් පලවා හැරීම සඳහා ත්‍රස්තවාදීන් දියත් කරන ලද අවසන් ප්‍රයත්නය මෙය බව සනාථ කරමින් ඔවුන්ගේ ප්‍රහාරක බළඇණියක් වන කළු කොටි සමග මරාගෙන මැරෙන සාමාජිකයින්ද යොදවා ඇති බව ගුවන් විදුලි පණිවිඩ වෙත සවන්දීමෙන් තහවුරු විය. මේ අවස්ථාවේදී වෙඩි නොවදින තහඩු ආවරණ සහිත කැබ් රථයකට බෝම්බ පුරවාගත් ත්‍රස්තවාදීන් යුද්ධ හමුදා ආරක්ෂක වළල්ල බිඳගෙන සිදුකිරීමට ගිය විනාශය වැළකුණේ රණවිරුවන්ගේ උපරිම කැපවීම මතය. දින දෙකක් දෙපාර්ශ්වය අතර දිවා රෑ නොතකා දරුණු සටනේ ඇවලිණි. තුවාල ලැබූ හමුදා සාමාජිකයින් හට ප්‍රතිකාර ලබාදී ඔවුන් නියමිත ස්ථාන කරා යොමුකරවීමද සටන අතරවාරයේ විශේෂ බලකා සාමාජිකයින් විසින් සිදුකළ යුතුව තිබිණි. ත්‍රස්තවාදීන් ඔවුන් සතු සියලුම ශක්තිමත් හා බර අවිද යොදා විශේෂ බලකා භටපිරිස් හට දැඩි ප්‍රහාර එල්ල කළේය.

විසිරී සිටි පාබල භටපිරිස් තම නායකත්වයට නතුකරගත් විශේෂ බලකා සාමාජිකයෝ ඔවුන් සමග එක්වෙමින් ත්‍රස්තවාදීන්ට එල්ල කළ ප්‍රහාරවලින් සැලකිය යුතු ත්‍රස්තවාදීන් ප්‍රමාණයක් මරුමුවට පත් කළහ. මේ ප්‍රහාරය එල්ටීටීඊ නායකයාගේ සෘජු නායකත්වයෙන් සිදුවන බව හමුදා බුද්ධි අංශ මගින් සනාථ විය. මෙම බැරෑරුම් අවස්ථාව මනාව තේරුම්ගත් විශේෂ බලකා නායකත්වය තම සගයන්ට පැවසුවේ "මෙයින් පසුපසට යාමක් නැත. මේ සටනේ අවසන් අවස්ථාවය. අප මෙය අතහැරියහොත් වාසිය ත්‍රස්තවාදීන්ටයි". විශේෂ බලකා සාමාජිකයින්ද "තමා මියගියද අපගේ ක්‍රියාවෙන් ලක්වාසීන් හට සාමය උදාවෙයි" යන්න සිතෙහි දරාගෙන සතුරා සමග නිර්භයව සටන් කළහ. බියකරු රාත්‍රියක් උදාවිය. ත්‍රස්තවාදීහු උපරිම ශක්තිය යොදා විශේෂ බලකාය රැඳී සිටි ස්ථානය වෙත දරුණු ප්‍රහාර එල්ල කළහ. පසුදා පහන් වනවිට ත්‍රස්තවාදී ප්‍රහාර එකොළහකට මුහුණදීමට විශේෂ බලකා සාමාජිකයින් හට සිදුවිය. "එස්එෆ් එක ඇවිල්ල ඉන්නේ, ගහල තල්ලු කරන්න බෑ. වෙන මොනවහරි කරන්න". මේ භූමියේ සටන් වැදී ත්‍රස්තවාදීන් විසින් තම නායකත්වය අමතා කරන ලද ඉල්ලීමය. යුද්ධ හමුදා බුද්ධි අංශ විසින් මෙම එල්ටීටීඊ සංවාදයන්ට සවන් දීමෙන් ලබාගන්නා ලද තොරතුරු විශේෂ බලකා ප්‍රමුඛ භටපිරිස් වෙත ඔවුන් දිරිමත් කිරීම සඳහා ලබාදෙන ලදී.

දිනය 2009 පෙරවාරි 03 වනදාය. රටෙහි පොදු ජනතාව පසුදිනට එළඹෙන 61 වන නිදහස් සැමරුමට පෙළගැසී සිටියහ. ඔවුන් කිසිවකු හට මේ වනවිට උතුරෙහි ඇති සටනෙහි බරෑරුම්භාවය නොදැනෙන්නට ඇත. එහෙත් හමුදා නායකයන්ට නම් එහි බැරෑරුම් බව කදිමට වැටහුණි. විකල්ප නොමැතිව සටන් කරමින් සිටි ත්‍රස්තවාදීහු කෙසේ හෝ හමුදාව පිටුපසට තල්ලුකරලීමට උත්සාහ කළේ හමුදා පාලන ප්‍රදේශ තුළට ඇතුල්වී සිටි ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාර තීව්‍ර කරමිනි. යුද්ධ හමුදා තුවාලකරුවන් රැගෙන එන වාහනවලටද රැකසිටිමින් පහරදෙන ත්‍රස්තවාදීන් පැවති තත්ත්වය තව තවත් ව්‍යාකූල කළහ.

ත්‍රස්තවාදී නායකත්වය මරාගෙන මැරෙන ප්‍රහාර එල්ලකර හෝ විශේෂ බලකා භටපිරිස් විනාශකර ප්‍රදේශය අල්ලා ගන්නා ලෙස පහළ නායකත්වයට නියෝග කළහ. මාරගෙන මැරෙන ප්‍රහාරයක් දියත් කිරීමට ත්‍රස්තවාදීන් සැලසුම් කරන බව හමුදා බුද්ධි අංශ මගින් විශේෂ බලකායට දැන්විය. භූමිය පිලිබඳ මනා අවබෝධයෙන් සිටි විශේෂ බලකාය යුහුසුලුව එම ප්‍රහාරයන් හට මුහුණදීම සඳහා ඇවැසි ක්‍රියාමාර්ග ගනු ලැබූහ.

දෙවන විශේෂ බලකායේ "බී" බලගණයද මේ වනවිට පුදුකුඩිඉරිප්පු - මුල්ලියාවේලි මාර්ගයේ ත්‍රස්තවාදීන් සමග දරුණු සටනක නියැලෙමින් සිටියේය. නිලධාරීන් ඇතුළුව සැලකිය යුතු සංඛ්‍යාවක් තුවාල ලබාසිටි අතර, පාබල ඒකකයන්හි භටපිරිස්ද විශේෂ බලකා භටපිරිස් සමග එක්ව ත්‍රස්තවාදීන්ට ප්‍රහාර එල්ල කරමින් සිටි විශේෂ බලකා භටපිරිස් රැඳී සිටින ස්ථානයට ඔවුන්ගේ මරාගෙන මැරෙන ප්‍රහාර එල්ල වියහැකි ස්ථානය බව වටහාගත් දෙවන විශේෂ බලකා අණදෙන නිලධාරී අතිරේක භටපිරිස් යොදවා එම ස්ථානය සවිමත් කරන ලදී. සැරයන් චන්ද්‍රසිරි බංඩාර හතරදෙනාගෙන් යුත් ඛණ්ඩයක සැරයන් සුරේන්ද්‍රගේ නායකත්වය යටතේ එම ස්ථානයේ ත්‍රස්තවාදීන් හා දරුණු සටනක යෙදී සිටියේය. දින හතරක් පුරාවට ඔවුන්ද වැලිකොට්ටවලින් ආවරණ සකසාගෙන ත්‍රස්තවාදීන් හා සටන් කළ අතර, එම ස්ථානය ත්‍රස්තවාදීන් විසින් කඩාබිඳගෙන ආරක්ෂක වළල්ල තුළට ඇතුල්වීමට උත්සහ දරණ ප්‍රධාන ස්ථානයක් ලෙස හඳුනාගෙන තිබිණි. වේලාව එදින සවස තුනට පමණ විය. අපේක්ෂා කළ අයුරින් දරුණු ත්‍රස්තවාදී ප්‍රහාරයන් මධ්‍යයේ පුපුරණ ද්‍රව්‍ය කිලෝ 250 කට වැඩි ප්‍රමාණයක් රැගත් වාහනයක් සැරයන් සුරේන්ද්‍ර විසින් මග අහුරා සිටි පුදුකුඩිඉරිප්පු - මුල්ලයාවේලි මාර්ගයේ ආරක්ෂක වළල්ල වෙත ඇදීඑනු නිරීක්ෂණය කළේය. මරාගෙන මැරෙන වාහනයට ප්‍රහාර එල්ල කිරීමට නියමිතව තිබුණේ චන්ද්‍රසිරි බංඩාරගේ සහයකයා වන ලාන්ස් කෝප්‍රල් තුෂාරටය. ඒ සඳහා ඔවුන් කල්වේලා ඇතිව ආර්පීජී අවි සූදානම්කර තිබිණි. චන්ද්‍රසිරි බංඩාර යුද භූමියේ ලබාගන්නා ලද අත්දැකීම් තුළින් පරිපූර්ණ වූවෙකි. ත්‍රස්තවාදීන්ගේ මෙම ප්‍රහාරය සාර්ථක වුවහොත් හමුදාවේ සියලු අභිප්‍රායයන් අසාර්ථක වන බව හෙතෙම හොඳින් දැන සිටි අතර, කොතරම් ප්‍රහාර එල්ල වුවද තමාගේ වටපිටාවේ සිටින හමුදා සාමාජිකයින් තුවාල වුවද, ඔහු සිතින් හා කයින් මනා සංයමයකින් යුතුව සටන් කරමින් සිටියේය. නිරතුරුව ත්‍රස්තවාදීන්ගේ මරාගෙන මැරෙන ප්‍රහාර පිළිබඳ ඔහුගේ සිත ක්‍රියාකරමින් සිටියේය. ත්‍රස්තවාදීන්ගේ මාරගෙන මැරෙන වාහනය දුටු වහාම දෙවතාවක් නොසිතා දරුණු ත්‍රස්තවාදී ප්‍රහාර මධ්‍යයේ තම සගයාගේ සුරතේ තිබූ ආර්පීජී අවිය තම සුරතට ගෙන මාර්ගයට පැන සතුරු වාහනය වෙත ප්‍රහාරයක් එල්ල කළේය. අවාසනාවට අවිය ක්‍රියාත්මක නොවීය. චන්ද්‍රසිරි බංඩාර ක්ෂණිකව ආර්පීජී බෝම්බයක් අවියට සවිකළේය. වාහනය වේගයෙන් ඉදිරියට ඇදී එයි. කළයුතු අන් කිසිවක් නොමැත. ප්‍රහාරය එල්ල කළ යුතුමය. තමා එක්දරු පියෙක් බවත්, මෙම ප්‍රහාරයෙන් තමාද මියයන බවත්, චන්ද්‍රසිරි හොඳින් දැන සිටියේය. අවිය ක්‍රියාත්මක විය. චන්ද්‍රසිරි බංඩාරගේ ඉලක්කය නිවැරදි විය. හෙණ හඬ නංවමින් ත්‍රස්තවාදී පුපුරණ ද්‍රව්‍ය රැගත් කැබ් රථය ප්‍රදේශයම විනාශ කරමින් කුඩුපට්ටම් වී ගියේය. මෙහිදී, චන්ද්‍රසිරි බංඩාරගේ අවසන් සුසුම්පොද වාතලයට මුසුවන්නේ මව්බිම වෙනුවෙන් තම වගකීම ඉටුකළ සදා නොමියෙන විරුවන් අතරට තම නාමයද එක්කිරීමෙනි. ත්‍රස්තවාදීන්ගේ අවසන් ප්‍රයත්නය චන්ද්‍රසිරි බංඩාරගේ ජීවිතය කැපකිරීමෙන් ව්‍යර්ථ විය. එහෙයින් අද සිරිලක්

දෙරන මත සාමය ස්ථාපිත වී ඇත.

ගැමුණු, පැරකුම් හා ගජබා වැනි යුද විරුවන්ගේ අතීත උරුමයන් පෙරට රැගෙන යමින් සැරයන් චන්ද්‍රසිරි නම් උදාර රණවිරුවා සිදුකළා වූ මෙම කැපවීම එවකට "බී" බලගණයේ බලගණාධිපති ලෙස කටයුතු කළ මේජර් ඉන්දික ලියනගේ මෙසේ ප්‍රකාශ කළේය. "සැරයන් චන්ද්‍රසිරි බලගණයේ සිටි ක්‍රියාකාරීම සාමාජිකයෙකි. ඔහු නිතර අභියෝගයන්ට අභියෝගයක් වූ සුවිශේෂී රණකාමියෙක් වගේම සතුරු ඉලක්ක විනාශ කිරීමේ රුසියෙකි. එමෙන්ම, ඔහු විශේෂ බලකා පවුලේ විශිෂ්ට පුත්‍රයෙක්".

පුපුරණ ද්‍රව්‍ය පුරවාගත් සතුරු මරාගෙන මැරෙන රිය පුපුරවා හරිමින් සමස්ත ජාතියේම ස්වාධීනත්වය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් තම ජීවිතයටද, ආත්මාරක්ෂාවටද සිදුවිය හැකි අවදානම නොතකා තම සෙබළ සහෝදරයන්ගේ ජීවිත ආරක්ෂාකර ගැනීම උදෙසාත් තම බලකායේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහාත් තම දිවි කුසුම පුදා ඉටුකළ මෙම උදාර මෙහෙවරට ගෞරවයක් වශයෙන් සැරයන් චන්ද්‍රසිරි බංඩාර රණවිරුවා "පරමවීර විභූෂණයෙන්" පිදුම් ලැබුවේය.

එම උත්තරීතර වූ පරම වීර විභූෂණය 65 වන නිදහස් දින රාජ්‍ය උත්සවයට සමගාමීව 2013 වර්ෂයේ ජූලි මස 15 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති සහ සන්නද්ධ සේනාවන්හි සේනාධිනායක ධූරිත අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් අරලියගහ මන්දිරයේදී මෙම අභීත රණවිරුවාගේ ආදරණීය බිරිඳ වන මංගලිකා කුමාරි රණසිංහ මහත්මිය වෙත ප්‍රදානය කරන ලදී.

සටහන -:
*"උත්තමාචාරය" ග්‍රන්ථය ඇසුරිනි...*

# ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දකුණු සුඩානයේදී ලෝක ළමා දිනය සමරයි



ලෝක ළමා දිනයට සමගාමීව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දිවයින පුරා විවිධ ස්ථානවලදී සැමරුම් සංවිධානය කර තිබුණි. මේ අතර යුද්ධ හමුදාධිපති ගේ උපදෙස් පරිදි දකුණු සුඩානයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාම සාධක මෙහෙයුම්වල නිරතව සිටින යුද්ධ හමුදා භට පිරිස් විසින්ද ලෝක ළමා දින සැමරුම් උත්සවයක් පවත්වන ලදී.



දකුණු සුඩානයේ බෝර් හි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් පවත්වාගෙන යනු ලබන දෙවැනි මට්ටමේ රෝහලේ සේවය කරනු ලබන යුද්ධ හමුදා භට පිරිස් මෙම සැමරුම් වැඩසටහන සංවිධානය කරනු ලැබූහ. එහි සේවයේ යෙදී සිටින ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ අටවන භට ඛණ්ඩය ඊට දායකත්වය දැක්විය. මෙම විශේෂ ළමා දින වැඩසටහනේදී අවතැන් කඳවුරුවල රැඳී සිටින ළමුන්ට ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් පාසල් උපකරණ ප්‍රදානයක්ද සිදුකරන ලදී.

එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී යටතේ දකුණු සුඩානයේ සාම සාධක මෙහෙයුමේ සිවිල් - හමුදා සම්බන්ධීකරණ අංශයේ සහයෝගය ඇතිව බෝර් හි පිහිටි දෙවැනි මට්ටමේ රෝහලේ අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම්එම් නිෆ්ලාර් විසින් මෙම වැඩසටහන සංවිධානය කර තිබුණි.



# සියදිවි නසා ගැනීම වැළැක්වීම




සටහන

මේජර් ජෙනරාල් කීර්ති කෝට්ටවත්ත (විශ්‍රාමික)


සත්ව විශේෂයන් අතර මනසින් උසස් මිනිසා සියදිවි නසා ගන්නේ ඇයි? හාස්‍යජනක ලෙස, අපගේ විශේෂ නාමය "හෝමෝසේපියන්ස්"ය. ලතින් භාෂාවෙන් ඉන් අදහස් වන්නේ "ප්‍රඥාවන්ත මිනිසා" යන්නයි. මිනිස් මොළයෙහි දියුණු සංයුතිය අනුව නිවැරදි තීරණ ගැනීම, උපද්‍රවයකින් ආරක්ෂා වීම මෙන්ම සියදිවි නසාගැනීමේ අභිප්‍රායන් පවා අභිබවමින් ක්‍රියා කිරීමේ ස්වයං ආරක්ෂණ යාන්ත්‍රණ ක්‍රමයක් මිනිසා තුළ ක්‍රියාවට නැංවේ. මේ සියලු තත්වයන් තිබියදී මිනිසුන් සියදිවි නසාගැනීමට පෙලඹේ.

මිනිසකුට සියදිවි නසාගැනීමට සිත් වන වඩාත් සුලබම හේතුව වන්නේ තවදුරටත් ජීවත්වීමේ පලක් නොමැති බව සිතා ඇති වන කලකිරීමයි. ඕනෑම පුද්ගලයකු හට ජීවිතයේ කොයි මොහොතක හෝ සියදිවි නසා ගැනීමේ සිතක් පහළ වීම අසාමාන්‍ය දෙයක් නොවේ. සෑම මනුෂ්‍යයෙක්ම, සිය ජීවිතයේ යම් අවස්ථාවක එම තත්ත්වය අත්විඳ ඇත.

මනෝ උපදේශකයන්, නායකයන් හෝ පිරිස් පාලනයෙහි යෙදෙන්නන් ලෙස, එවැනි සිතුවිලි ඇති පුද්ගලයකු තක්සේරු කිරීමේදී, එවැනි සිතුවිලි කෙතරම් භයානකද යන්න තීරණය කිරීමට අපි යම් මාර්ගෝපදේශ භාවිතා කරමු. සාමාන්‍යයෙන් එවැනි සිතුවිල්ලක් සාමාන්‍ය සිතුවිලි ලෙස ආරම්භ වී ක්‍රමයෙන් උත්සන්න වේ. මුලදී, ආතතියෙන් පෙළෙන පුද්ගලයින්ට නින්දේදී මියයාම සතුටක් විය හැකි අතර, ඊළඟ මොහොතේ අනතුරකින් හෝ වෙනත් ස්වාභාවික හේතූන් මත මියයාම වඩාත් හොඳ යැයි ඔවුන් සිතනු ඇත. තුන්වන අදියරේදී පුද්ගලයින් තමන්ගේම අවසානයක් ගැන කල්පනා කරයි. නමුත්, එය කරන්නේ කෙසේද යන්න පිළිබඳ පැහැදිලි අදහසක් ඔවුන් තුළ නැත. සිව්වන අදියරේදී සියදිවි නසාගැනීම් සඳහා විවිධ අදහස් සලකා බලා අවසන් අදියරේදී මාරාන්තික බෙහෙත් වර්ග හෝ අවි යොදාගනිමින් සුදුසු වේලාවක් තීරණය කර සැලසුම් ආරම්භ කිරීමට කටයුතු කරනු ඇත. අන්තිම කැමති පත්‍රයක් ලිවීම හෝ ඔවුන්ගේ දේපළ ලබාදීම වැනි අවසාන ක්‍රියා ද ඔවුන් කළ හැකිය. මෙම අවසාන අදියර වඩාත් භයානක වන අතර, නියමිත වේලාවට හඳුනා නොගතහොත්, සියදිවි නසාගැනීමේ අවසාන අදියර ක්‍රියාවට නංවනු ඇත. එවැනි තත්ත්වයන් නිවැරදිව හඳුනා ගැනීම මනෝ උපදේශකයන්ට, නායකයින්ට මෙන්ම පිරිස් පාලකයන්ටද අතිශයින් වැදගත් කාර්යයකි. එහෙත් එම තත්ත්වයන් හඳුනාගැනීම පහසු කාර්යයක් නොවේ. ඊට හේතුව වන්නේ රෝගීන්, ප්‍රතිකාර/උපදේශනයන් සඳහා ඇතුළතින් ආශා කරන නමුත් බාහිරව, සමහර විට සමාජ අපකීර්තිය සහ ලැජ්ජාව නිසා, ප්‍රතිකාර හෝ උපදේශනයන් උපක්‍රමශීලීව මගහැරීමයි.

සියදිවි නසා ගැනීමට තුඩු දිය හැකි සුලබම මනෝ ව්‍යාධිය වන්නේ ඔහුට හෝ ඇයට කිසි වටිනාකමක් නැති සහ බලාපොරොත්තු රහිත බවක් දැනෙන මානසික අවපීඩනයයි. මානසික අවපීඩනයෙන් පෙළෙන පුද්ගලයින්ට ආත්ම අභිමානය බරපතල ලෙස අහිමි වේ. සියදිවි නසා ගැනීමට තැත් කරන පුද්ගලයකුට උපකාර කරන වෘත්තිකයකුගේ වැදගත් කාර්යයක් නම්, පුද්ගලයකුගේ හීන වී ඇති ආත්ම අභිමානය වර්ධනය කරගැනීමට සහය වීම සහ තත්වය කෙතරම් නරක යැයි පෙනුනද, ඔහුට හෝ ඇයට මිනිසකු ලෙස වටිනාකමක් ඇති බව ඒත්තුගැන්වීමයි.

වෙනත් මානසික සහ ඒ ආශ්‍රිත ගැටලු ද සියදිවි නසාගැනීමේ අවදානම වැඩි කරයි. වඩාත් සුලබ දුර්වල මානසික තත්ත්වය වන්නේ පොරුෂ ආබාධ, මත්පැන් හෝ මත්ද්‍රව්‍ය සඳහා වන ඇබ්බැහිය සහ භින්නෝන්මාදය වැනි මානසික රෝගයි. මෙම තත්වයන් ඇති විය හැකි සහ සියදිවි නසා ගැනීමට සිතන පුද්ගලයින් කළමනාකරණය කිරීමේ පළමු කාර්යය වනුයේ ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමයි. ප්‍රතිකාරය ඵලදායී වීමට කාලය ගත වන බැවින් මේ පළමු පියවර, එනම් ආරක්ෂාව තහවුරු කිරීම වැදගත් වේ.

සියදිවි නසාගැනීමට තැත් කලහැකි පුද්ගලයකු කළමනාකරණය කිරීමේදී, වැඩි අවධානය යෙදවිය යුතු සාධක ද අප සොයා බැලිය යුතුය. එම සාධක නම්, විෂ හෝ භයානක ආයුධ සඳහා ප්‍රවේශය, වයස (වැඩිහිටි පුද්ගලයින්ට වැඩි අවදානමක් ඇත), මානසික අවපීඩනය, පවුල් ඉතිහාසය, ස්ත්‍රී පුරුෂ භාවය (පිරිමින්ට

තුන් හතර ගුණයකින් වැඩි අවදානමක් ඇත) බලාපොරොත්තු සුන්වීම, ආවේගශීලී බව, තනිව ජීවත් වීම, හිතිය හෝ දැඩි කාංසාව, පෞරුෂ ආබාධ, ශාරීරික රෝග, පෙර සියදිවි නසාගැනීමේ උත්සාහය, පවුල් ඉතිහාසය, අහිමි වීම් සහ පාඩු ලැබීම්, මිතුරකුගේ හෝ ඥාතියකුගේ මෑත කාලීන මියයාමක්. මත්ද්‍රව්‍ය භාවිතය, සහ රැකියා විරහිත වීම ආදිය වේ. අපට මෙම සාධකවලින් සමහරක් වෙනස් කළ හැකි නමුත් සමහර ඒවා අපට වෙනස් කළ නොහැක.

කිසියම් පුද්ගලයකු තුළ ඇති අවදානම් සාධක හඳුනා ගැනීමෙන් පසුව, පළමුව එම සාධකයන්හි බලපෑම අවම කිරීමට අප අපේ උපරිම උත්සාහය ගතයුතුය. නිදසුනක් වශයෙන්, කිසියම් පවුල් ප්‍රශ්නයක් ඇති අයකුට එම ගැටළුව විසඳා ගැනීමට අවැසි මාර්ගෝපදේශය අප ලබාදිය යුතුය. එසේම, සමාජ සම්බන්ධතා හීන හුදකලාව දිවි ගෙවන අයකුට සමාජ සම්බන්ධතා වැඩිදියුණු කරගැනීමට උපකාර කළ හැක.

සියදිවි නසාගැනීම්වලින් ආරක්ෂා වන සාධක ද පර්යේෂකයන් හඳුනාගෙන ඇත. ඒවා නම්; හොඳ පවුල් සහයෝගය, නිවසේ දරුවන් සිටීම, ගැබ් ගැනීම, ආගම, සහ සියදිවි නසාගැනීම තහනම් කරන සංස්කෘතියකට අයත් වීම ආදියයි.

ඉහත තත්වයන් හොඳින් අවබෝධ කොටගෙන ඔබ වෙතින් සහය පතන තැනැත්තා සිටින්නේ කොතැනදැයි බලන්න. ඔහුගේ ජීවිතය අවසන් කිරීම සඳහා සැලකිය යුතු සැලසුම් නොමැතිව සාධාරණ තෘප්තිමත් ජීවිතයක් ගත කරන්නේ නම් අනතුරක් නොමැත. නමුත්, ඔහු තුළ මෙම සාධක කිහිපයක් ඇතිවිට සහ ඔහුගේ ජීවිතය අවසන් කිරීම ගැන නිතර කතා කරන ස්වභාවයක් පවතින්නේ නම්, කරුණාකර ඔවුන් මානසික සෞඛ්‍ය වෘත්තිකයකු සමග කතා කර ඇගයීමට ලක් කිරීමට වග බලාගන්න. දිවි හානි කර ගැනුමට තැත් කරන්නකු ඉන් මුදවාලීම ඔබගේ යුතුකමක් මෙන්ම වගකීමක් බවද හොඳින් මතක තබාගන්න.

# සිවිල් සම්බන්ධීකරණ නිලධාරී පාඨමාලා අංක - 21





යුද්ධ හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සංවිධානය කළ සිවිල් සම්බන්ධීකරණ නිලධාරී පාඨමාලා අංක - 21 ඉකුත් ඔක්තෝබර් 03 වන දින සිට 20 වන දින දක්වා පනාගොඩ ඉංජිනේරු සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදාවේ රෙජිමේන්තු රැසක් නියෝජනය කරමින් නිලධාරීන් 24 දෙනකුගේ සහභාගීත්වයෙන් පැවති මෙම පාඨමාලාවෙහි දේශන සඳහා රාජ්‍ය අමාත්‍යාංශ/ආයතනවල ආරාධිතයින් සේම යුද්ධ හමුදා නිලධාරීන් රැසක්ද එක්වූහ.

මෙම පාඨමාලා කාලසීමාව තුළදී ශිෂ්‍ය නිලධාරීන් හට මෙරට විවිධ දිස්ත්‍රික්කවලට ආවේණික සංස්කෘතීන්, ඉතිහාස තොරතුරු, රටේ ආර්ථිකය සහ සමාජ තත්ත්වයන්, ශ්‍රී ලංකා පොලිසියේ කාර්යභාරය, සමාජයේ පවතින විවිධ ඇදහිලි ක්‍රම සහ ආගමික වත්පිළිවෙත්, සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීම, සන්නිවේදන කුසලතා ආදිය පිළිබඳ දැනුම් සමුදායක් ලබාගැනීමේ අවස්ථාව සැලසිණ.

ඉකුත් ඔක්තෝබර් 20 වන දින පාඨමාලා අවසානයේ පැවති සහතික පත්‍ර ප්‍රදානෝත්සවය යුද්ධ හමුදා මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂක බ්‍රිගේඩියර් ටීඑන් මජීඩ් ආර්එස්පී යූඑස්පී අයිඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.



# මානසික පීඩාවෙන් මිදීමට මනෝවිද්‍යාත්මක අත්වැලක්



සටහන -:
ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක ගෙරු,
(මනෝවිද්‍යා උපදේශක)

ඔබ මා අප සියලුදෙනාම යම් කායික රෝගී තත්වයක් උද්ගත උවහොත් ප්‍රතිකාර ලබාගැනීම සඳහා නොපැකිලිව කටයුතු කරන බව සත්‍යයකි. එසේ වුවත් යම් පුද්ගලයෙකුට යම් මානසික පීඩාවක්, එසේත් නැතිනම් දීර්ඝකාලීන මානසික ගැටලුවක් පැවතියහොත් ඒ සඳහා ප්‍රතිකාර වෙත යොමුවීමට පැකිලීමක් දක්වන බව සත්‍යයකි.

ඒ සඳහා පාදක වන කරුණු අතර මානසික රෝග පිළිබඳව නිසි අධ්‍යාපනයක් නොමැතිකම, සමාජමය ආකල්ප, නොඑසේනම් දීර්ඝ කාලීනව මානසික රෝගයකින් පෙළීම හා තමා ඒ පිළිබඳව පිළිගැනීමට ඇති අකමැත්ත වැනි කාරණා හේතුපාදක විය හැක.

මානසික රෝග පිළිබඳව නිසි අධ්‍යාපනයක් නොමැතිකම ගැන තවදුරටත් විග්‍රහ කිරීමේදී බොහෝ දෙනකු නොදන්නා කරුණ නම් තම පවුල තුළ හෝ තමාට ලේ නෑකම් කියන පවුල් සාමාජිකයකු මානසික රෝගයක් සඳහා ප්‍රතිකාර ගත්තේනම් ජානමය බලපෑම මත තමාටද එය වැළඳීමේ වැඩි අවදානමක් ඇති බව අවබෝධ නොකර ගැනීමය. යම් ආතතිභාවයක් (*Stress*) ඇත්නම් එය දීර්ඝ කාලීනව ප්‍රතිකාර නොගෙන සිටීමෙන් විශාදය (*Depression*) තත්වය දක්වා වර්ධනය විය හැකි බව අවබෝධ නොකර ගැනීම, වැනි කරුණු හේතුපාදක විය හැක.

සමාජ ආකල්ප ගැන කරුණු විමසීමේදී දක්නට ලැබෙන ප්‍රධාන කරුණු අතර, මානසික රෝග සඳහා ප්‍රතිකාර ගැනීමට යොමුවීම සමාජය තුළ යහපත් ආකාරයකින් නොදැකීම. එවැනි පුද්ගලයින් සමාජය තුළින් කොන් කිරීමට උත්සහ දැරීම වැනි කරුණු දැක්විය හැක.

තවද, නොඑසේනම් දීර්ඝකාලීනව මානසික රෝගයකින් පෙළීම හේතුවෙන් තමා රෝගී වී ඇතිබව රෝගියා විසින් පිළිගැනීමට මැලිවීම හේතුවෙන් ප්‍රතිකාර සඳහා යොමු නොවීම තුළින් රෝගී තත්වය උත්සන්න වීම වැනි කරුණු දැකගත හැකි වේ.

එබැවින් මෙම ලිපිය කියවනු ලබන පාඨක ඔබ කුමක් හෝ මානසික පීඩනයකින් පෙලෙන්නේ නම් උපදේශනය පිළිබද මනා දැනුමක් ඇති උපදේශකයකු (*Counsellor*) වෙත යොමුවී උපදේශනයක් ලබාගැනීම යෝග්‍ය වේ. එවිට ඔබගේ රෝගී භාවයේ යම් උත්සන්න භාවයක් ඇත්නම් උපදේශනය පමණක් ප්‍රමාණවත් නොවන්නේ නම් ඖෂධ ප්‍රතිකාර සඳහා උපදේශකයා විසින් මනෝ වෛද්‍යවරයකු වෙත යොමු කිරීම සිදුකරනු ලබයි. තවද ඖෂධ ප්‍රතිකාර මෙන්ම මනෝවිද්‍යා උපදේශනයද සමසේ ලැබිය යුතු බව හොඳින් ධාරණය කරගන්න.

යම් පුද්ගලයකු, තම දරුවකු හෝ වැඩිහිටියකු ඔහු විසින් මුහුණ දෙනු ලබන ගැටළුවක් ඔබ සමග කතිකා කිරීමට උත්සහ ගත්තේ නම් ඒ සඳහා ඔබගේ වටිනා කාලයෙන් බිදක් ඔහු වෙනුවෙන්

**ඔබ යම් මානසික රෝගයකින් පීඩා විඳින පුද්ගලයකු ලෙස ඔබට හැඟේනම් ඔබ සඳහා උපකාර කිරීමට යුද්ධ හමුදා රෝහල තුළ ඇති මානසික සෞඛ්‍ය ඒකකයද දිවයින පුරා නොයෙක් සෞඛ්‍ය සංවිධානද, රජයේ රෝහල්වලද ඒ සඳහා ඒකකයක් තිබෙන බව අප දන්වා සිටිමු. තවද 1924 හා 1333 අංක ඉඳුරාම ඇමතීම මගින් රෝගී තත්වයෙන් මිදීමට හැකි ක්‍රම පිළිබඳව දැනුවත් කිරීමට පුහුණු උපදේශකවරයකු නොමිලේ සම්බන්ධ කරගත හැක.**

වෙන්කිරීමට කාරුණික වන්න. නොඑසේනම් සමහර විට එය ඔහු වෙනුවෙන් යමක් කිරීමට තිබූ අවසාන අවස්ථාව ඔබ විසින් මගහැරීම නිසා ඔහු හෝ ඇය ජීවිතයෙන් වන්දි ගෙවීමට ඉඩ ඇත. එය මානසික පීඩනයේ භයානක තත්ත්වයයි. ඇහුම්කම්දීම යනු මානසික පීඩනයට හොඳ ප්‍රතිකාරයකි. ඔබට එය කළ හැක. ඉන් අනතුරුව නිවැරදිව ඒ සඳහා පුහුණුව ලත් අයකු වෙත යොමුකිරීමට සිහි තබාගන්න. ඔබ මතක තබාගත යුතු කරුණ වන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ වර්තාවන්ට අනුව ශ්‍රී ලංකාව සියදිවි හානිකර ගැනීමේ අගය ඉතා ඉහළ ප්‍රතිශතයක් ගන්නා බැවින් ඔබ අන්අයගේ ගැටළු වෙනුවෙන් ඇහුම්කම්දීමෙන් හෝ "මානසික ආතතියෙන්" පෙළෙන කෙනකු වෙත උපකාරවීමට කාරුණික වන්න.

එමෙන්ම ඔබ යම් මානසික රෝගයකින් පීඩා විඳින පුද්ගලයකු ලෙස ඔබට හැඟේනම් ඔබ සඳහා උපකාර කිරීමට යුද්ධ හමුදා රෝහල තුළ ඇති මානසික සෞඛ්‍ය ඒකකයද දිවයින පුරා නොයෙක් සෞඛ්‍ය සංවිධානද, රජයේ රෝහල්වලද ඒ සඳහා ඒකකයක් තිබෙන බව අප දන්වා සිටිමු. අංක 60/බී, හෝර්ටන් පෙදෙස කොළඹ 07 පිහිටි "සුමිත්‍රයෝ" ඉන් එක් සංවිධානයකි. මහනුවර, පානදුර, බණ්ඩාරවෙල, පදුවස්නුවර, අනුරාධපුරය, මාවනැල්ල, මාතලේ මෙහි ශාඛා පිහිටා ඇත. තවද 1924 හා 1333 අංක ඉඳුරාම ඇමතීම මගින් රෝගී තත්වයෙන් මිදීමට හැකි ක්‍රම පිළිබඳව දැනුවත් කිරීමට පුහුණු උපදේශකවරයකු නොමිලේ සම්බන්ධ කරගත හැක. මෙම ඇමතුම් සම්පූර්ණයෙන්ම නොමිලේ බව කරුණාවෙන් සලකන්න. ඔබගේ මනස රැකගැනීම ඔබ සතු වගකීමකි. ඒ සඳහා අද සිට අදිටන් කරගන්න.



# ඇය...

ආදරේ අකුරු ටික
කියා දුන් ගුරුතුමිය
සිප්හල අතැර නුඹ
නොයන බව දනිමි මම....

ඔබ දුන් ඔවදනින්
සැදුම් ලත් මගේ දැනුම
පුදන්නෙමි ගුරු පඬුරු ලෙස
සදාකල් නොමියනා
මගේ මෘදු ආදරය....

ප්‍රේමණීය හදවතක් ඇති අයෙක් තම ජීවිතයට හමුවීම අගය කිරීම සඳහා අකුරු කළ සටහනක්.

- ලුතිනන් කර්නල් හේමන්ත රත්නායක



# තැපැල් වර්ජනය

1995-96 වකවානුවේ මා රාජකාරි කරන ලද්දේ මඩකලපු ප්‍රදේශයේ පිහිටි "මියන්කුලම්"(Kama Camp) කඳවුරෙහිය. පොළොන්නරු මඩකලපු ප්‍රධාන මාර්ගයේ 124 වෙනි සැතපුම් කණුව ආසන්නයේ එම කඳවුර පිහිටා තිබුණි. තරමක් උස් භූමියක හුදකලාව පිහිටි එහි මා සමඟ සෙබළු 40 දෙනකු සිටියහ. විදුලිය හෝ දුරකථන පහසුකම් කිසිත් නොවූ දුෂ්කර කඳවුරක් වූ එහි හටපිරිස්වලට බීමට ජලය සැපයුවේද බවුසර් මගිනි. හදිසි අවස්ථාවකදී කිසිවකුට දුරකතන ඇමතුමක් ගැනීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා වාලච්චේන නගරය වෙත හෝ තොළුසේනම් කිලෝමීටර් 20ක පමණ මඟ ගෙවා "පූනානි" හි පිහිටි මූලස්ථාන කඳවුර වෙත යා යුතුව තිබිණ. එබැවින් කඳවුරේ සිටි සෑම සෙබළෙක්ම තම නිවෙස් හා හිතවතුන් සමඟ ගනුදෙනු කරන ලද්දේ ලිපි මගින් පමණි.

කොළඹ සිට මඩකලපුව දක්වා බඩු භාණ්ඩ රැගෙන යන ලොරි රථ උදෑසන වනවිට කඳවුර අද්දර මාර්ගයේ ගමන් ගැනීම එවක නිතිපතා සිදුවිය. ආරක්ෂක හේතූන් මත එම කාලවකවානුවේ රාත්‍රී කාලයේ වාහන ධාවනය නොවූ අතර කොළඹ පොළොන්නරුව ආදී ප්‍රදේශවල සිට පැමිණෙන එම ලොරි රථ රාත්‍රියේ වැලිකන්දෙහි නවතා යළි මඩකලපුව බලා පිටත්වනුයේ පසුදින උදෑසනය. ඒවායේ වැඩි වශයෙන් සිංහල රියදුරන් සිටි බැවින් සෑම කඳවුරකම සෙබළු සමඟ ඔවුන් බොහෝ කුලුපග වූහ. කිසිදු ජනාවාසයක් නොවූ එම ප්‍රදේශයේ ඒ අයුරින් හෝ සිංහල අයකු මුණගැසීම රණවිරුවන්ගේ හුදෙකලා ජීවිතවලට යම් අස්වැසිල්ලක් විය.

එහිදී, තවත් විශේෂ යමක් සිදුවිය. එනම් උදෑසන සිට පැමිණෙන සෑම ලොරියකින්ම සිංහල පුවත්පත් රැගෙනවිත් ඒවා මඟදෙපස ඇති හමුදා කඳවුරුවලට බෙදාදීමය. එහිදී, "දිණමිණ", "සිළුමිණ"?

"දිනමිණ", "සිදෙව්", "බිරිඳ", "සඳරේණු", "කුමරි", "සමුදුර" ආදී පත්තර ඒ අතර සුලභ විය. ප්‍රධාන මාර්ගය අසල පිහිටි සෑම හමුදා කඳවුරකම මාර්ග බාධක තිබූ අතර උදෑසනින්ම ඒවායේ රැඳී සිටින සෙබළුන් පුවත්පත් එකතුකිරීම පුරුද්දක් කොට ගෙන තිබිණ. ඇතැම්විට එකම වර්ගයේ පුවත්පත් කිහිපයක් ලැබුණු අවස්ථාවල ඒවා යාබද කඳවුරු හා හුවමාරුකර ගැනීමටද කටයුතු කෙරිණ. කෙසේ වුවද "සිදෙව්" හා "බිරිඳ", පුවත්පත්වලට නම් සෙබළුන් අතර පැවතියේ අධික ඉල්ලුමකි. (එවැනි පුවත්පත් එක් කඳවුරකට කිහිපයක් ලැබුණද ක්ෂණිකව ඒවා අතුරුදහන් වන සෙයක්ද පෙනෙන්නට තිබිණි)

එවක රූපවාහිනී වැඩසටහන් කිහිපයකටද පුවත්පත්වලටද ඉඩලද සෑම විටකදීම මොනවා හෝ නිර්මාණශීලී යමක් ලියා යැවීම මාගේ පුරුද්දකි. ඒවා සියල්ල එහි පැවති යුද්ධමය පරිසරයෙන්ම උකහා ගත් දේවල්ය. ජාතික රූපවාහිනියේ හේම නලින් කරුණාරත්න විසින් ඉදිරිපත් කළ "9.05" වැඩසටහනටද විනීතා කරුණාරත්න අධ්‍යක්ෂණය කළ

"ගී හත" වැඩසටහනටද "තරුණි" පුවත්පතටද යුද බිමේ සිට එවක මම නිරතුරු ලිපි නිර්මාණ යොමු කළෙමි. එලෙසින්ම ඒවා එකී වැඩසටහන්වල හා පුවත්පතෙහි නොවරදවාම ප්‍රචාරය විය. යුද්ධය සැලකිය යුතු ලෙස උත්සන්නව පැවති සමයක විදුලි බල පහසුකම්ද නොමැති එම කඳවුරේදී කුමන දුෂ්කරතා මැද වුව මා එලෙස රූපවාහිනී හා පුවත්පත්වලට ලිපි නිර්මාණ යොමුකිරීම අත් නොහළේය.

මියන්කුලම් කඳවුරේ හටපිරිස් කිසිවකුත් රාත්‍රී කාලයේ කඳවුර තුළ ගත කළේ නැත. විශේෂයෙන්ම කඳවුරු ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් හට සංඛ්‍යාවක් නොවීමද පැවති ත්‍රස්තවාදී තර්ජන හමුවේ ආරක්ෂක උපක්‍රමයක් ලෙසද හටපිරිස් එලෙස රාත්‍රියේ කඳවුරෙන් පිටත රාජකාරීන්හි නිරත වූහ. එවන් අවස්ථාවල අවට වනාන්තරයේ නිදි වර්ජිතව ගෙවන රාත්‍රිය පුරා අතේ ඇති කොල කැබැල්ලක යමක් කුරුටු ගෑම එවක මාගේ පුරුද්දකි. රාත්‍රියේ කඳවුරෙන් එළියට යද්දී අවි ආයුධ ඇතුළු ආරක්‍ෂක උපකරණවලට අමතරව කොළ කිහිපයක් හා පෑනක්ද මාගේ කලිසම් සාක්කුවේ නොවරදීම තිබිණ. එහිදී, නිදි වර්ජිතව ගෙවන සෑම රාත්‍රියකදීම සිතට එන නේකවිධ සිතුවිලි එම කොලවල අපිළිවෙලට සටහන් විය. අඳුරේ එහි ලියවෙන කිසිවක් ඒ මොහොතේ මාහට කියවා ගත නොහැකි වුවද රැගෙන යන කොළ සියල්ල පිරෙන්නට මොනවා හෝ දෙයක් සටහන් වනුයේ නිරායාසයෙනි.

කඳවුරෙන් පිටත එලෙස රාත්‍රිය ගෙවන අතර යාබද "පූනානි" හි පිහිටි අප ඒකක මූලස්ථානයේ ගුවන් විදුලි ක්‍රියාකරු වූ බංඩාර නම් සෙබළා ගෙන් නිරතුරුව මා වෙත සතුට දනවන තොරතුරු ලැබුණු අවස්ථා බොහෝය. එනම්, මා විසින් ජාතික රූපවාහිනියේ "9.05", හා "ගී හත" වැනි වැඩසටහන්වලට ඉදිරිපත් කළ නිර්මාණ එහි ප්‍රචාරය වූ බව දැනගැනීමට ලැබුණේ එම ගුවන්විදුලි ක්‍රියාකරුගෙනි. පූනානි කඳවුරෙහි හටපිරිස්වලට පමණක් එවක රූපවාහිනී නැරඹීමේ පහසුකම් තිබුණි. නමුත් මා සිටි කඳවුරෙහි රූපවාහිනියක් තබා විදුලිය පවා නොතිබිණ. තවද, සෑම රාත්‍රියකදීම අඳුර මැද හුදකලාවේ කැලෑවක ගත කරමින් ඒ පිළිබඳ චිත්තරූප මවා ගැනීම හැරෙන්නට එම වැඩසටහන් පියවි ඇසින් නැරඹීමේ අවස්ථාවක් කිසිවිට මම නොලද්දෙමි.

රාත්‍රී කාලයේ කඳවුරෙන් පිටත අකුල් අස්සේ හිඳ කොළ කැබලිවල කුරුටු ගාන සියල්ල පසුදින දහවලේ ඉඩලද අවස්ථාවක නිසි පරිදි පෙළ ගස්වා නිර්මාණ බවට පත් කිරීමද මා අතින් සිදු වන්නකි. එම කටයුතුවලට මාගේ කඳවුරේ ලිපිකරුවකු වූ ගිම්හනායක යන සෙබළා සහාය විය. මා ලියූ සියලු

රාත්‍රියේ කඳවුරෙන් එළියට යද්දී අවි ආයුධ ඇතුළු ආරක්‍ෂක උපකරණවලට අමතරව කොළ කිහිපයක් හා පෑනක්ද මාගේ කලිසම් සාක්කුවේ නොවරදීම තිබිණ. එහිදී, නිදි වර්ජිතව ගෙවන සෑම රාත්‍රියකදීම සිතට එන නේකවිධ සිතුවිලි එම කොළවල අපිළිවෙලට සටහන් විය. අඳුරේ එහි ලියවෙන කිසිවක් ඒ මොහොතේ මාහට කියවා ගත නොහැකි වුවද රැගෙන යන කොළ සියල්ල පිරෙන්නට මොනවා හෝ දෙයක් සටහන් වනුයේ නිරායාසයෙනි.

නිර්මාණ යතුරු ලියනය කර දෙනුයේ එම සෙබළා විසිනි.

මා විසින් එසේ ලියන ලද ලිපි නිර්මාණද සෙසු සෙබළුන් සිය නිවෙස්වලට යවන ලිපිද ඇතුළුව දිනපතා කඳවුරේ ගොඩගැසෙන ලිපි සංඛ්‍යාව අති විශාලය. එබැවින් ඒවා සියල්ල පෝර උරයක බහා වලිකන්දේ පිහිටි තැපැල් කන්තෝරුව වෙත යැවීම නිතිපතා සිදුවිය. ප්‍රදේශයේ වූ සෙසු කඳවුරුවල තත්ත්වයද එලෙසම වූ අතර ලිපි ගනුදෙනු කිරීම සඳහා ඒ සෑම කඳවුරකින්ම අයකු ස්ථිර ලෙස පත්කොට තිබිණ. එහිදී, ලිපි කටයුතු භාර සෙබළුන් විසින් ඒ ඒ කඳවුරුවලට අදාළ ලිපි තැපැල් කන්තෝරුවේදීම වෙන වෙනම තෝරාගනු ලබන අතර එහිදී, මා සිටි මියන්කුලම් කඳවුරට දිනකට ලිපි 20-25 පමණ ලැබිණ. ඉන් අවම වශයෙන් ලිපි 6-7 ක් වත් මාගේ නමට තිබූ ඒවා විය.

විශේෂයෙන්ම රූපවාහිනී හා පුවත්පත්වලට ලිපි නිර්මාණ යොමුකිරීම හේතුවෙන් එවකට මා හට සැලකිය යුතු මිතුරු මිතුරියන් පිරිසක් සිටියා මතකය. මුලදී දෙතුන්දෙනකුගෙන් ඇරඹී කල්යත්ම එම පිරිස බොහෝ සේ වැඩිවිය. එහිදී, පළමු රසිකාවිය ලෙස අනුරාධපුරය පදිංචි පොලිස් කාන්තාවක් ලිපියක් එවා තිබූ අතර ඇය නමින් "මල්කාන්ති ගමගේ" වූවාය. එසේම, තවත් බොහෝ ප්‍රදේශවල පිරිස් එලෙස ලිපි එවාතිබුණි. ඉන් බොහෝ දෙනකු සිය පළමු දෙවැනි ලිපිවලදීම ඔවුන්ගේ ඡායාරූප පවා ලියුම් කවරවල බහා එවා තිබුනා මතකය.

තැපැල් කරු ලෙස කටයුතු කල සෙබළා වැලිකන්ද තැපැල් කන්තෝරුවේ සිට ලියුම් රැගෙන එනතෙක් කඳවුරේ සෙසු සෙබළුන් බලාසිටියේ නොඉවසිල්ලෙනි. පාරේ යන සිවිල් ලොරියක නැගී ලියුම් මල්ලද රැගෙන ඔහු කඳවුර අසලින් බහිද්දී ඇතැම් සෙබළු පෙරමගට දිවගිය අයුරු මා සිතේ දැනුදු මැවීපෙනේ.

මෙම කාලවකවානුවේ රට තුළ නොසිතූ ලෙස තැපැල් වර්ජනයක් දියත් විය. අන්තර්ජාල, ඊ මේල්, කෙටි පණිවුඩ ආදී දියුණු තාක්‍ෂණික ක්‍රම භාවිතය හේතුවෙන් වර්තමානයේ තැපැල් වර්ජන පොදුවේ සැමටම දැනෙන බලපෑම් ඇති නොකරයි. නමුත් 90 දශකයේ එවැනි සන්නිවේදන පහසුකම් කිසිත් නොවූ බැවින් තැපෑල හරහා සිදුවූ ලිපි හුවමාරුවට ප්‍රධාන තැනක් හිමිව තිබිණ. එහි විශේෂත්වය වූයේ රණවිරුවන් වූ අපට එය එකල සෘජු ලෙසම බලපෑ බැවිනි.

මෙලෙස හදිසියේ ඇරඹුණු එම තැපැල් වර්ජනය හේතුවෙන් කඳවුරේ එතෙක් පැවති සියලු ලිපි හුවමාරු කටයුතු නතර විය. මෙසේ ක්‍රම ක්‍රමයෙන් දින සති ලෙස දිගට ඇදුණු එම වර්ජනය පුරා දෙමසකට ආසන්න කලක් එක දිගට පැවතිණ. ඒ ඒ සෙබළුන් ලියූ ලිපි ඔවුන් අතම රැඳෙද්දී ඔවුන් වෙත සිය ඥාති හිතමිත්‍රාදීන් හා ලබැඳි අයවළුන් එවූ ලිපි අදාළ තැපැල් කාර්යාලවල ගොඩ ගැසෙන්නට විය. එසේ තොග ගණනින් එක්රැස්ව තිබූ එම ලිපි හා පාර්සල් පිළිබඳ විස්තර එවක රූපවාහිනියේ පවා පෙන්වා තිබිණ..

සමස්තයක් ලෙස තැපැල් වර්ජනය හේතුවෙන් සෘජු ලෙස බැට කෑ වැඩි පිරිස රණවිරුවෝ වූහ. එවක ක්‍රියාන්විත බිමෙහි අන්විඳි දුෂ්කරතාවලට අමතරව සෑම සෙබලෙක්ම පාහේ මානසිකව පීඩා විඳි දැවෙනම ප්‍රශ්නය එය වූ තරමට එම තැපැල් වර්ජනය සංකීර්ණ විය. එකී වර්ජනය කඳවුරේ සිටි සෙබළුන්ට සේම මා හටද තදින් දැනුණු සිදුවීමක් වූයේ මාගේ නමටද එවක සැලකිය යුතු ලිපි සංඛ්‍යාවක් දිනපතා ලැබෙන බැවිනි. විදුලිබල පහසුකම් නොතිබූ අප කඳවුරෙහි ඉඩක් ලද සෑම අවස්ථාවකම ලිපියක් කියවීම හෝ ලිවීම බොහෝ සෙබළුන්ගේ විනෝදාංශය වී තිබිණ. මාස ගණන් නිවාඩු නොලැබ ජීවිත අවදානමද සහිතව කඳවුරෙහි ගෙවන දුෂ්කර දිවියට තම ආදරවන්තියගේ සෙනෙහස පිරි වදන් සහිත ලිපියකින් ලැබෙන ජීවය විස්තර කළ නොහැකි තරම් විය.

කෙසේ හෝ වර්ජනය පැවැතියද සෙබළකු සෑම දිනකම වැලිකන්ද තැපැල් කාර්යාලයට පිටත්කර හැරීමට මම කටයුතු කළෙමි. ඒ වැරදීමකින් හෝ වාසනාවකට හෝ ලිපි ලැබේවී යන විශ්වාසයෙනි. එසේම බොහෝ සෙබළුන් කොයි මොහොතේ තැපැල් වර්ජනය නිමාවේදෝයි සිතමින් ගුවන් විදුලි යන්ත්‍රවලට සවන්යොමාගෙන සිටින අයුරුද දැක ගත හැකි විය. එහෙත් නොවැළැක්විය හැකි ලෙස අප සැමටම එම පීඩාව දරා ගැනීමට සිදු විය. එසේම ඒ වන විට උතුර නැගෙනහිර ක්‍රියාන්විත සේවාවන් හි නිරතව සිටි දහස් ගණනක් වූ සෙසු හමුදා සාමාජිකයෝද එකී ඉරණමට ගොදුරුව සිටියහ.

| | |
|---|---|
| **ලිපියක් හැරුණු විට අප ඉන්නා** | **බිමට** |
| **ඉර,හඳ තරු පමණි ඇත්තේ තනි** | **කමට** |
| **හරි හෝ වැරදි සිදුවෙන ලිපි** | **පමාවට** |
| **පිළියම් යෙදිය යුතු කවුරුන් හෝ** | **මෙයට** |
| | |
| **පෙම්බර බිරිඳ,දරුවන් සෙනෙහස** | **පිරුණු** |
| **සුන්දර මුතු අකුරු නැති පාලුව** | **දැනුණු** |
| **මාසයකට වැඩිය පිළියම් නැහැ** | **ලැබුණු** |
| **හදවත් නැද්ද ඇයි ඔබ මේ හැටි** | **දරුණු** |
| | |
| **හේතුව කුමක් උව වර්ජනයෙන්** | **තැවුන** |
| **වැඩිපුර පිරිස් අපි හමුදාවේ** | **ඉන්න** |
| **ලිපි නැති නිසා ගම රට ගැන** | **දැනගන්න** |
| **හිත පැටලිලා අමතර යුද්දෙක** | **ඔන්න** |

මා විසින් ලියූ ඉහත කවිපෙළ එවක ජාතික රූපවාහිනියේ "09.5" වැඩසටහනේදීද ප්‍රචාරය වූවා මතකය.  මේ සියල්ල අතරේ ප්‍රදේශයේ සිදුවන යුධ ගැටුම්ද අඩු නොවුණි. එම තත්ත්වයන්ටද මුහුණ දෙමින් තැපැල් වර්ජනය හමුවේ බැට කෑ සමස්ත රණවිරුවන් වෙනුවෙන් මා සිත තුළ උපන්නේ දැඩි කනගාටුවකි.

ඉහත සිදුවීම්වලට මේ වෙද්දී වසර 27 පමණ ගතවී අවසන්ය. කාලය තරමටම අපගේ ජීවිතද බොහෝ දුර ගෙවී ඇත. හා හා පුරා කියා මට මිතුරු ඇරයුමක් දුන් අනුරාධපුරයේ "මල්කාන්ති" සේම සෙසු හිතමිතුරු පිරිසද අද කොහේදැයි නොදනී. එකල මාගේ ලිපි නිර්මාණ යතුරුලියනය කරදුන් සෙබළ ගිමනනායක කලකට ඉහතදී සැරයන් මේජර්වරයකු ලෙස විශ්‍රාම යන ලදී. එකල මා යුදබිමේ සිට කවි කථා ලිවීම පිළිබඳ වැඩිදෙනකු  තුළ එතරම් නැකීමක් නොවීය. කෙසේ වුව මේ වනවිට යුද්ධය සදහටම අවසන්ව ඇත. නමුත් මා ලියූ කවි කතා අදටද ඉතිරිව ඇත. සැබැවින්ම අද දවසේ මෙම සිදුවීම සරල, එතරම් වැදගත් කමක් නොමැති ලෙස කෙනකුට හැගෙන්නට පුළුවන. නමුත් අදින් වසර 27 කට පමණ එපිටදී එය රණවිරුවන්ට කොතරම් පීඩාකාරී වූයේදැයි එය අත්විඳි අයකුට හැරෙන්නට අනෙකෙකුට දැනේදැයි නොදනී.

සටහන:
ලුතිනන් කර්නල් සුජිත් චමින්ද එදිරිසිංහ

# හටකාර්ය සම්පාදනය පිළිබඳ වැඩමුළුවක්



ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති බ්‍රිගේඩියර් ඊසීඒ ද සොයිසා යූඑස්පී එච්ඩීඑම්සී එල්එස්සී ගේ මගපෙන්වීම මත හටකාර්ය සම්පාදනය පිළිබඳව වැඩමුළුවක් පසුගිය සැප්තැම්බර් 27 වන දින කන්කසන්තුරෙයි යුධ හමුදා කඳවුරේදී පැවැත්විණි.


මෙම වැඩමුළුව සලාක හා ඉන්ධන නිකුත් කිරීමේ ක්‍රියාපිළිවෙත, සමීක්ෂණ මණ්ඩලය, උපකරණ, වාහන නඩත්තු කිරීම සහ යුද්ධ හමුදා විනය පවත්වාගෙන යාම යන අදියර තුන යටතේ ක්‍රියාත්මක කෙරිණ. 5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය, 5 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ මෙන්ම 4 වන  විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවල අණදෙන නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් විසින් එහි දේශන පවත්වන ලදී. මෙම වැඩමුළුව සඳහා ඉදිරි නඩත්තු පෙදෙස උතුර ආඥාපති හා නිලධාරීන් රැසක් සහභාගී වූහ.

# හරවත් දේශන මාලාවක්



පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් කාර්යාලය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය එක්ව වටිනා දේශන මාලාවක් ඉකුත් ඔක්තෝබර් 06 වන දින 3 (සේවා) ගැමුණු හේවා බලකායේ දී පැවැත්විණ.

613 වන පාබල බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ පැවති එම දේශන මගින් පුනරුත්ථාපනය හා එම මධ්‍යස්ථානයන් හඳුන්වාදීම, මත්ද්‍රව්‍ය හා මත්ද්‍රව්‍ය නිවාරණය සබැඳි පවුල් උපදේශනය මෙන්ම මත්ද්‍රව්‍ය සබැඳි නීතිමය පසුබිම පිළිබඳ දැනුම්වත් කිරීම සිදුවිය.



# ත්‍රිවිධ හමුදාවේ වැඩිම වාර ගණනක් ලේ දන් දුන්

## යුද්ධ හමුදා නිලධාරියා කියන කතාව

**බහු නියෝජනය කරන්නේ ලෝකයේ මානුෂීයම හමුදාව විදිහට හඳුන්වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවයි. බහු සුවිශේෂී චරිතයක් වන්නේ යුද බිමේ දී වගේම යුද්ධයෙන් පසුවත් රට වෙනුවෙන් රුධිරය පරිත්‍යාග කළ ත්‍රිවිධ හමුදාවේ පොලීසියේ සියලුම සාමාජිකයින් අතරින් වැඩිම වාර ගණනක් රුධිරය දන් දුන් පුද්ගලයා ලෙසය. මේ බහු අප සමඟ කී කතාවයි.**

**ඔබ කවුද ?**

මම බ්‍රිගේඩියර් චමිල මුණසිංහ. මම ඉපදුණේ කඩවත. මම තමයි මගේ පවුලේ එකම දරුවා. මගේ තාත්තා ගෘහ නිර්මාණ ශිල්පියෙක්. මම අධ්‍යාපනය ලැබුවේ කොළඹ කේරි විද්‍යාලයේ. ඒක වසරේ ඉඳන් උසස් පෙළ දක්වාම කේරි විද්‍යාලේ තමයි අධ්‍යාපනය ලැබුවේ. උසස් පෙළ හදාරමින් ඉන්න කාලයේදී තමයි මට යුද්ධ හමුදාවට බැඳීමේ අවශ්‍යතාවය තිබුණේ. පාසලේදී ගුරුවරුන් ඇහුවත් අනාගත බලාපොරොත්තුව මොකක්ද කියලා අනිත් අය වගේ නෙවෙයි මගේ ඔළුවේ තිබුණේ සෙබළෙකු වීමේ බලාපොරොත්තුව.



සටහන -:
ලුතිනන් දිලංක ගුණතිලක,
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

**ඒ කියන්නේ ඔබේ ලේවලට තිබුණා හමුදා සේවයට ඔබ එක්විය යුතුයි කියන දේ නේද ?**

ඒක එහෙම වෙන්න පුළුවන්. මොකද මගේ පවුලේ කිසිම කෙනෙක් යුද්ධ හමුදා සේවයේ හිටියේ නැහැ. නමුත් මට ඒ කාලේ ඉඳලාම හමුදාවට බැඳීමේ ආශාවක් තිබුණා. පසුකාලීනව මම දැනගත්තා නිලධාරියකු වීම තමයි කළ යුතු හොඳම දේ කියලා. ඒ අනුව අධ්‍යාපනය ලබමින් ඉන්නකොට යුද්ධ හමුදාවට බැඳෙන්න අයදුම්පත් යොමු කළා. ඒ අනුව 1990 ජනවාරි මාසෙදී බඳවා ගැනීම් අංක 33 යටතේ කෙඩෙට් නිලධාරියකු ලෙස මම යුද්ධ හමුදාවට බැඳුණා.



**කොළඹ ඉපදිලා කොළඹ පාසලකට ගිය ඔබ යුද්ධ හමුදාවට බැඳුණට පස්සේ ඒ ජීවිතේ දැණුනේ කොහොමද ?**

කුඩා කාලයේ ඉඳලම මගේ බලාපොරොත්තුව තිබුණේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එකතුවීම. ඒ නිසා මගේ මේ අලුත් ජීවිතය සඳහා මගේ පෙර සූදානමකුත් තිබුණා කිව්වොත් නිවැරදියි. ඒ නිසා ලොකු වෙනසක් නම් දැණුනේ නෑ. නමුත් පාසල් ජීවිතයේදී කාකි යුනිෆෝර්ම් එකට මාරු වුණාට පස්සේ ඒ පරිවර්තනය අනිවාර්යෙන්ම දැනෙනවා. මොකද නිවසින් බැහැරව ඒ කාලයේ හිටපු යාළු මිත්‍රයින්ගෙන් බැහැර වෙලා අලුත් සමාජයක්, අලුත් පුහුණු වටපිටාවක් අලුත් අණකට යටත්වීමක් වගේ පරිවර්තන රැසකට අපේ ජීවිත මුහුණ දෙනවා. ඒ අවස්ථාවේ දී මූලිකම අවශ්‍යතාවය උණේ දරාගැනීම තමයි. පොඩි කාලයක් යනකොට අපි ඒකට අනුගත වුණා.

**පවුලේ එකම දරුවා යුද්ධ හමුදාවට එකතුවීම සම්බන්ධයෙන් දෙමව්පියන් දැක්වුවේ මොනවගේ ප්‍රතිචාරයක්ද ?**

මම යුද්ධ හමුදාවට බැඳෙන්න අයදුම්පත්‍ර දැම්මේ 1989 අවුරුද්දේ. ජනතා විමුක්ති පෙරමුණේ අරගලය අවසන් වෙලා තිබ්බේ එතකොට. හරියට කිව්වොත් උතුරයි දකුණයි දෙකම ගිනිගනිමින් තිබුණ කාලයක් ඒක. කොහොමත්ම අවස්ථාවක් උදාවුණේ නැහැ ඒ අයගේ කැමැත්තෙන් යුද්ධ හමුදාවට බැඳෙන්න. අනික මගේ පවුල් වටපිටාවත් එක්ක බලනකොට ඒ අයටත් ඕන වුනේ වෙනත් වෘත්තියකට මාව යොමු කරන්න. නමුත් මගේ තිබ්බ දැඩි කැමැත්ත සහ ඉල්ලීම මත අවසානයේ දී මගේ ඉල්ලීමට ඒ අය අකමැත්තෙන් හරි එකඟ වුණා.

**ඒ විදිහට ඔබ දෙමව්පියන්ගේ අකමැත්තෙන් යුද්ධ හමුදාවට බැඳුණට ඔබ නිලධාරියෙක් ලෙස විසිරයාමේ පෙළපාලියෙන් පස්සේ ඔබේ මව දැක්වුවේ මොන වගේ ප්‍රතිචාරයක් ද?**

1991 ජූනි මාසේ තිබ්බ මගේ විසිරයාමේ පෙළපාලියට අම්මයි තාත්තයි තවත් ඥාතීන් කිපදෙනෙකුයි ආවා. මගේ පියා තමයි මට තනි තරුව ඇන්දෙව්වේ. ඊට පස්සේ ඒ අය ළඟට ගියාට පස්සේ මට පේන්න ඔවුන් යම් සතුටක් ලබන්න ඇති. නමුත් අම්මගේ හිත ඇතුළේ තියෙන්න ඇති යම්කිසි මට නොපෙන්වන දෙයක්. ඒක කනගාටුවක්ද අභිමානයක්ද කියන දේ මට කියන්න බැහැ. නමුත් මම එයාගේ මූනෙන් සහ ඇස් දෙකෙන් දැක්කා එයා ලොකු තෘප්තියකින් ඒ අවස්ථාවේ හිටියා කියලා තමුන්ගේ එකම දරුවා යුද්ධ හමුදාවට භාර කිරීම සම්බන්ධව. ඒ කියන්නේ ඒකාලේ රටේ තිබ්බ අවශ්‍යතාවයට මම දක්වපු මගේ දැඩි කැමැත්ත ඒ අය සතුටින් පිළිගත්තා කියලා මම විශ්වාස කරනවා.

**මේ විදිහට යුද්ධ හමුදාවට බැඳිලා නවක නිලධාරියකු ලෙස ඔබ ඔබේ පළමු රාජකාරිය කළේ කොහෙද්ද ?**

මගේ පළමු රාජකාරි ප්‍රදේශය වව්නියාව. ඒ වෙනකොට වන්නි වික්‍රම 02 ක්‍රියාන්විතය අවසන් වෙන්න තිබුණේ දවස් දෙකක් විතර මගේ මතකයේ හැටියට. වන්නි වික්‍රම 02 ක්‍රියාන්විතය අවසන් වෙලා මට මතක හැටියට අකුණු පහර ක්‍රියාන්විතය පටන් ගත්තා. ඊළඟට මම සහභාගී වුණු ප්‍රධානම ක්‍රියාන්විතය වුණේ බලවේගය 1 ක්‍රියාන්විතය. ඒ ක්‍රියාන්විතයට අණ දුන්නේ ජෙනරල් කොබ්බෑකඩුව.

**පළමු ක්‍රියාන්විතයේ ඔබ ලැබූ සුවිශේෂී අත්දැකීම් මොනවාද ?**

අත්දැකීම් නම් ගොඩක් තියෙනවා. ඒ ක්‍රියාන්විතයට අපි සහභාගී වුණේ කාලතුවක්කු ආරක්ෂක නිලධාරීන් විදිහටයි. මුල්ලියාන් කෝවිල ගාවදී එල්ටීටීඊ එකෙන් එල්ල කරපු ප්‍රහාරය මට හොඳටම මතකයි. ඒ ප්‍රහාරයේ දී අපි කොටස් දෙකකට කැඩුණා. ඒ වෙලාවේ මැදින් ප්‍රහාරයක් එල්ල කරමින් තමයි එල්ටීටීඊ එක අපේ පාබල සේනාංකවලට ප්‍රහාර එල්ල කළේ. ඒක තමා කාලතුවක්කුවක් එල්ටීටීඊ සංවිධානයට නතු වෙන්න තිබුණු පළමු අවස්ථාව. නමුත් යුද්ධ හමුදාවේ සහ රටේ වාසනාවට එවැන්නක් සිදුවුණේ නැහැ. අපි අපේ කාලතුවක්කු ආරක්ෂා කරගත්තා. ඒක තමා ප්‍රධානම අත්දැකීම වුනෙ එල්ටීටීඊ ත්‍රස්තවාදීන් සමඟ සටනේදී.

ඒ වගේම 1995 ද වැලිඔය ක්‍රියාන්විතයේ දී අපේ ප්‍රහාර හමුවේ ත්‍රස්තවාදීන් විශාල පිරිසක් ජීවිතක්ෂයට පත් වුණා. ඒ වගේම විශාල පිරිසක් තුවාල ලැබුවා. ඒක ඔවුන්ගේ දුරකතන සංඥාවලින් තහවුරු වුණා. ඒකෙදිත් මම කාලතුවක්කු වෙඩි බලය ලබාදෙමින් හිටියේ. ඒ මෙහෙයුමේ දී මට වීර පදක්කමක් ලැබුණා.

**වර්තමානයේ යුද්ධ හමුදාවේ ඔබේ භූමිකාව කුමක්ද ?**

මම මේ වෙනකොට ජාතික ආරක්ෂක විද්‍යාපීඨයේ පාඨමාලාවක් හදාරමින් ඉන්නේ. ඊට පෙර කාලතුවක්කු බලසේනාවේ බසේනාධිපති වශයෙන් කටයුතු කළා. ඒක මගේ ජීවිතයේ සුවිශේෂී අවස්ථාවක්. මොකද කාලතුවක්කු රෙජිමේන්තුවේ නිලධාරියෙක් හැටියට බලසේනාව අණදීමට ලැබෙනවා කියන්නේ ඒක සුවිශේෂී අවස්ථාවක්.

**යුද්ධ හමුදාවේ ජීවිතයෙන් බැහැරව පෞද්ගලික ජීවිතය ගැන කතා කළොත් ? මොකද ඔබේ තරුණ කාලය ගෙවෙන්නේ යුද බිමේ ?**

මගේ බිරිඳ මගේ ළඟම ඥාතියෙක්. අපි කුඩා කල ඉඳලම එකට තමයි හැදුනේ වැඩුනේ. ඒ කුඩා කාලයේ සිට තිබුණු සම්බන්ධතාවය පසුකාලීව දෙපාර්ශ්වයේම දෙමාපියන්ගේ කැමැත්ත මත සහ අපි දෙදෙනාගේ කැමැත්ත මත ඒ සම්බන්ධය විවාහය දක්වාම ඉදිරියට ආවා. මට පුතාලා දෙන්නෙක් ඉන්නවා. ඔවුන් දෙදෙනාම උපාධිධාරීන්.

**ඕනෑම හමුදා සාමාජිකයකුගේ අභිමානය සහ වීරත්වය සමාජයට පෙනෙන්නේ ඔහු සතු වීර පදක්කම්වලින්. ඔබත් එවැනි වීරපදක්කම්ලාභියෙක්. මොනවද ඔබ සතු වීරපදක්කම් ?**

කාලතුවක්කු රෙජිමේන්තුවේ වීරවික්‍රම විභූෂණය ලබපු පළවෙනි නිලධාරියා මම. 1995 රිවිරැස ක්‍රියාන්විතයේ දී සිදුවුණු සිදුවීමකින්. ඒක වීර ක්‍රියාවක් කියලා මම කියලා මම කරපු දේ අභිමානයකට ලක් කරන්නේ නෑ. එවකට එහි සිටි සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පැසසුමට මම ලක්වුණා. ඒ කාලේ මම අටවන ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාවේ ඉදිරි නිරීක්ෂණ නිලධාරියා වශයෙන් කටයුතු කරමින් ඉන්නකොට ත්‍රස්තවාදීන් ඉදිරි ආරක්ෂක වළල්ල කඩාගෙන ඒමට උත්සාහ කිරීමේදී වර්ෂාව මෙන්ම දුරකතන සංඥා

බිඳවැටීම නිසා අපි ඉතාම දුෂ්කර අඩියකට වැටිලා සිටි අවස්ථාවේ දී ඉදිරි ආරක්ෂක වළල්ල බිඳවැටීමට නොදී රැකගෙන සිටීම නිසයි වීරවික්‍රම විභූෂණය මට ලැබුණේ.

වීරපදක්කමක් ලැබෙන්නේ තමුන් කරපු සේවය ඇගයීම වෙනුවෙන්. මෙතනදී හැමදේම සිදුවුණේ යුද්ධ හමුදාවේ අභිමානයත් රටේ ආරක්ෂාව තහවුරු කිරීමත් සඳහා පමණයි. ඒ අවස්ථාවේදී මගෙන් ඉටුවිය යුතු රාජකාරිය මම ඉටුකළා. ඒ නිසා මට මේ වෙනකොට වීර පදක්කම් ලැබිලා තියෙනවා. වීරවික්‍රම විභූෂණය, රණවික්‍රම පදක්කම දෙවරක්, රණශූර පදක්කම වගේ සියලුම පදක්කම් මට ලැබිලා තියෙනවා.

**ඔබට දේශපුත්‍ර සම්මානය ලැබුණා නේද ?**

ඔව්... සත්ජය II ක්‍රියාන්විතයේ තුන්වැනි දවසේදී මම හිටියේ තුන්වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ ඉදිරි නිරීක්ෂණ නිලධාරියා හැටියටයි. අපි පරන්තන් හන්දියේ දී ක්‍රියාන්විතය ඉදිරියට කරගෙන යන්න සූදානමින් ඉන්නකොට අපේ ඉදිරි ආරක්ෂක වළල්ලට විශාල කාලතුවක්කු ප්‍රහාරයක් එල්ල වුණා. අපි හිටපු ස්ථානයට කාලතුවක්කු ප්‍රහාර හතර පහක් එකපාරම වැදුණා. අපේ 13 දෙනකු ජීවිතක්ෂයට පත්වුණා. ඒ ප්‍රහාරයෙන් මගේ සහයකයා පවා ජීවිතක්ෂයට පත්වුණා. ඒ අවස්ථාවේ මටත් තුවාල සිදුවුණා. නමුත්, මට දැනුනෙ නෑ මට තුවාල සිදුවෙලා කියලා. මොකද මම ඒ වෙලාවේ වැඩි අවධානයක් යොමු කළේ ප්‍රහාරයට ලක්වෙලා වැටිලා හිටපු අය සම්බන්ධයෙන්. ඒ සිදුවීමෙන් පසුව තමයි මට දේශපුත්‍ර සම්මානය ලැබුණේ.

ඔබ තමයි ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය සියලුම දෙනා අතරේ වැඩිම අවස්ථා ගණනක් ලේ දන් දුන් නිලධාරියා. ඒ වගේම ඔබ යුද බිමේදීත් රට වෙනුවෙන් ලේ දන්දුන් පුද්ගලයෙක්. ඔබ රුධිරය දන්දෙන්න එහෙමත් නැත්නම් රුධිර පාරවිලයනය සඳහා යොමුවුණේ කොහොමද ?

දැනට තියෙන ලිඛිත දත්තයන්ට අනුව මම 186 වතාවක් රුධිරය දන් දීලා තියෙනවා. නමුත් ඊට වැඩි ප්‍රමාණයක් මම ලේ දන්දීලා තියෙනවා. පාසැල් කාලයේ මම උසස් පෙළ හදාරද්දී තමයි පළවෙනි වතාවට ලේ දන් දුන්නේ. ඉන් පසුවත් කිප අවස්ථාවකදී මම ලේ දන්දීලා තියෙනවා. නමුත් එය අඛණ්ඩව සිදුවුණේ නැහැ. 1997 අවුරුද්දේ එවකට මම හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණියගේ ආරක්ෂක නිලධාරියා වශයෙන් කටයුතු කරන කාලෙදී එහි සේවයකරපු සෙබළකුගේ දරුවකුට මගේ තියෙන බී පොසිටිව් වර්ගයේ රුධිරය අත්‍යවශ්‍යය වුණා. පසුව ඒ සඳහා මම ඉදිරිපත් උණා. එතන තමයි රුධිය දන්දීමේ දෙවැනි ආරම්භය. එතැන ඉඳලා මම දිගටම මේ කටයුත්තට සම්බන්ධ වුණා.

පසුගිය කොවිඩ් සමයේ මම තමයි වැඩිම අවස්ථා ගණනකදී රුධිරය දන්දුන් පුද්ගලයා. හැබැයි මම මේ දේවල් කරන්නේ කිසිම ජනප්‍රියත්වයක් බලාපොරොත්තුවෙන් නෙවෙයි. මම මේ දේ සිදුකරන්නේ හුදෙක්ම මගේ ආත්ම තෘප්තිය වෙනුවෙන් පමණයි. මගෙන් රුධිරය ලබා ගන්නා පුද්ගලයා නැවත ජීවයක් ලබනවා නම් ඒ තමයි මගේ සතුට. බුදුරජාණන් වහන්සේ පවා දේශනා කරලා තියෙන්නේ තමන්ගේ ශරීර අවයව දන්දීම උතුම්ම සත්ක්‍රියාවක් කියලා.

**ලේ දන් දීමේ දී ඔබ රුධිර පට්ටිකා දන් දීම සිදුකරනවා නේද ?**

ඔව්...රුධිරය දන්දීම ආකාර දෙකක් තියෙනවා. එකක් තමයි සාමාන්‍යය රුධිර පරිත්‍යාගය. අනිත් ක්‍රමය තමයි රුධිර පට්ටිකා පරිත්‍යාගය. සාමාන්‍යය රුධිර පරිත්‍යාගය සඳහා විනාඩි දහයක් පමණ ගතවුණත් රුධිර පට්ටිකා පරිත්‍යාගයේ දී ඊට වඩා කාලයක් ගතවෙනවා.

**ඔබ රුධිර පට්ටිකා දන් දීම සඳහා යොමුවුණේ කොහොමද ?**

මම මුලින්ම සාමාන්‍ය රුධිර පරිත්‍යාගය සිදුකළත් මාව පරීක්ෂණයකට භාජනය කරලා එවකට රුධිර පාරවිලයන මධ්‍යස්ථානයේ හිටපු ජ්‍යෙෂ්ඨ වෛද්‍යවරයකු විසින් කිව්වා රුධිර පට්ටිකා ලබාගැනීම සඳහා ඔබව තෝරාගෙන තියෙනවා කියලා. ඒ විදිහට ආරම්භ කරලා මම 138 වතාවක් රුධිර පට්ටිකා ලබාදීලා තියෙනවා. එක් අවස්ථාවක රුධිර පට්ටිකා ලබාදීම සඳහා පැය එකහමාරක දෙකක අතර කාලසීමාවක් රුධිරය ලබාගන්නවා. සාමාන්‍ය රුධිර පරිත්‍යාගයකදී එක් පට්ටිකාවක් ලබාගත හැකි වුණත් රුධිර පට්ටිකා පරිත්‍යාග කිරීමේදී රුධිර පට්ටිකා ඒකක 16 ක් ලබාගැනීම සිදුකෙරෙනවා. ඉන් ශරීරයට කිසිම හානියක් සිදුවෙන්නේ නැහැ. මොකද පට්ටිකා ප්ලාස්මා වෙන් වුණාට පස්සේ නැවතත් පට්ටිකා ලබාගන්නා යන්ත්‍රය මඟින් ශරීරයට ලබාදීම සිදුවෙනවා. ඒ නිසා දින 14කට වතාවක් රුධිර පට්ටිකා ලබාදීම සිදුකරන්න පුළුවන්.

**මෙසා විශාල අවස්ථාවන් ප්‍රමාණයක රුධිරය දන්දුන් ඔබට යම් ඇගයීම් පවා ලැබිලා තියෙනවා නේද ?**

ඔව්...සියවෙනි අවස්ථාවේ මම රුධිරට පරිත්‍යාග කළාට පස්සේ මට ඇගයීමක් ලැබුණා. මේ ඇගයීම මට ලැබෙන්නේ ජූනි 14 වැනිදා. ලෝක රුධිර පාරවිලයන දිනය දවසේදී තමයි මට ඒ ඇගයීම ලැබුනේ. එම උත්සවය තිබුණේ අරලිය ගහ මන්දිරයේදී. එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා අතින් තමයි මට ඒ ඇගයීම ලැබුණේ. ඉන්පසුව ජනාධිපති ලෙස තේරීපත්වුණු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා තමයි එවකට සෞඛ්‍යය  ඇමති.

**ලේ දන්දීම සම්බන්ධයෙන් සමාජයේ තියෙන විවිධ මිත්‍යා මත සම්බන්ධයෙන් ඔබේ අදහස මොකක්ද ?**

සමහරු කියනවා රුධිරය පත්‍යාග කළාම ශරීරය ස්ථූලභාවයට පත්වෙනවා කියලා. ඒක මිත්‍යා මතයක්. එහෙම ඔප්පු කරන්න පිළිගත හැකි සාක්ෂි නැහැ. රුධිරය පරිත්‍යාග කළාම තමන්ගේ සතුට වැඩිවෙනවා. ඒක හොඳටම ඇති ශරීර සෞඛ්‍යය යහපත්ව තියාගන්න. මම යුද්ධ හමුදාවෙන් විශ්‍රාම යන්න පෙර රුධිරය දන්දීමේ වාර 250 සම්පූර්ණ කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.

**ඔබ යුද බිමේදී රට වෙනුවෙන් රුධිරය පරිත්‍යාග කළා. යුද්ධයෙන් පසුවත් ඔබ රට වෙනුවෙන් රුධිරය පරිත්‍යාග කරනවා. මේ තමයි ලෝකයේ මානුෂීයම හමුදාව කටයුතු කරන විදිහ. හැබැයි මොවුන් පිළිබඳ සමාජයේ විවිධ මත තියෙනවා. ඒ පිලිබඳ ඔබේ අදහස මොකක්ද ?**

රටේ අනෙකුත් අවශ්‍යතාවලදී වගේම රුධිර අවශ්‍යතාවය ආපු හැම අවස්ථාවකම ඒ සඳහා ඉදිරිපත් වුණේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව. ඇතැම් අවස්ථාවලදී යම් පිරිස් විශ්වාස කරනවා එයාලගේ ආගම අනුව රුධිය දන්දීම අකැපයි කියලා. නමුත් යුද්ධ හමුදාව ගත්තාම එහෙම දේවල් තිබ්බෙ නෑ. උතුරේද දකුණේද නැගෙනහිරද කියලා නෑ යුද්ධ හමුදා සෙබළු ලේ දන්දීම සිදුකරනවා. ශ්‍රී ලංකාවේ රුධිර පරිත්‍යාග කිරීමේ ප්‍රථමයා තමයි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව. අපි මානුෂීයම හමුදාවක් කියන දේ ක්‍රියාවෙන් ඔප්පු කරලා තියෙනවා. මහජනතාව අපි දිහා එදා යුද්ධය අවසන් කරපු කාලෙදී තිබුණු හැඟීමෙන්ම බලනවා. හැබැයි ඒ මතය වෙනස් කරන්න ඉතාමත් සුළු පිරිසක් කටයුතු කරනවා. නමුත්, අපි ඒ දේවල් නැකිය යුතු නැහැ. මොකද සෑම අවස්ථාවකදීම රටේ යම් ව්‍යසනයක් එහෙම නැත්නම් හදිසි අවස්ථාවක් ඇතිවුණොත් පළමු ප්‍රතිචාර දැක්වීම සිදුකරන්නේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව. පසුගිය කොවිඩ් සමයේදීත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව රටේ ජනතාව වෙනුවෙන් කැපවුණා. යුද්ධ හමුදාව ඉන්නේ පටු ලාභ ප්‍රයෝජන ගන්න නෙවේ. ඒ නිසා ඔය සුළු පිරිසක් කරන චෝදනා රටේ ජනතාව පිළිගන්නේ නෑ.



# ක්‍රීඩා විත්ති

## අතරමැදි බොක්සිං තරඟාවලිය - 2022





ශ්‍රී ලංකා බොක්සිං සංගමය මගින් සංවිධානය කරන ලද "අතරමැදි බොක්සිං තරඟාවලිය - 2022" ඉකුත් ඔක්තෝබර් මස 05 වන දින සිට 08 වන දින දක්වා කොළඹ රාජකීය විද්‍යාලයේ බොක්සිං වළල්ලේදී පැවැත්විණ. ඒ සඳහා දිවයිනේ ප්‍රමුඛ පෙළේ බොක්සිං ක්‍රීඩකයින් මෙන්ම නාවික හා ගුවන් හමුදාව නියෝජනය කරමින්ද ක්‍රීඩකයින්යින් සහභාගී වූහ. එහිදී සමස්ත තරඟාවලියෙහි පිරිමි අංශයේ ශූරතාව සහ කාන්තා අංශයේ අනුශූරතාව දිනාගැනීමට යුද්ධ හමුදා බොක්සිං ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත් වූයේ රන් පදක්කම් 11ක්, රිදී පදක්කම් 09ක් සහ ලෝකඩ පදක්කම් 12 ක් සතුකර ගනිමිනි. එහිදී, දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය සහ දක්ෂතම පරාජිත ක්‍රීඩිකාවට යුද්ධ හමුදා බොක්සිං ක්‍රීඩක ක්‍රීඩිකාවන් විසින් හිමිකර ගන්නා ලදී.

## මැලේසියාවේ පැවති 8 වැනි ලෝක කැරම් තරඟාවලිය




රටවල් 18 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසකගේ සහභාගීත්වයෙන් 8 වැනි ලෝක කැරම් ශූරතාවලිය පසුගිය ඔක්තෝබර් මස 3 වන දින සිට 7 වන දින දක්වා මැලේසියාවේදී පැවත්විණ. ඒ සඳහා ඉදිරිපත් වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි කැරම් කණ්ඩායම එහි අනුශූරතාව දිනාගැනීමට සමත් වූහ. එහි අවසන් මහා තරඟයේදී ඉන්දීය ක්‍රීඩකයින් සමගින් තරඟ වැදුණු විජයබාහු පාබල රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් ප්‍රනාන්දු ඩබ්ලිව්එස්එම් අනුශූරතාව හිමිකර ගත් අතර, බංග්ලාදේශ ක්‍රීඩිකාවන් සමගින් තරඟ වැදුණු ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ලාන්ස් කෝප්‍රල් ගේබ්‍රියෙල් ආර්ඩී එහි කාන්තා අංශයේ 3 වන ස්ථානය දිනාගැනීමට සමත් වූවාය. එසේම බංග්ලාදේශ ක්‍රීඩිකාවන් සමගින් තරඟ වැදුණු ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ලාන්ස් කෝප්‍රල් ගුණදාස ඒපීඑන්එම් විසින් එම ඉසව්වේ 3 වැනි ස්ථානය දිනාගන්නා ලදී.

# වසර 16 කට පසු පිහිනුම් ජාතික තරගාවලියේ ශූරතාවය යුද්ධ හමුදාවට





ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය සංවිධානය කරන ලද "ජාතික හා කනිෂ්ඨ ජාතික පිහිනුම් ශූරතාවලිය - 2022" සුගතදාස ක්‍රීඩාංගණයේ පිහිනුම් තටාකයේදී පසුගිය ඔක්තෝබර් මස 4 දින සිට 7 දින දක්වා පැවැත්විණ. එහිදී, එම තරගාවලියේ ශූරතාවය දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිහිනුම් ක්‍රීඩකයෝ සමත් වූහ.

වසර 5 ක් පුරාවට ජයග්‍රහණය තමන් සතුකරගනිමින් ලකුණු 18 කින් ඉදිරියෙන් සිටි *"Killer Whale Aquatics"* කණ්ඩායම පරදවමින් වසර 16 ක් මෙම පිහිනුම් තරගාවලියට සහභාගී නොවූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිහිනුම් ක්‍රීඩකයින් "නොහැක්කක් නොමැත" යන්න සනාථ කර ලකුණු 322 ක් ලබාගනිමින් එම ජයග්‍රහණ ලබාගැනීම සුවිශේෂී විය. *"Killer Whale Aquatics"* කණ්ඩායම අවසන් තරගය සඳහා යුද්ධ හමුදා කණ්ඩායමට වඩා ලකුණු 26 ක් ඉදිරියෙන් සිටිමින් සහභාගී වුනු තත්ත්වයක් යටතේ යුද්ධ හමුදාව මෙම ජයග්‍රහණය හිමිකරගැනීම තවත් විශේෂත්වයකි. ශ්‍රී ලංකා යුද හමුදා පිහිනුම් කණ්ඩායමේ පුහුණුකරු වන මේජර් රොෂාන් පීරිස් ගේ මගපෙන්වීම යටතේ පිහිනුම් ක්‍රීඩකයින් 15 දෙනකුගෙන් සමන්විත ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිහිනුම් කණ්ඩායම මෙම තරගාවලියට සහභාගී වූහ.

යුද්ධ හමුදා පිහිනුම් ක්‍රීඩකයින් එක් එක් කාණ්ඩ යටතේ රන් පදක්කම් 17 ක්, රිදී පදක්කම් 5 ක් සහ ලෝකඩ පදක්කම් 2 ක් දිනාගනු ලැබූහ අතර, මෙම තරගාවලියට පිහිනුම් කණ්ඩායම් 64 ක් නියෝජනය කරමින් ක්‍රීඩකයින් 316 දෙනෙක් සහභාගී වූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ජල ක්‍රීඩා කමිටුවේ සභාපති සහ යුද්ධ හමුදා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී තරගාවලිය සඳහා සහභාගී වීමට යුද්ධ හමුදා පිහිනුම් ක්‍රීඩකයින් දිරිමත් කරමින් මගපෙන්වීම් ලබාදුන්නේය. මෙම තරගාලියේ කුසලාන සහ සහතිකපත් ප්‍රදානය කිරීමේ උත්සවය පසුගිය ඔක්තෝබර් 07 වන දින සුගතදාස ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.

# 16 වන ජාතික "සේපාක්ටැක්රෝ ශූරතාවලිය"



16 වන ජාතික "සේපාක්ටැක්රෝ ශූරතාවලිය" ඉකුත් ඔක්තෝබර් 22 සහ 23 යන දිනයන්හිදී මහනුවර මහනගර සභා ශෘහස්ථ ක්‍රීඩාංගණයේදී පැවැත්විණ. ජ්‍යෙෂ්ඨ තරගාවලියේ ශූරතා 06 ක් වෙනුවෙන් පැවැත්වූ එම තරගාවලියේදී ශූරතා 04 ක්ම දිනාගැනීමට යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ සමත්වූහ.

එහිදී පිරිමි Hoop ඉසව්ව, කාන්තා Regu ඉසව්ව, කාන්තා Hoop ඉසව්ව සහ කාන්තා Double ඉසව්වෙන් ශූරතා  දිනාගැනීමට යුද්ධ හමුදා A කණ්ඩායම සමත්වූහ. එහිදී පිරිමි කණ්ඩායම Regu ඉසව්වේ අනුශූරතාවය දිනාගත් අතර, යුද්ධ හමුදා B කණ්ඩායම් පිළිවෙලින් කාන්තා Hoop ඉසව්ව, කාන්තා Regu ඉසව්ව සහ කාන්තා Double ඉසව්වන්ගෙන් අනුශූරතාවයන් දිනාගැනීමට සමත්වූහ. යුද්ධ හමුදා "සේපාක්ටැක්රෝ සංචිතය" යුද්ධ හමුදා පාපන්දු සංචිතය යටතේ බ්‍රිගේඩියර් කේඒ්යූ කොඩිතුවක්කු ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

# යුද්ධ හමුදා මාර්ග ධාවන තරඟාවලිය - 2022










යුද්ධ හමුදාව වෙතින් වාර්ෂිකව පවත්වනු ලබන "යුද්ධ හමුදා මාර්ග ධාවන තරගය - 2022" මෙවරත් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේදී ඉකුත් සැප්තැම්බර් 02 වන දින උදෑසන ආරම්භ විය. ඒ සඳහා රෙජිමේන්තු 15 ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 147 දෙනකු සහභාගී වූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සභාපතිත්වයෙන් යුත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා මළල ක්‍රීඩා කමිටුව විසින් මෙම තරගය සංවිධානය කරන ලදී. මෙවර තරගය සඳහා කාන්තා ක්‍රීඩිකාවන් 15 දෙනකු සහභාගී වූ අතර, තරගය උදෑසන 0600 පැයට ආරම්භය විය. ඒ අනුව, දියත උයන, බත්තරමුල්ල, මාලබේ, අතුරුගිරිය, හබරකඩ යන නගරයන් පසුකරමින් හයිලෙවල් මාර්ගය හරහා නැවතත් පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ පිහිටි යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාගාර පරිශ්‍රයේදී තරගය නිමවිය. යුද්ධ හමුදා මළල ක්‍රීඩා කමිටුවේ ලේකම් ගේ ආරාධනයකට අනුව ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග, පදක්කම් සහ කුසලාන පිරිනැමීම යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී ගේ සුරතින් සිදුවිය.

# යුද්ධ හමුදා ටයිකොන්ඩෝ ක්‍රීඩකයින්ට නේපාලයේදී පදක්කම් රැසක්



3 වන මවුන්ට් එවරස්ට් ජාත්‍යන්තර විවෘත ටයිකොන්ඩෝ ශූරතාවලිය (*3rd Mount Everest International Open Taekwondo Championship*) නේපාලයේ පොකාරා නගරයේදී ඉකුත් සැප්තැම්බර් 22 වන දින සිට 25 වන දින දක්වා පැවැත්විණ. ඒ සඳහා සහභාගී වූ 10 දෙනකුගෙන් සමන්විත ශ්‍රී ලංකා ජාතික ටයිකොන්ඩෝ කණ්ඩායමට යුද්ධ හමුදා ක්‍රීඩකයන් 6 දෙනකුද ඇතුළත් විය. එහිදී, එම කණ්ඩායම තරගාවලියේ පදක්කම් 4 ක් හිමිකරගත් අතර, ඉන් පදක්කම් තුනකට හිමිකම් කියනු ලැබුවේ යුද්ධ හමුදා ක්‍රීඩකයින් වීම විශේෂත්වයකි.

## සිතුවම් රාත්‍රිය...

සඳ දිය මත රටා ඇඳී
නිසසල වැව් දිය දහරේ
දිලිසෙන සෙවනැලි සිතුවම්
අහ ඉමේ.. රෑ යාමේ..
දියකාවුන් බලා හිඳින
ගස් දෙවළක වියලුනු..

උකුසන්.. බකසුන්.. වවුලන්..
ඉගිලී කෑම සොයා යන
කිරි බැබලෙන හඳ පානේ
සිහිල් සුළං හමා
පරිසරයම හිරිගඬු පිපෙනා
මිහිතලයේ..

බබළි දිලෙනා තරු කැට
නිල් අහසේ
සිතුවම් දහසක් මැව් වැව් නිල් ජලයේ
සිහිලැල් පිනි ඉහිරී
රෑ යාමේ සඳ එළියේ
වැව් තාවුල්ලේ..

නි/70207
කපිතාන් (උපා) ඩීඩීඑස් චන්ද්‍රසිරි ගරේ
ආමාද්‍රකා නිල නිවස - කොළඹ 07

## මගේ අම්මේ...

උතුරු කොනේ අව් රස්නෙට ගත පිච්චෙනවා
දුරින් දැනෙන අම්මගෙ මතකය සනසනවා
කඳවුරු බිම සුළං කඳුළු දරා ගන්නවා
නිවාඩුවක් එනතුරු හිත ඇඟිලි ගනිනවා

එක හවසක පලාලි බිම පා තැබුව සැනින්
හිතේ මරට සුසුම් හෙළන නොදැනිම මුවගින්
දුව්ලි රතු පස අව්රැස් විඳගෙන සතුටින්
දින ගනින්නේ අම්මගෙ මුව බලන්න විගසින්

රාත්‍රියේ තනිකම හිත පාරනා තරම්
කියාගන්න කවි පද මිදී ගලනා සෙනෙහෙන්
සිහිවෙන නිදි නැති රැය අම්මගෙ රුව මනසින්
කියන්නෙ අම්මේ තුරුලට ගන්නකො විගසින්

සෙ/2128572
ආකාශ සේනාරත්න ආර්ආර්ඩබ්ලිව්
4 ශ්‍රීලයුවෙබ

## අවියකට පෙම්කළ නුඹ...

සුවෙන් පිරී සිරි යහනේ සැතපෙද්දී මුළු ලොවම
මොහොතකට දෙඇස් පියවෙතැයි
බියවුණා නුඹ හැඟීම්බර යොවනය
ආදරය ඇයැද්දී හිතක් පතුවක් නොමැති
අවියකට පෙම්කළා නුඹ

සෙ/415493
බනි 11 අමරසිංහ ඒජීඑන්කේ
5 ගැයෙබ - මිහිඳුසෙත් මැඳුර

## මගේ සඳ...

යාල්දේවි කෝච්චියෙන්
පුර පසළොස්වක සඳ බලන්න
අමාවකට පුර සඳ රැස්
අහස් තලයේ නහැවෙන්නට
තරු අතරින් ගලා බසින
ඒ සඳරැස් විඳගන්නට
යළි එනවා සත්තයි මම
සඳ සෙවනේ සැතපෙන්නට..

නි/70413
කපිතාන් ටීඩබ්ලිව්ඩීආර් ගෙපුනන්ති
4 ශ්‍රීලංසිරෙ

## අනාගතේ කොහෙද පුතේ...

හීන ගියත් ඉස්කෝලෙට අකුරු ලියන්න
පුංචි පොතක් කවදාවත් නැහැනෙ දකින්න
පාර දිගේ කුසගින්නට හේතු සොයන්න
එපා පුතේ දුව්ල්ලට දෑස හෙමන්න

කණාමැදිරි පහන් කණුව අඩවන් අඳුර
නිගා දෙනවා ජීවිතයේ අවමන් කඳුළ
හිනා උනත් මුව හසරැලි සුරතල් පෙනුම
අනාගතේ කොහෙද පුතේ මාවත කොණක

සෙ/321394
සැරයන් මදුසංක එච්එම්පීටී
8 ශ්‍රීලපාහ - අභිමංසල 3

## ගලපන්න කාලයක්...

තරු හිස් වසා මල් සෙවණෙ ඉන්න කාලයක්
තරු පත් පවා වියැලිලා බිම වැටෙන කාලයක්
පෙම් බැඳි හිත් ලඟින් හුරතලෙන් ඉන්නා කාලයක්
බිඳී හිත් කැබිලි අහුලන ගලපන්න කාලයක්

මුළු අහසකම දේදුනු හතක් පාන යාමයක්
දේදුනු පාට සායම් දියව මැකෙන කාලයක්
ලැබූ සතුටම දුකක් වේදනා ගෙනෙන කාලයක්
ඒ මතකම හිතේ අස දෙසින් හමන කාලයක්

සෙ/475701
ලා/කෝ බංඩාර එච්එස්එම්
8 ගරෙ - මිහිඳුසෙත් මැඳුර




## නොහඬන්න සෙබළාන...

නොහඬන්න සෙබළාන, නොතැවෙන්න සොයුරාන
දෙපා අහිමිව ගියේ රඟ මඩලේ රඟා නොව
මව්බිමේ සුවහසක් දහන් දිවි රැකදෙන්න
රණ විශේෂිඩ් එදා
අද ඔවුන් උදම් වී බොහි නිදහසේ ජය පැන්
ඒත් නුඹ නෙතින් වැටෙන
එක් කඳුළු බිංදුවක් වටී අපට හැමදාම
විලස පිරිත් පැන්

සෙ/480582
සැරයන් කරුණාරත්න පීජේපී
6 ගරෙ මිහිඳු සෙත් මැඳුර

## මං එනවා ලඟදීම...

තාලෙට හුරුවෙච්ච ජීවිතය
වැට කඩොළු මායිම් අළු හිරවෙච්ච හදවත
නිල ඇඳුම ගත දරා රළු ලෙසට උන්නාට
මේ හිතත් රිදෙනවා දරා ගන්නට නොහැකි තැන
රැයක් දවාලක් නැතුව ඒකාකාරී වූ ජීවිතය
අස්වැසිල්ලක් සොයනවා නිදියහන සීරුවට
අම්මා අප්පච්චි හදවතේ රඳවාගෙන
උන් හීන දකිනවා හෙට ලෝකෙ විඳින්නට
අප්පච්චි උණුහුමේ මොහොතකට දැවටෙන්න
අම්මාගේ ආදරය පිරුණු ඒ
ඇස් අසල නවතින්න දිනගනිනවා උන්
කාටත් නොකියාම අම්මේ
නිවාඩු ඇති ළඟදීම එන්නම් මං රහසේම
එනතුරු මං මඟ බලනවාද
අප්පච්චි එක්කම..

සෙ/655580
සාගස වත්සලා ඩබ්ලිව්එෆ්
රෙම ශ්‍රීලයුවෙබ

## මන් බලන් ඉන්නවා...

ලැබුනෙ නැති වුනාට ලඟ ඉන්න
දුර ඉඳන් හරි බලන් ඉන්න මට
උඹෙන් එහෙම් අවසරයක්වත් නැද්ද මට
අමතක කරාද මුළු හදවතින්ම මම
නිකමටවත් මතකෙට එන්නෙ නැද්ද
එක තත්පරේකටවත් මම
ඒත් මන් බලන් ඉන්නවා එදා වගේ අදත්..

සෙ/372941
සැරයන් චන්ද්‍රසේන එච්පීඑන්
16 ශ්‍රීලංසිරෙ - මිහිඳු සෙත් මැඳුර

## පුංචි සමනලී...

චූටි මැණිකෙ මගේ පුංචි සමනලී
ඉන්නෙ නුඹ හිනැහිලා
මගෙ මැණික බිච්චර ආඩම්බරෙන්
අප්පච්චි අද ගෙදර ආව නිසා
සුළැඟිල්ලේ දැවටෙමින් හෙමි හෙමින් අඩිතියන්
හුරතලේට වචන දෙක තුනක් එකතු කරල
කියද්දි චූටි දෙතොල් උල් කරලා
සත්තයි මට හරි ලෝභ හිතුණා..
අල්ලගෙන මගෙ අතින් ජීවිතේ පුරයන්න
රකින්නම් මැණික නුඹ මගේ ඇස් අස්සෙම තියන්
නිතර දෙවලේ ගෙදර නාවත්
මගේ උකුලේ තියන් සුරතල් නොකළත්
දන්නවද මැණික නුඹ
අප්පච්චිගෙ ආදරේ මහ මෙරක් උඩින්.
බිය සිනා රැල්ලෙන් එළිය වූ අප දිවියම
අපේ ලෝකේ මිණි පහණ චූටි දෝණි නුඹ
අම්මාගේ හුරතලී හුරතලම දඟමල්ල
රත්තරන් රකිමි නුඹ මගෙ ප්‍රාණ දෙවනි කොට
ලස්සනම අපේ රටේ නුඹ වැනිම දරුවන්ට
රැකගන්ම මගේ පැතුම
අවැසි නම් හුස්ම ටික වුවද කමක් නැත
දෙපාරක් නොසිතා අතහරිම් හෙට මං..

සෙ/2127534
කෝප්‍රල් නිශ්ශංක එන්ඩබ්ලිව්
රෙම ශ්‍රීලයුවෙබ

**වෘත්තීය දිවියේ නේකවිධ කඩඉම් පසුකොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ**
**ඔබ සියලු දෙනාට දිරිය, විරිය,රැකවරණය ලැබේවායි**
**"රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.**



යුද්ධ හමුදා කාන්තා බලකායේ කර්නල් සේනාවිධායක ලෙස

**මේජර් ජෙනරාල්**
**එම්කේ ජයවර්ධන**
**ආර්එස්පී යූඑස්පී එන්ඩියූ**

**2022 ඔක්තෝබර් මස 13 වන දින සිට**



51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එස්ඩබ්ලිව්එම් ප්‍රනාන්දු**
**ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී**

**2022 ඔක්තෝබර් මස 07 වන දින සිට**



යුද්ධ හමුදා ඉංජිනේරු සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**ඒඑච්එල්ජී අමරපාල**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී**
**පීඑස්සී**

**2022 ඔක්තෝබර් මස 12 වන දින සිට**



22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී එන්ඩියූ**

**2022 ඔක්තෝබර් මස 05 වන දින සිට**



12 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**පීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී**
**ආර්එස්පී යූඑස්පී එන්ඩීසී**

**2022 ඔක්තෝබර් මස 08 වන දින සිට**



59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**ආර්එම්වීඑම් රණසිංහ**
**ඩබ්ලිව්ඩබ්ලිව්වී**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී**


**2022 ඔක්තෝබර් මස 06 වන දින සිට**



24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරාල්**
**එස්ඩබ්ලිව්බී වෙලගෙදර**
**ආර්එස්පී යූඑස්පී**

**2022 ඔක්තෝබර් මස 03 වන දින සිට**



හමුදා මාධ්‍ය ප්‍රකාශක සහ ජනමාධ්‍ය අධ්‍යක්ෂ ලෙස

**බ්‍රිගේඩියර්**
**අයිඑච්එම්ආර්කේ**
**හේරත් යූඑස්පී පීඑස්සී**

**2022 ඔක්තෝබර් මස 06 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බ්‍රිගේඩියර් ප්‍රමාණි ලෙස

**බ්‍රිගේඩියර්**
**ජේඩබ්ලිව්එස්**
**පෙරේරා ආර්ඩබ්ලිව්පී**

**2022 ඔක්තෝබර් මස 18 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික ලෙස

**බ්‍රිගේඩියර්**
**කේවීඑන්පී ප්‍රේමරත්න**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2022 ඔක්තෝබර් මස 06 වන දින සිට**



සෞඛ්‍යය අධ්‍යාපන සම්පත් පර්යේෂණ සහ තොරතුරු කේන්ද්‍රයේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර්**
**ඩීකේ අළුදෙණිය ආර්ඩබ්ලිව්පී**

**2022 ඔක්තෝබර් මස 16 වන දින සිට**



213 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර්**
**එම්එල්ව් ද සිල්වා**
**ආර්එස්පී යූඑස්පී පීඑස්සී**

**2022 සැප්තැම්බර් මස 28 වන දින සිට**



රණවිරු සම්පත් කේන්ද්‍රයේ නියෝජ්‍ය සේනාවිධායක ලෙස

**කර්නල් එස්ආර්එම්එල්ටී සමරනායක යූඑස්පී**

**2022 මැයි මස 30 වන දින සිට**



යුද්ධ හමුදා මූලස්ථාන බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල් ඩීකේආර් පෙරේරා**

**2022 ඔක්තෝබර් මස 17 වන දින සිට**



1 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරී ලෙස

**මේජර් කේකේඑස්වී කුමාර ආර්එස්පී**

**2022 ඔක්තෝබර් මස 20 වන දින සිට**



10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරී ලෙස

**මේජර් අයිපීආර් ධම්මික**

**2022 ඔක්තෝබර් මස 19 වන දින සිට**




යුද්ධ හමුදා මූලස්ථාන බලසේනාවේ බලසේනා සැරයන් මේජර් ලෙස

**සෙ/105864**

**ඔනි I ඩබ්ලිව්පීඩීආර් වීරසිංහ ශ්‍රීලසසබ**

**2022 ඔක්තෝබර් මස 21 වන දින සිට**



ප්‍රාදේශීය ගණකාධිකාරී කාර්යාලය (පලාලි) ප්‍රධාන ලිපිකරු ලෙස

**සෙ/702055**

**ඔනි I එම්ඒආර්එන් සිරිනාග I ශ්‍රීලයුපොදුසේබ**

**2022 ඔක්තෝබර් මස 26 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) පාලන/ගකාස ශාඛාවේ ප්‍රධාන ලිපිකරු ලෙස

**සෙ/106234**

**ඔනි II රණසිංහ ආර්එස්වල් 3 ශ්‍රීලසසබ**

**2022 නොවැම්බර් මස 02 වන දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) පාලන ශාඛාවේ ප්‍රධාන ලිපිකරු ලෙස

**සෙ/367107**

**ඔනි II දිසානායක ඊඩීසීකේ යූඑස්පී 8 ශ්‍රීලංසිරෙ**

**2022 නොවැම්බර් මස 02 වන දින සිට**

# මන්නාරම දිස්ත්‍රික් රෝහලෙහි වාට්ටුවක් අලුත්වැඩියා කෙරේ





විවිධ අඩුපාඩු මත වසාදමා තිබූ මන්නාරම දිස්ත්‍රික් රෝහලෙහි 11 වන වාට්ටුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ගේ සම්බන්ධීකරණය යටතේ යුද්ධ හමුදා සෙබළුන්ගේ ශ්‍රම දායකත්වයෙන් පසුගිය සැප්තැම්බර් 29 වන දින අලුත්වැඩියා කෙරිණ. 54 වන පාබල සේනාංකයේ 12 වන සංවත්සරයට සමගාමීව එම පාබල සේනාංකාධිපති මේජර් ජෙනරාල් දර්ශණ විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ පූර්ණ අධීක්ෂණය යටතේ සංවිධානය කළ මෙම මාහැඟි කර්තව්‍යය සඳහා ආසන්න වශයෙන් රුපියල් 350000.00 ක පමණ මුදලක් වැයවූ අතර, ඒ සඳහා ප්‍රදේශයේ ව්‍යාපාරික පරිත්‍යාගශීලීන් විසින් මූල්‍ය දායකත්වය ලබාදෙන ලදී. එසේ නවීකරණය කරන ලද වාට්ටුව රෝහල් අධිකාරිය වෙත භාරදීමේ අවස්ථාවට 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, 543 වන පාබල බලසේනාධිපති, මන්නාරම දිස්ත්‍රික් රෝහලේ වෛද්‍යවරු සහ ප්‍රදේශයේ ව්‍යාපාරික පරිත්‍යාගශීලීන් පිරිසක් සහභාගී වූහ.

# වීරු දිරියෙන් නිසට සෙවණක්





ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) මගින් සිදුකරනු ලබන ප්‍රජා මූලික ව්‍යාපෘතීන් අතරින් තවත් එක් ව්‍යාපෘතියක් ලෙස කල්ලඩි, ඊවලන්පත්තු ප්‍රදේශයේ දැඩි ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ දිවි ගෙවන පවුල් දෙකක් සඳහා පසුගියදා නව නිවාස දෙකක් ඉදිකර දෙන ලදී.

222 වන බලසේනා බලප්‍රදේශයේ පිහිටි 24 වන විජයබාහු පාබල රෙජිමේන්තු භටපිරිස්හි ශ්‍රම දායකත්වය මත මෙම නව නිවාස ඉදිකරනු ලැබූ අතර *'Hayley's PLC Ltd'* ආයතනය විසින් ඊට මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී.

එලෙස ඉදිකළ එම නිවාස 22 වන පාබල සේනාංකයේ සේනාංකයේ මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සුරතින් ඉකුත් ඔක්තෝබර් 10 වන දින එම නිවාසලාභීන් වෙත පිරිනැමුණි.


# රණවිරුවා





**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
ජීවන මෙන්ඩිස් ආර්එස්පී යූඑස්පී අයිජීඑස්සී



**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
ආර්එම්ඩීඩීපීකේ රත්නායක



**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



**සහය සංස්කාරක**

කපිතාන්
එච්එල්ඩීයූ ලක්මිකා

---

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑච්එම් 11 ඉසේරෙ
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් 11 ඉසේරෙ

---

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

---

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

---

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445/51446

---

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට

---

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය



# ජංගම කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිසැලක් යුද්ධ හමුදා මූලස්ථානය අභියසදී





යුද්ධ හමුදා සාමාජිකයින් විසින් නිෂ්පාදනය කරනු ලබන එළවළු සහ කිරි නිෂ්පාදනයන් හමුදා සාමාජිකයන් වෙත සහන මිලට අලෙවි කිරීමේ ජංගම කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි සැලක් පසුගිය ඔක්තෝබර් 11 වන දින පස්වරුවේ විවෘත කෙරිණ. සියලුම යුද්ධ හමුදා සාමාජිකයින් මුහුණපාන ආර්ථික දුෂ්කරතා පිළිබඳ සලකා බලා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය සමග ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය එක්ව මෙම මාහැඟි කටයුත්ත අරඹන ලදී.

73 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව බත්තරමුල්ල, පැලවත්ත යුද්ධ හමුදා මූලස්ථානයේ රථගාල අසල විවෘත කරනු ලැබූ මෙම ජංගම කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිසැල සෑම අඟහරුවාදා සහ සිකුරාදා දිනකම පස්වරු 3.00 සිට 6.00 දක්වා විවෘතව තැබේ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී යූඑස්පී ගේ ආරාධනයකට අනුව මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ මෙම ජංගම කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි සැලෙහි ව්‍යාපාරික කටයුතුවල ආරම්භය සනිටුහන් කරමින් සංකේතාත්මකව එළවළු සහ අනෙකුත් නිෂ්පාදන කිහිපයක් මිලදී ගනු ලැබීය.

මෙම සමාරම්භක අවස්ථාව සඳහා යුද්ධ හමුදා ප්‍රධාන මාණ්ඩලික නිලධාරී මේජර් ජෙනරාල් ටීජේ කොඩිතුවක්කු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ, කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඒකේ රාජපක්ෂ ආර්එස්පී ඇතුළු තවත් නිලධාරීන් සහ සෙසු නිලයන් පිරිසක් ද එක්වූහ.



රණබිමේ මතක

# යුද බිමේ “පස් බැම්”

යුද බිමේ "පස් බැම්මක්" කියන්නෙ බාධකයක්. එහි සැඟවුණු අවධානම මෙතෙකැයි කියන්න බැහැ. ඒ වගේමයි තවත් අතකින් බැලුවොත් "පස් බැම්මක්" කියන්නෙ ජීවිත රැකදෙන ශක්තිමත් ආවරණයක්. ඒ කොහොම වුනත් මේ පස් බැම් අස්සෙ ඒවයේ තියෙන වැලිකැට තරම් කතන්දර සැඟවිලා තියෙනව. ඒ හැම කතාවකම තියෙන්නෙ වීරත්වයක්. ඒත් අමතක කරන්න එපා. ඒ වීරත්වයට යටින් මේ පස් බැම් තරණය කරපු රණවිරුවන්ගේ අතපය අහිමි වුණු, ලේ ගංඟා හැලුනු ශෝචනීය කතන්දරත් එමටයි. ඒත් ඒ සියල්ල දරාගෙන අපේ රණවිරුවො අනිත් අයට නිදහසේ පය ගහන්න බිමක් ඉතිරි කරල දුන්න.



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර.